නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT

NIBM
POWERING GREAT MINDS



2021

සිංහල

**ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය**
தேசிய வியாபார முகாமை நிறுவனம்
**NATIONAL INSTITUTE OF BUSINESS MANAGEMENT**




# ගෝලීය ජීවිතයේ නිරමාණකරු

# 2021



ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය 2021 වසරේ පැවති සියලු අභියෝග සාර්ථකව ජයග්‍රහණය කරන ලද වසරකි. වෙනස්වීම් සහ නවෝත්පාදනයන් තුළින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ක්‍රියාකාරකම් නිරන්තරයෙන්ම මෙහෙයවීම සිදුකරයි. අපගේ මාර්ගගත වේදිකාව (Online Platform - www.nibmworldwide) සමඟ වසංගතය ඇති වීමට පෙර සිටම අපි හොඳින් සූදානම්ව සිටි නිසා, 2021 වර්ෂයේ වර්ධන අපේක්ෂාවන් තුළ කැපී පෙනෙන ලෙස අධ්‍යයන ක්‍රියාවලිය අඛණ්ඩව සිදුකල වසරකි. ඒ අනුව නව ඉගෙනුම් පහසුකම් ඇති කිරීම තුලින් ජාතියට සේවය කිරීම අප විසින් අඛණ්ඩව සිදු කර ඇත.

NIBM ස්වයං මූල්‍ය ආයතනයක් වශයෙන් ගත හැකි නිර්භීතම තීරණ කිහිපයක් ගෙන සාර්ථකව ඉදිරියට ගමන් කරන බව ඔප්පුකර ඇත. ගෝලීය වශයෙන් හොඳම හවුල්කරුවන් කිහිප දෙනෙකු සමග සම්බන්ධවී ජාත්‍යන්තර උසස් අධ්‍යාපනය හඳුන්වා දීමත්, ලබන වසරේ OBL හඳුන්වාදීම සඳහා ශක්තිමත් පදනමක් දැමීමත් සමඟ දේශීය හා ගෝලීය උසස් අධ්‍යාපනය තුළ අපගේ මුද්‍රාව තබා ඇත. අධ්‍යාපනය සඳහා වර්තමානයේ කරන ආයෝජනයක් ලෙස ඉදිරි වසර වලදී මෙය හොඳින් ක්‍රියාත්මක වනු ඇත. ඒ අනුව අපි හොඳම දේ තෝරාගෙන එතුලින් විශාල වටිනාකමක් එකතු කරගත්තෙමු.

# පටුන


පාලක සභාව 6
හැඳින්වීම 7
වසර 2021 සංක්ෂිප්තව 10

**මානව සම්පත් කළමනාකරණය 11**
සේවක පැතිකඩ 13
මානව සම්පත් සංවර්ධනය 13
මානව සම්පත් පුහුණු කිරීම 17
සෞඛ්‍ය රක්ෂණය 19
අවධානම් කළමනාකරන වාර්තාව 19

**පුස්තකාලය සහ විද්‍යුත් ඉගෙනුම් මධ්‍යස්ථානය 22**

**ශිෂ්‍ය ක්‍රියාකාරකම් සහ සම්බන්ධතා 32**

**අංශවල කාර්යසාධනය 41**
ව්‍යාපාරික පාසල (SOB) 42
පරිගණක සහ ඉංජිනේරු පාසල (SOC) 46
නිර්මාණකරනය භාෂා සහ මානවශාස්ත්‍ර පාසල 48

**ප්‍රාදේශීය මධ්‍යස්ථාන 53**
කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය 54
මහනුවර ප්‍රාදේශිය මධ්‍යස්ථානය සහ KIC 57
ගාල්ල ප්‍රාදේශිය මධ්‍යස්ථානය 61
මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානය 63

විභාග ඒකකය 66
වෘත්තීය මාර්ගෝපදේශන සහ කාර්මික පුහුණු ඒකකය 67
වෛද්‍ය මධ්‍යස්ථානය / ආපනශාලාව 68

**NSBM හරිත විශ්වවිද්‍යාලය 69**

**මූල්‍ය ප්‍රකාශන 78**

**විගණන වාර්තාව 115**

# සභාපතිතුමාගේ පණිවිඩය

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM) දැඩි තරඟකාරීත්වයක් පවතින ක්ෂේත්‍රයක ක්‍රියාත්මක වන අතර බොහෝ තරඟකරුවන්ගේ ප්‍රවේශය සහ ඔවුන්ගේ කෙටිකාලීන පිටවීම දැකගත හැකි තත්වයක් පවතී. එදිනෙදා කටයුතුවලදී පවා උසස් සහ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළින්ම සිටීම සඳහා විශාල උත්සාහයක්, සැලසුම් කිරීමක්, ඉදිරි චින්තනයක් සහ සියල්ලටම වඩා බොහෝ ප්‍රවේශම් සහගත ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ. අනපේක්ෂිත කාලයකදී පවා එහි ජවය සහ උද්යෝගය පවත්වා ගැනීමට දශක ගණනාවක ඉතිහාසයේ ලබා ඇති අත්දැකීම් සහ දැනුම NIBM ආයතනයට ශක්තිය ලබා දී ඇත. 2021 වසරේ සියලුම ව්‍යාපාර සහ ස්වයං මූල්‍ය ආයතන වසංගතයෙන් පීඩනයට පත්ව අර්බුදකාරී කාලයකට මුහුණ දෙමින් සිටියේය. එහෙත් NIBM ආයතනය සඳහා එයට ප්‍රතිවිරුද්ධ තත්වයක් දැකගත හැකිවිය. සමාලෝචිත වර්ෂය තුළ NIBM  ආයතනයට මූල්‍යමය වශයෙන් සිය වර්ධනය පවත්වා ගැනීමට හැකි වූවා පමණක් නොව, ක්ෂේත්‍රයේ අනෙකුත් ප්‍රධාන තරගකරුවන්ගේ විස්මයට හා ප්‍රබෝධයට ලක් කිරීමට සහ ඉහළ මට්ටම් කරා ළඟා වීමට හැකි  වූ බව ප්‍රකාශ කිරීම සතුටට කරුණකි.
පුද්ගලිකව උසස් තීරණ ගැනීමේ
මණ්ඩලයේ - NIBM පාලක මණ්ඩලයේ සභාපති වීම ගෞරවයක් සහ වරප්‍රසාදයක් විය. 2021 දැඩි අභියෝග වලට මුහුණ දුන් වසරක් ලෙස ආයතනය සාර්ථක කර ගැනීමට පාලක මණ්ඩලයේ සාමාජිකයින් විසින් ලබා දුන් මග පෙන්වීම සහ සහයෝගය බෙහෙවින් ඉවහල් විය. ශක්තියට ශක්තිය වෙමින් NIBM ආයතනය ඉදිරියට ගෙන යාමට තීරණ ගැනීමේදී ස්ථිර ලෙස සහ ඉදිරියෙන් සිතමින් කටයුතු කළ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය මහතාගේ සේවය අගය කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි. එසේම ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ වර්ධන වේගය පවත්වා ගැනීමට සෑම විටම සහාය වීම පිළිබඳව අධ්‍යක්ෂවරු තිදෙනාට, ඉහළ කළමනාකාරිත්වය සහ සියලුම කාර්ය මණ්ඩලීය සාමාජිකයින්ට ස්තූති කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

අධ්‍යාපනය යනු වර්තමානයේ කරන ආයෝජන අනාගතයේදී හොඳින් ලබාගත හැකි ක්ෂේත්‍රයකි. එබැවින් 2021 දී අප ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ සහ ගනු ලබන සංවර්ධන මුලපිරීම් ඉදිරි වසරවලදී වඩාත් ඵලදායි වනු ඇත. අප ජාතියේ විශිෂ්ට මනසක් බලගැන්වීම් තුළින් (Powering great minds) ක්ෂේත්‍රයෙහි පුරෝගාමියා වීමේ අභිමානයෙන් යුතුව සනිටුහන් කරමින් අපගේ ගමන ඉදිරියට ගෙන යනු ලැබේ.



**වී.කේ. චොක්සි (ජනාධිපති නීතිඥ)**
**සභාපති**

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

2021 වසර වෙන කවරදාකටත් වඩා වෙනස් වසරක් විය. එම වසරේ ඇති වූ අභියෝග සහ වසර තුළ අපට මුහුණ දුන් බාධක ඉතා ප්‍රභල විය. එහෙත්, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දශක ගනනාවක දීර්ඝ අත්දැකීම් ඇති NIBM, ජවයෙන් සහ ස්ථිර අධිෂ්ඨානයෙන් ඒ සියල්ල අභිබවා යාමට සමත් විය. NIBM ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලයේ සහය ඇතිව දශක ගණනාවක් තිස්සේ පවත්වාගෙන ගිය සිය වර්ධන චක්‍රය අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකිවිය. එහිදී ගත් සමහර උපායමාර්ගික තීරණ ඉතිහාසයේ ගත් නිර්භීතම තීරණ විය. වසංගතය ව්‍යාප්ත වීම හේතුවවෙන් ආයතනය ගනු ලැබුවේ භෞතිකව මෙන්ම ප්‍රායෝගිකව ද ආයතනය ප්‍රසාරණය කිරීමය. මධ්‍යම සහ අනෙකුත් පළාත්වල සිසුන්ට සහ වෘත්තිකයන්ට ගෝලීය ශ්‍රේණිගත උසස් අධ්‍යාපනයක් ලබා දෙමින් ජාතියට වඩා හොඳ සේවයක් කිරීම සඳහා මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථානය (KIC) පිහිටුවීමට NIBM තීරණය කළේ වසංගතයේ උච්චතම අවස්ථාවේදීය. ලාභය අරමුණු කරගත් සහ ලාභ නොලබන අනෙකුත් ආයතන වසංගතයේ දරුණු බලපෑම් අවම කිරීම සඳහා ප්‍රවේශම් වන විට, NIBM ආයතනය මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථානය පිහිටුවීමෙන් උඩුගම්බලා පිහිනීමට තීරණය කළේය.  එම කර්තව්‍යයේදී පාලක සභාව ලබාදුන් ශක්තිය සහ මගපෙන්වීම අතිමහත්ය. අර්බුධකාරී අවස්ථාවක නිර්භීත තීරණ ගැනීමේ කතාව KIC පිහිටුවීම සමඟින් නතර නොවේ. ව්‍යාපාරික පාසල (SOB) නව ස්ථානයකට ගෙන යාමට අපි තීරණය කළේ එම පීඨය සිදුකරන ව්‍යාපාරය නංවාලීම සඳහා එයට වෙනම අනන්‍යතාවයක් ලබා දීම සඳහා ය. මෙම නවීන මණ්ඩපය ඉගෙනුම් අත්දැකීම් වැඩි කිරීම සඳහා ගෝලීය මට්ටමේ පහසුකම් වලින් සමන්විත වේ.

2021 වසර NIBM ආයතනය තවදුරටත්  ජාත්‍යන්තරව ව්‍යාප්ත කිරීමට හැකිවීම ආයතනයේ විශාල ජයග්‍රහණයක් විය. ඕස්ට්‍රලියාවේ ග්‍රිෆිත් විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්ව විද්‍යාලය වැනි විශ්වවිද්‍යාල සමඟ NIBM අත්සන් කළ හවුල් ගිවිසුම් හරහා සහ අත්සන් කිරීමට නියමිත ඇතැම් ප්‍රමුඛ පෙළේ විශ්ව විද්‍යාල සඟ තවත් හවුල්කාරිත්වයන් සමඟින්, NIBM "විවිධත්වයෙන් යුත් අධ්‍යාපනය" හඳුන්වාදීම තුළින් ගමන් මගේ නව පරිච්ඡේදයක් ආරම්භ කර ඇත.

2022 වර්ෂයේ සිට ආරම්භ කිරීමට නියමිත "ප්‍රතිඵල පදනම් කරගත් ඉගෙනීම" (OBL) ක්‍රියාවට නැංවීම සඳහා මූලික වැඩ කටයුතු 2021 වසරදී සිදු කරන ලදී. ඉදිරියේදී හඳුන්වාදීමට නියමිත වෙනස්කම් සඳහා අපි කලින් සැලසුම් කරන OBL ක්‍රමවේදයට නිසැකවම ශ්‍රී ලංකාවේ උසස් සහ වෘත්තීය ක්ෂේත්‍රයේ ඉදිරි ගමනක් හිමි වනු ඇත.

වසරේ සියලුම ජයග්‍රහණ සමඟින් NIBM හි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ කාර්ය මණ්ඩලය සුභසාධනය අඛණ්ඩව සිදු කළ අතර, ප්‍රීතිමත් කාර්ය මණ්ඩලයක් සැමවිටම ව්‍යාපාරයකට ආශිර්වාදයක් වන බව අපි තරයේ විශ්වාස කරමු. රිචඩ් බ්‍රැන්සන් වරක් පැවසූ පරිදි; "මම මගේ කාර්ය මණ්ඩලය හොඳින් බලාගන්නවා, ඔවුන් අපේ ගනුදෙනුකරුවන් සහ ව්‍යාපාරය ගැන බලා ගනීවි". අපගේ සියලු කාර්යයන් සාර්ථක කර ගැනීමට කාර්ය මණ්ඩල සුබසාධනය පිළිබඳව අපි තරයේ විශ්වාස කරමු. වසංගත සමයක වුවද කාර්ය මණ්ඩලයට සියලු ප්‍රතිලාභ නිසි පරිදි ගෙවා ඇති අතර ඔවුන්ගේ විශිෂ්ට දායකත්වය වෙනුවෙන් මම ඔවුන් සියලු දෙනාටම ස්තූතිවන්ත වෙමි.

ජාතියේ ප්‍රමුඛතම ව්‍යාපාරික පාසලේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කිරීමට ලැබීම භාග්‍යයක් ලෙස සලකන අතර 2021 වර්ෂයේ දී ලබා දුන් මගපෙන්වීම සහ ශක්තිය වෙනුවෙන් ආයතනයේ සභාපතිවරයාට සහ පාලක සභාවට ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. 2021 වසර තුළ NIBM හි සියලුම කාර්ය මණ්ඩලයට, ඔවුන් විසින් ලබාදුන් නොසැලෙන සහයෝගය සඳහා මගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමි. 2022 වර්ෂයේ සහ ඉදිරි වසරවල උපරිම කැපවීමකින් සහ ආශාවකින් ජාතියට සේවය කිරීමට අපි බලාපොරොත්තු වෙමු.



**ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය**
**අධ්‍යක්ෂ ජනරාල්**

# පාලක සභාව

## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය

### 01

**වී. කේ. චොක්සි මහතා**
(ජනාධිපති නීතිඥ)
සභාපති,
ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය
නො-120/5, විජේරාම මාවත,
කොළඹ - 07.

### 02

**ආචාර්ය ඩී. එම්. ඒ. කුලසූරිය මහතා**
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය
නො-120/5, විජේරාම මාවත,
කොළඹ - 07.

### 03

**ඩබ්. එම්. ආර්. බී. වීරසේකර මහතා**
අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය, නිපුණතා පියස,
ඇල්විටිගල මාවත,
කොළඹ 05

### 04

**නන්දික බුද්ධිපාල මහතා**
සභාපති,
ජාතික වාණිජ මණ්ඩලය,
අංක 450, ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

### 05

**ඩී. එච්. එස්. පුල්ලේපෙරුම මහත්මිය**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය,
කොළඹ 01

### 06

**ජී .වී. පී. ගණක අමරසිංහ මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ,
රයිගම් සමාගම් සමූහය,
රයිගම් අලෙවි සේවා (පුද්ගලික) සමාගම,
එෆ් 28, පලමු මහල, ලකී ප්ලාසා,
කොළඹ 03.

### 07

**මහාචාර්ය ජේ. භාරත දොඩන්කොටුව මහතා**
සහායක මහාචාර්ය/ අධ්‍යයන සංවර්ධන සහ තත්ත්ව සහතික ප්‍රධානී
එන්.එස්.බී.එම් හරිත සරසවිය,
මහවත්ත, පිටිපන
හෝමාගම

### 08

**ඉංජිනේරු. මහින්ද බී. හේරත් මහතා**
ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය,
160/24, කිරිමණ්ඩල මාවත,
කොළඹ 05

### 09

**ඩී. කුමාරතුංග මහතා**
අධ්‍යක්ෂ (ගෙවීම් සහ පියවීම්)
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 01

### 10

**ආචාර්ය ඩබ්ලිව්. පී. එස්. කැලුම් මහතා**
අධ්‍යක්ෂ,
පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය,
අංක 28, ලෙස්ලි රණගල මාවත,
කොළඹ 08.

### 11

**අජිත් ඩී. පෙරේරා මහතා**
ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය,
ෆෙඩරේෂන් හවුස්,
අංක 17/1,
පළමු පටුමග ගෝතමී පාර, කොළඹ 08.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ව්‍යාපාරික අධ්‍යාපන ආයතනය වන්නේ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය වේ. ගෝලීය ප්‍රවණතා සමඟ ඉදිරියට යමින් කාලීන අවශ්‍යතාවන්ට ගැලපෙන ආකාරයට නිරන්තරයෙන්ම අපගේ සේවාවන් උසස් කර ගන්නෙමු. පසුගිය කාලය පුරා කළමනාකරණය, පුහුණුකිරීම් සහ අධ්‍යාපනය සම්බන්ධ ප්‍රමුඛ ආයතනය බවට පත් වෙමින් අපගේම අනන්‍යතාවයක් ගොඩනගා ගෙන ඇති අතර අප ආයතනය පුද්ගලයින් සහ ආයතන දසදහස් ගණනකට වඩා යහපත් අනාගතයක් ගොඩනගා ගැනීමට උපකාර වී ඇත.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහයෝගය ඇතිව අන්තර්ජාතික කම්කරු සංවිධානයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනයක් ලෙස ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය, 1968 දී කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද අතර දැනට වසර 53 ක් පුරා මෙමගින් උසස් අධ්‍යාපන සේවාවන් සපයා ඇත. පසුව එය පාර්ලිමේන්තු පනතක් මඟින් (එනම් 1976 අංක 23 දරණ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනත) ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ලෙස සංස්ථාපිත කරන ලදි. 1991 අංක 28 දරන පනත මඟින් මෙම පනතට යම් යම් සංශෝධන ගෙන එන ලදී.

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපන ආයතනයක් ද වේ. ආයතනය ස්ව ශක්තියෙන් සියළුම කටයුතු මෙහෙයවෙන අතර ජාත්‍යන්තරව පිළිගත් උපාධි පිරිනමන ආයතනයකි. එමෙන්ම ජාතික තත්ත්ව සම්මාන ප්‍රදානයේ දී ගෞරව සම්මානයෙන් පිදුම් ලද අතර ISO 9001-2008 ප්‍රමිති සහතිකය ද ආයතනයට පිරිනමා ඇත.





## දැක්ම

"ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම
ව්‍යාපාරික අධ්‍යාපන ආයතනය බවට පත්වීම."

## මෙහෙවර

"අපි පුහුණුව, අධ්‍යාපනය සහ උපදේශනය මඟින්
ජනතාවගේත්, සංවිධානවලත් නිපුණතා සංවර්ධනය කිරීමේ
කාර්යයෙහි නිරතව සිටින්නෙමු."

# අරමුණු

- වෘත්තීය දැනුම හා සුදුසුකම් අපේක්ෂා කරන පුද්ගලයන්ට අදාළ විෂයයන් පිළිබඳ උසස් මට්ටමේ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනයක් හා උපදෙස් ලබාදීම.
- මනාව ව්‍යුහගත කළ පුහුණු වැඩසටහන් මඟින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවිධානවල කළමනාකරුවන් හා අධීක්ෂණ නිලධාරීන්ගේ නිපුණතා වර්ධනය කිරීම.
- කළමනාකාරීත්වයට නිර්මාණාත්මක හා ඵලදායී අයුරින් සහභාගී වීම සඳහා සේවකයන්ට පුහුණුව හා අධ්‍යාපනය ලබාදීම.
- අධ්‍යාපනය හා පුහුණු වැඩසටහන් මඟින් සංවිධානවල ඵලදායිතාවය වර්ධනය කිරීමට පහසුකම් සැලසීම.
- රාජ්‍ය, පොදු හා පෞද්ගලික අංශයේ සංවිධානවල කාර්යසාධන ප්‍රමිති ස්ථාපනය හා සංවිධානවල සංවර්ධනය සඳහා මානව සම්පත්වල දායකත්වය ප්‍රශස්ත මට්ටමට පත් කිරීමට කළමනාකරණ උපදේශනය හා වෙනත් උපදේශන සේවා ලබාදීම.

# පරමාර්ථ

ආයතනයේ අපේක්ෂිත ව්‍යවස්ථාපිත පරමාර්ථ පහත පරිදි වේ.

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්මික හා වාණිජ ආයතනවල කළමනාකරුවන් හා අධීක්ෂණ නිලධාරීන්ගේ සේවය දියුණු කිරීම.
- කළමනාකාරීත්වය සමඟ නිර්මාණාත්මක ලෙස සහභාගී වීමට සේවකයන් පුහුණු කිරීම සහ අධ්‍යාපනයක් ලබා දීම.
- කළමනාකරණ විශේෂඥ සේවාවන් ලබාදීම, කාර්යසාධන ප්‍රමිති ස්ථාපනය කිරීම හා ඵලදායිතාව ඉහළ නැංවීම.
- කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස මානව දායකත්වය ප්‍රශස්ත මට්ටමට නැංවීම සඳහා වෙනත් ක්‍රියාකාරකම් ඉටු කිරීම.
- පරිසරය වඩා හොඳින් අගය කිරීම සඳහා අදාළ සමාජ ආර්ථික සංසිද්ධීන් සහ කළමනාකරණ අංශ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ දත්ත එකතු කිරීම.
- බාහිර සංවිධාන සඳහා කළමනාකරණ තොරතුරු සේවා ලබාදීම හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙහි සේවක පිරිස් පුහුණු කිරීම.
- සංස්ථාපිත අංශයට තම පද්ධති, පරිපාටි හා කාර්ය ක්‍රම දියුණු කිරීම, සැලසුම්කරණ කාර්යයන්ට සහාය වීම හා සාමාන්‍යයෙන් වෙනස් වන පාරිසරික සාධකයන් නිසා මුහුණපෑමට සිදුවන අභියෝගවලට මුහුණ දීම සඳහා උපදේශක සේවා සම්පාදනය.
- අධ්‍යාපනය හා පුහුණු වැඩසටහන් මඟින් සංවිධානවල ඵලදායිතාව දියුණු කිරීමට පහසුකම් සැලසීම.

# අපගේ සේවා සැපයීම

## අපගේ සේවාලාභීන් සඳහා

**පුද්ගලයින්**

රැකියාභිමුක, පිළිගැනීමට පාත්‍ර වන සුදුසුකම් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන අතරම ඔවුන්ගේ නිපුණතා වර්ධනය කිරීම.

**සංවිධාන**

සංවිධානවල කාර්යසාධන ශක්‍යතා වර්ධනය සඳහා හැකියාවන් ශක්තිමත් කිරීම.

## අපගේ කාර්යමණ්ඩලය සඳහා

වෘත්තීය නිදහස, කාර්යසාධනය පදනම් කරගත් ප්‍රදාන, මිත්‍රශීලී වැඩ පරිසරය හා ආයතනය සමඟ ඉගෙනීමට හා වර්ධනයට අවස්ථා සැපයීම.

## අපගේ බාහිර උපදේශකයින් සඳහා

පිළිගැනීම සාමාන්‍ය මට්ටමට වැඩි ප්‍රදාන හා ජාලගත වීමට අවස්ථා ලබාදීම.

## අපගේ හවුල්කරුවන් සඳහා

ගෝලීය මට්ටමේ පහසුකම් හා විශේෂඥ දැනුම ලබාදීම..

## අපගේ සමාජයට

දැනුම බෙදාහැරීම හා ඵලදායිතා වර්ධනය



# වසර 2021 සංක්ෂිප්තව

ආර්ථිකයේ අනෙකුත් සියලුම අංශ ප්‍රවේශම් සහගතව තීරණ ගනිමින් සිටි කාලයකදී වසංගතයෙන් පසු ආර්ථිකය මුහුණ දුන් අභියෝගවලට ප්‍රති පියවරක් ලෙස, NIBM ආයතනය උඩුගම්බලා පිහිනීමට තීරණය කළේය. ඒ අනුව ගත් තීරණ සහ සිදු කරන ලද ක්‍රියාමාර්ග එහි සමස්ත ඉතිහාසයේ අප ගත් හොඳම තීරණ වේ.

2021 වසර සළකා බැලීමේදී, කිහිප ආකාරයකින් වැදගත් වේ. පළමුව, වසර තුළ ගෙන ආ අභියෝග දශක පහකට අධික ඉතිහාසය තුළ ආයතනය කිසිදා අත්විඳ නැති ඒවා වේ. දෙවනුව, ආයතනය දශක ගණනාවක් තිස්සේ පවත්වාගෙන ගිය වර්ධන වේගය ඉදිරියට ගෙන යාමට සියලු අභියෝග සහ බාධක සමගින් සමත් වූහ.

රජය සතු ව්‍යවසායයක් ලෙස, ආයතනය විසින් පිළියෙල කරන ලද ව්‍යාපාරික ආකෘතියට අනුව සහ කලින් ගත් දුරදර්ශී ප්‍රතිපත්තිමය තීරණ ආයතනයට සහ එහි කළමනාකාරිත්වයට පෙර කිසිදා නොදුටු අභියෝග මෙහෙයවීමට උපකාරී විය. වසංගතය විසින් ඇති කරන ලද ආර්ථික අරගලයෙන් රට බැට කෑ විට ආර්ථිකයේ සෑම අංශයකටම දැඩි බලපෑමක් එතුළින් එල්ල විය. උසස් හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුරෝගාමියා ලෙස අප ආයතනය ජාතියට කළ දායකත්වය ආඩම්බර විය යුතු කරුණකි.

මූල්‍ය ස්ථාවරත්වය සහ අතීතයේ ගත් හොඳම තීරණ හේතුවෙන් දුෂ්කරතා මඟහරවා ගැනීමට පමණක් නොව බාධාවකින් තොරව මෙහෙයුම් කාර්යන් සිදුකිරීම සහතික කිරීම සඳහා අධ්‍යයන සහ කළමනාකරණ ක්‍රියාවලීන් දෙකෙහිම විප්ලවීය වෙනසක් කිරීමට NIBM සමත් විය. වසංගතය විසින් එල්ල කරන ලද දැවැන්ත අභියෝග සමගින් ආයතනයට තමන් විසින් නියම කරන ලද සියලුම ඉලක්ක පමණක් නොව බොහෝ ඉලක්ක සපුරා ගැනීමට හැකි විය. ඒවා අතර,

- කොවිඩ් සහන පැකේජ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දීම
- NIBM ශිෂ්‍යයින්ට ආයතනික සමාජ වගකීමක් ලෙස ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යාමට නොමිලේ දත්ත පැකේජ ලබා දීමට හැකිවීම.
- විවිධ උපාධි පාඨමාලා හදාරන සිසුන් සඳහා සමාජ සත්කාර ව්‍යාපෘති අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකිවීම.

**වර්ෂය තුළ ගනු ලැබූ ප්‍රධාන උපායමාර්ගික තීරණ කිහිපයක් වනුයේ;**

- ප්‍රතිඵල පදනම් කරගත් ඉගෙනුම් (OBL) නමින් සම්පූර්ණයෙන්ම නව ඇගයීම් ක්‍රමයක් හඳුන්වාදීම. 2022 සිට මෙම ඇගයීම් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යයන සහ විධායක කාර්ය මණ්ඩලය පුහුණු කරන ලදී. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙම ඇගයීම් ක්‍රමය පෙරළියක් වනු ඇතැයි අපේක්ෂා කරයි.
- මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථානයේ නව දිගුව විවෘත කිරීම. මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථානය මධ්‍යම සහ ඒ ආශ්‍රිත පළාත්වල සිසුන්ට සහ වෘත්තිකයන්ට නිර්මාණකරණය, කළමනාකරණය, තොරතුරු තාක්ෂණ, සහ දත්ත විද්‍යාව සඳහා කෙටිකාලීන හා දිගුකාලීන සහතික පත්‍ර සිට උපාධි මට්ටමේ වැඩසටහන් දක්වා පාඨමාලා රැසක් පිරිනැමීමට නියමිතය. KIC හි,

  I. නවීනතම ශ්‍රවණාගාරය
  II. සිසුන් 555ක් සඳහා ආසන පහසුකම් සහිත නවීන දේශන ශාලා 08ක්
  III. සම්පූර්ණයෙන්ම මාර්ගගත පුස්තකාලය
  IV. සැලසුම්ගත විද්‍යාගාරය
  V. පරිගණක විද්‍යාගාරය
  VI. ශිෂ්‍යයින්ට විවේකව ගත කිරීම සඳහා ප්‍රදේශයක් සහ ආපන ශාලාවක්

- NIBM ප්‍රධාන කාර්යාලය ආසන්නයේ පිහිටා ඇති ව්‍යාපාරික පාසල (SOB) සඳහා මහල් හතකින් සමන්විත ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගෙන ඇති අතර එය සිසුන්ට "ගෝලීය ප්‍රමිතියෙන් යුත්" උසස් අධ්‍යාපනයට පහසුකම් සැලසීම සඳහා නවීන තාක්ෂණයෙන් යුතු මධ්‍යස්ථානයකි. සිසුන්ට ප්‍රතිලාභදායක අත්දැකීමක් සහතික කිරීම සඳහා SOB හි පහත සඳහන් පහසුකම් වලින් සමන්විත වේ.

  I. අති නවීන ශ්‍රවණාගාරයක්
  II. සිසුන් 750ක් සඳහා නවීන ආසන පහසුකම් සහිත දේශන ශාලා 17 ක්
  III. සම්පූර්ණයෙන්ම මාර්ගගත පුස්තකාලය
  IV. නිර්මාණ විද්‍යාගාරය
  V. පරිගණක විද්‍යාගාර
  VI. ශිෂ්‍ය විවේක ප්‍රදේශයක් සහ ආපන ශාලාවක්

- සහතිකපත්‍ර පාඨමාලාවේ සිට පශ්චාත් උපාධි මට්ටම දක්වා විවිධ විෂය ක්ෂේත්‍රවලින් යුතු නව උපාධි පාඨමාලා කිහිපයක් හඳුන්වා දීම.
- 2021 දී NIBM ආයතනය ලොව ශ්‍රේණිගත කර ඇති ඇතැම් විශ්වවිද්‍යාල සමග අත්වැල් බැඳ ගැනීමට සමත් වීම.

# මානව සම්පත් කළමනාකරණය

ආයතනයේ අරමුණු ළඟා කර ගැනීමටත් ශිෂ්‍යයන්ට හා කාර්ය මණ්ඩලයට ප්‍රතිදාන ලබාදීමටත් ආයතනයේ කාර්ය මණ්ඩලය මනා ලෙස කළමනාකරණය කිරීම ඉතා වැදගත් බව ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හඳුනාගෙන ඇත. අපගේ සේවක පිරිස ආයතනික වගකීම් ඉටුකිරීමේලා පූර්ණ වශයෙන් නියැලී සිටින බව තහවුරු කිරීම සඳහා පහත සඳහන් සංඝටක ඇතුලත්කර ආකෘතියක් ගොඩනගා ඇත.

- බඳවා ගැනීම, තෝරා ගැනීම හා අනුස්ථාපනය
- කාර්ය සාධන ඉලක්ක (කෙටිකාලීන)
- පුහුණුව හා සංවර්ධනය
- වෘත්තිය අභිවර්ධනය
- උපාය මාර්ගික මෙහෙයුම (දීර්ඝකාලීන)
- කාර්යසාධන ඇගයීම
- ප්‍රතිලාභ කළමනාකරණය

මෙම සංරචක සේවකයින් විසින් ඉටු කරන කාර්යය කෙරෙහි සහ සංවිධානය කෙරෙහි ඉහළ සේවක කැපවීමක් ඇති කිරීම සඳහා එකිනෙකා සමඟ ඒකාබද්ධ වන ආකාරය පහත NIBM මානව සම්පත් කළමනාකරණ ආකෘතිය තුළින් නිරූපණය කෙරේ.




ආකෘතිය - මානව සම්පත් කළමනාකරණ ආකෘතිය

ආයතනය තුළ ප්‍රධාන සේවක කාණ්ඩායම් දෙකක් ඇත, එනම් දැනුම, නිපුණතා වර්ධනය හා උපදේශනය මගින් සෘජුවම අගයන් ඇති කිරීමේ ක්‍රියාවෙහි නියුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ආයතනය මනාව පවත්වාගෙන යාමට අවශ්‍ය සේවාවන් සපයන අනධ්‍යයන කාර්ය මණ්ඩලයයි. මෙම කාණ්ඩායම් සඳහා වන කාර්යසාධන ඇගයීම හා එහි ප්‍රතිලාභ ලබාදීමේ සැලැස්ම එකිනෙකට වෙනස් ය. කෙසේ වුව ද මෙම කාණ්ඩායම් දෙක සඳහා වන කාර්යසාධන ඇගයීම හා ප්‍රතිලාභ ලබාදීම ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ඉලක්ක හා අරමුණු ළඟා කරගැනීම හා සම්බන්ධ වේ.

ඉහත ආකෘතියෙහි දැක්වෙන පරිදි අප සේවකයන්ට සංවිධානයේ අවශ්‍යතා මත පදනම් කරගත් රැකියා විශ්ලේෂණය කිරීම තුළින් බිහිවූ රැකියා විස්තර හිමි වේ. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ දීර්ඝකාලීන හා මධ්‍යකාලීන සැලසුම්වල කොටසක් ලෙස දැක්ම, මෙහෙවර හා අරමුණු මගින් සේවකයන් උපායමාර්ගිකව මෙහෙයවනු ලැබේ. අරමුණුවලින් සැදුම්ලත් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමත් වාර්ෂික අයවැයෙහි ඉලක්ක ළඟා කරගැනීමත් එක් එක් සේවකයා සතු වගකීම වේ. සේවකයන්ගේ වගකීම් හා සම්බන්ධ කාර්යසාධනය මැන බැලීම කාර්යසාධන ඇගයීම් පත්‍රයක් මගින් වාර්ෂිකව සිදු කරනු ලබයි. උපදේශකවරු හා අධ්‍යක්ෂකවරු සම්බන්ධ කාර්යසාධන ඇගයීම් පත්‍රවල අන්තර්ගතය හා විශ්ලේෂණයෙහි ගැඹුර සෙසු කාර්ය මණ්ඩලය හා සසඳන විට මද වශයෙන් වෙනස් වන්නේ වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබා ගැනීමත් අවශ්‍යතාවය සඳහා ය. සේවකයකුගේ කාර්යසාධනය, රැකියා විස්තරය හා වාර්ෂික අයවැයෙහි දැක්වෙන අපේක්ෂා සපුරාලන විට දිරි දීමනා, උසස්වීම්, වැටුප් වර්ධක හා කාර්යය ප්‍රසාරණය ආදිය තුළින් ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ.

කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු වූ විට තම රැකියාව සඳහා අවශ්‍ය වන කුසලතා හා නිපුණතා වැඩිදියුණු කරගැනීම සඳහා සේවකයා හට පුහුණු හා සංවර්ධන අවස්ථා සලසා දෙනු ලැබේ. සේවකයාගේ ආකල්ප හා හැසිරීම නිවැරදි කිරීම සඳහා ද පුහුණුව හා සංවර්ධනය ඉවහල් වේ.

වැඩි වශයෙන් සුදුසුකම් හා නිපුණතා ලබා ගැනීම සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය විසින් මෙහෙයවනු ලබන අභ්‍යන්තර වැඩසටහන් මෙන් ම බාහිර වැඩසටහන් සඳහා ද සහභාගි වීමට අපගේ සේවකයන් දිරිමත් කෙරේ. සේවකයකු ඉහළ සුදුසුකම් ලබා ගත් විට ඔහුට/ඇයට වඩා ඉහළ තනතුරක් සඳහා අයදුම් කිරීමට හැකියාව ලැබේ.

ඒ අනුව නිවැරදිව ලබාදෙන සහයෝගය මගින් සේවක තෘප්තිය ඉහළ නැංවීමට පහත දැක්වෙන භෞතික ප්‍රතිලාභ අපි ලබා දෙන්නෙමු.

- මූල්‍ය ප්‍රතිලාභ - දිරි දීමනා, වැටුප් වර්ධක, වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන වියදම් ප්‍රතිපූර්ණය කිරීම.
- මූල්‍ය නොවන ප්‍රතිපාදන - උසස්වීම්, විදේශ පුහුණු වැඩසටහන්
- වැඩ පරිසරය/පහසුකම් වැඩි දියුණු කිරීම.
- වෘත්තීය අභිවර්ධනය හා වර්ධනය සඳහා අවස්ථා.
- සේවා ප්‍රසාරණය හා සවිලකරණය.
- අධීක්ෂකයන්, සමාන මට්ටමේ පුද්ගලයන් හා යටත් නිලධාරීන්ගේ සහාය.

අපගේ සේවක තෘප්තිමත්භාවය මැන බැලීම තුළින් සේවකයා අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති ප්‍රගතිය කවර මට්ටමක පවතී ද යන්න පෙන්නුම් කරයි. එම ප්‍රගතිය පහළ මට්ටමක පවතින ක්ෂේත්‍ර ඇතොත් ඒවා දියුණු කිරීම සඳහා පවතින අවස්ථා හඳුනාගත හැකි වේ.

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ සමස්ත සේවක පිරිස, දීර්ඝකාලීන වශයෙන් ශිෂ්‍යයන්/සේවාදායකයන් හා සංවිධාන ලෙස ඔවුන් ලබන තෘප්තිය වැඩි දියුණු කිරීම හා කෙටිකාලීන වශයෙන් අයවැයෙහි දැක්වෙන ආදායම ලබා ගැනීම යන පොදු අරමුණු සඳහා සේවය කරති. ඉහළ මට්ටමේ මූල්‍ය සාධනයන් ළඟා කර ගැනීම තුළින් ඔවුනට වඩා හොඳ ප්‍රතිලාභ ලබාගත හැක. මෙය ඉටු කර ගත හැක්කේ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ කම්කරුවාගේ සිට උපදේශකයන් දක්වා සියලුම සේවක ස්ථරයන්ගේ සාමූහික ප්‍රයත්නය හා සහයෝගීතාවය තුළින් ය. අපගේ සේවා පද්ධතිය අනුව සෑම සේවක-යෙකුටම අනන්‍ය වූ කාර්යභාරයක් තිබෙන අතර එය ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ ඵලදායීතාවයට දායක වේ. ආයතනයේ විවිධ ස්ථරයන් අතර සන්නිවේදනය ලියවිලි, චක්‍රලේඛ, දැන්වීම්, රැස්වීම් වාචික උපදෙස් හා ප්‍රතිචාර, දුරකථන ඇමතුම් හා විද්‍යුත් තැපෑල මගින් ඉටු වේ. මහනුවර, ගාල්ල හා කුරුණෑගල, මාතර, ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය - කිරුළපන සහ මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථාන සමඟ සන්නිවේදනය ද මෙම ක්‍රමවේද සුදුසු අයුරින් යොදා ගනිමින් සිදු කෙරේ.

## සේවක පැතිකඩ

| | අනුමත සේවක සංඛ්‍යාව | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 50 | 48 | 49 | 51 | 61 | 53 | 75 | 73 | 84 |
| විධායක කාර්ය මණ්ඩලය | 53 | 18 | 22 | 23 | 25 | 25 | 26 | 25 | 20 |
| සහකාර කාර්ය මණ්ඩලය | 119 | 97 | 108 | 106 | 103 | 106 | 101 | 104 | 103 |
| එකතුව | **222** | **163** | **179** | **180** | **189** | **184** | **202** | **202** | **207** |




## මානව සම්පත් සංවර්ධනය

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ සමස්ත මානව සම්පත් සංවර්ධනය පදනම් වී ඇත්තේ ආයතනය තුළින් ශක්තිමත් කරන ලද උසස් කාර්යසාධනීය සංස්කෘතියක් උත්පාදනය සඳහා පහසුකම් සැලසීම තුළිණි. ඒ සඳහා මූලික වශයෙන් පුහුණුව හා සංවර්ධනය සලකා බලනු ලබන අතර ආයතනය විසින් අනුගමනය කරන ලද මානව සම්පත් කළමනාකරණ ආකෘතිය මත පදනම්වය. වටිනාකම් පද්ධතිය අඛණ්ඩ පුහුණුව හා සංවර්ධනය සඳහා ආයතනික සාමාජිකත්වයේ කොටසක් ලෙස සියලුම සේවකයින්ට අවස්ථා ලබාදීමේ ආකාරයෙන් ඉදිරියට යාමට ඉඩ සැලසීම සඳහා විධිමත් පුහුණුව හා සාමුහික වගකීම බෙදීම සම්බන්ධව අවධානය යොමු කෙරේ. පුහුණුව හා සංවර්ධනය සමඟ ඒකාබද්ධ වූ ආයතනය අනුගමනය කරන සමස්ත මානව සම්පත් කළමනාකරණ ආකෘතියට අනුව සිදු කෙරේ.



ඒ අනුව ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ සමස්ත මානව සම්පත් සංවර්ධන සැලැස්ම කෙරෙහි අවධානය යොමු කෙරේ:

- ජීවිත කාලය පුරාම ඉගෙනීම දිරිමත් කරන, අඛණ්ඩ ස්වයං සංවර්ධයට සහය දක්වන සහ අගය කරන ඉගෙනුම් සංස්කෘතියක් ඇති කිරීම.
- විවිධ හා මනා සමබර ආයතනික කුසලතා සංචිතයක් තුළින් උසස් ආයතනික කාර්යසාධනය දිරිමත් කිරීම.
- කාර්ය මණ්ඩලයේ වෘත්තීයභාවය වැඩි දියුණු කිරීම.
- සේවක ඵලදායිතාව සහ රැකියා තෘප්තිමත් බව වැඩි දියුණු කිරීම.
- ප්‍රධාන මෙහෙයුම් කාර්යයන් සහ ආයතනයේ සජීවී ස්වභාවය පවත්වා ගැනීම.

**සැලැස්මේ අරමුණු වනුයේ:**

- සාමාජිකයින් අතර ආයතනික වටිනාකම් ආරක්ෂා කරමින් ආයතනික දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට පහසුකම් සැලසීම.
- ආයතනයේ දැනට පවතින හා විභව ශ්‍රම බලකාය මුළුමනින්ම ප්‍රයෝජනයට ගැනීම සඳහා වෙනස් වන පාරිසරික ක්‍රියාකාරකම් සැලකිල්ලට ගෙන සේවක දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම.
- පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා සේවාවන් සැපයීමේදී ඔවුන්ගේ කාර්යසාධනය තීරණය කිරීම සඳහා සේවකයින් වරින් වර ඇගයීම් සිදු කරන බවට සහතික වීම.
- කිසිදු භේදයකින් තොරව සියලුම සේවකයින්ට අඛණ්ඩ සංවර්ධන අවස්ථා ලබා දීම.

ආයතනික ප්‍රධාන සැලැස්ම සමඟ පහත සඳහන් මූලධර්ම වැදගත් වේ:

- කර්මාන්තයට නැඹුරු වීම.
- නායකත්ව සංවර්ධනය.
- ස්ථාවරත්වය ගොඩනැගීම.
- ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- නව තාක්ෂණයට අනුවර්තනය වීම සහ වෙනස් වීම.
- තිරසාර නවෝත්පාදන භාවිතය.

සේවකයෙකුට ඕනෑම ශාස්ත්‍රීය, වෘත්තිකයෙකුගේ හෝ වෙනත් ස්වයං සංවර්ධනයක හෝ ස්වයං වර්ධන වැඩ සටහනක යෙදීමේ අයිතිය ලබා දී ඇති අතර අදාළ අංශ ප්‍රධානියාගේ නිර්දේශය මත හැකි සෑම අවස්ථාවකම ඕනෑම සංවර්ධන අවස්ථා-වක් ලබා ගැනීමට ද අවසර දෙනු ඇත. සේවකයින් සඳහා වූ විධිමත් කාර්යසාධන ඇගයීම් සහ ත්‍යාග ක්‍රමය ආයතනයේ ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම හා සම්බන්ධ වන අතර එමගින් සේවක වගකීම් හා සම්බන්ධ කාර්යසාධන මිනුම් වාර්ෂිකව කාර්යසාධන ඇගයීම් පත්‍ර භාවිතයෙන් සිදු කෙරේ. උපදේශකයින්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කාර්යසාධන ඇගයීම් පත්‍රිකා වල විශ්ලේෂණයේ අන්තර්ගතය සහ ගැඹුර වැඩි විස්තර සහ විනිවිදභාවය ග්‍රහණය කර ගැනීම සෙසු කාර්ය මණ්ඩලයට වඩා තරමක් වෙනස් ය. සේවකයකුගේ කාර්යසාධනය රැකියා විස්තර සහ වාර්ෂික අයවැය තුළ තබා ඇති අපේක්-ෂාවන් සපුරාලන්නේ නම්, ඒ සඳහා දිරි දීමනා, උසස්වීම්, වැටුප් වර්ධක සහ රැකියා උසස්වීම් ලබාදීම සිදු කෙරේ.

මඟ පෙන්වන ලද තොරතුරු මූලාශ්‍රයක් ලෙස පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීමේදී සහ සහාය වීම සඳහා KPI "කාර්යයසාධක දර්ශක" ඇගයීම සිදු කෙරේ. ආයතනය විසින් පිළිපදින කාර්යසාධන දර්ශකයන් ව්‍යාපාරික පරිසරයට ගැලපෙන පරිදි උපායමාර්ගික සැලැස්ම මත පදනම්ව සංශෝධනය කෙරේ. කාර්යසාධන දර්ශක කාර්තුමය වශයෙන් මැනිය යුතු අතර සේවක-යාගේ මාසික දිරි දීමනාව වාර්ෂිකව තීරණය කෙරේ. කාර්යසාධනය අපේක්ෂිත තත්වයට වඩා අඩු නම්, සේවකයා තවදුරටත් පුහුණුව හා සංවර්ධන ක්‍රියාවලියක් සඳහා යොමු කරනු ලබන අතර එම කාර්යය තවදුරටත් ඉටු කිරීම සඳහා අවශ්‍ය නිපුණතා හා කුසලතාවයන් ලබා ගැනීමට උපකාර වේ. උසස් සුදුසුකම් හා නිපුණතා ලබා ගැනීම සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ පැවැත්වෙන වැඩසටහන් වලට මෙන්ම බාහිර වැඩසටහන් වලට සහභාගී වීමට සේවකයින් දිරිමත් කරන අතරම සේවක ආකල්ප සහ හැසිරීම් වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව හා සංවර්ධනය ලබා දෙනු ඇත. සේවකයෙකු උසස් සුදුසුකම් ලැබූ විට ඔහුට / ඇයට උසස් තනතුරක් සඳහා ඉල්ලුම් කළ හැකිය.

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් පහත පුහුණු වැඩසටහන්වලට යොමු කරනු ලැබේ.

- ආයතනයේ අභ්‍යන්තර පුහුණු වැඩසටහන්,
- දේශීය පුහුණු වැඩසටහන්
- විදේශ පුහුණු වැඩසටහන්

ඉදිරි වසර තුන තුළ පුහුණුව හා සංවර්ධනය සඳහා අයවැයෙන් වෙන් කළ ආයෝජන මුදල පහත පරිදි වේ

(රුපියල් මිලියන)

| | 2021 | 2022 | 2023 |
|---|---|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 15 | 15.5 | 26 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 3.5 | 4 | 10 |

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය මෙමගින් බලාපොත්තු වනුයේ මානව සම්පත් සංවර්ධනය අඛණ්ඩව ඉදිරියට ගෙන යාම සඳහා සමූහික වගකීම බෙදාහැරීමේ අඛණ්ඩ ක්‍රියාවලියක් සහ ඉගෙනීම හා සංවර්ධනය සඳහා අවස්ථා සැපයීම සහ සේවකයින්ට ඔවුන්ගේ විශේෂිත රැකියා භූමිකාවන් සහ ඔවුන් වැඩ කරන ක්‍රියාවලීන් යන දෙඅංශයෙන්ම දායකත්වය වර්ධනය කර ගැනීමට උනන්දු කරවීමයි. මෙම කාර්යය සඳහා ඔවුන් නව පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා යොමු කෙරෙන අතර කාර්යමණ්ඩලයේ වෘත්තීමය සංවර්ධනය සඳහා අඛණ්ඩව උත්සාහ කරමින් සිටී.
මෙය සහතික කිරීම සඳහා ආයතනය පහත සඳහන් ශිල්පීය ක්‍රම උපයෝගී කරගනිමින් සේවක ඵලදායිතාව ඉහළ නැංවීම සහ රැකියා තෘප්තිය සඳහා සේවකයින්ගේ විශ්වසනීයත්වයේ මට්ටම ඉහළ නැංවීම සඳහා සවිස්තර සේවක නිපුණතා විශ්ලේෂණයක් සිදු කර ඇත.

- කාර්යය මාරු කිරීම
- සේවකයින් අලුතින් ස්ථාපනය කිරීම
- කාර්යය ප්‍රසාරණය
- රැකියා සුපෝෂණය

ආයතනික ප්‍රතිපත්තිය සලකා බැලීමේ දී ප්‍රමුඛතාවය මත පදනම්ව මානව සම්පත් සංවර්ධනය සඳහා පහත සඳහන් ප්‍රධාන අංශ කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

- NIBM සහ එහි සාමාජිකයින්ගේ වර්ධන අවශ්‍යතා
- සේවකයාගේ අභිප්‍රේරණය වැඩි දියුණු කිරීම
- ඵලදායි වැඩ කරන පරිසරයක් ගොඩනැගීම
- ශ්‍රම බලකායේ තිරසාර සංවර්ධනය

පුහුණු සුදුසුකම් තක්සේරු කිරීම සඳහා පහත සඳහන් අංශ කෙරෙහි සැලකිල්ල දක්වන අතර, මූල්‍යය හා කලින් නියම කරන ලද රෙගුලාසි හා මාර්ගෝපදේශයන්ට යටත් වන පාලන සංග්‍රහය යටතේ ඒ ඒ මධ්‍යස්ථානයේ අදාළ බලයලත් ප්‍රධානීන් වෙත අවසන් තීරණ ගැනීමේ වගකීම පැවරේ.

- ආයතනයේ ස්ථිර සේවකයෙකු විය යුතුය
- පුහුණු වැඩ සටහන රැකියා භූමිකාවට අදාළ විය යුතුය
- අංශ ප්‍රධානියා විසින් නිර්දේශ කළ යුතුය

සියලුම සේවකයින්ට ලබා දෙන විධිමත් අධ්‍යයන පුහුණුව කාලෝචිතව සිදු කෙරෙන විධිමත් පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය මත සිදු කෙරේ. විධිමත් පුහුණු අවශ්‍යතා තක්සේරුව ප්‍රධාන අංශ තුනක් යටතේ සලකා බලනු ලැබේ

1. එක් එක් රැකියාව සඳහා නිපුණතා ඇගයීම
2. කළමනාකරණය විසින් කණ්ඩායම් පුහුණුව
3. සේවකයා විසින් කරන ලද ඉල්ලීම

ආයතනය විශ්වාස කරනුයේ, ප්‍රතිලාභ යනු අඛණ්ඩ ඉගෙනුම් හා සංවර්ධනයන් සඳහා පෙලඹවීමක් වන අතර එමඟින් සේවකයින්ට ප්‍රතිලාභ සහ මානසික සහය ලබා දීමෙන් සේවක තෘප්තිය වැඩි කර ගැනීමට උත්සාහ කරන අතර සමස්ත ප්‍රතිලාභ පැකේජය පහත දැක්වෙන කාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇත.

- මූල්‍ය ප්‍රතිලාභ, දිරි දීමනා, වැටුප් වර්ධක, වෛද්‍ය වියදම් ආපසු ගෙවීම
- මූල්‍ය නොවන ප්‍රතිලාභ, උසස්වීම්, විදේශ පුහුණුව
- වැඩ කරන පරිසරය / පහසුකම් සංවර්ධනය කිරීම
- වෘත්තීය දියුණුව සහ වර්ධන අවස්ථා
- වෘත්තීමය වර්ධනය
- අධීක්ෂකවරුන්, සම වයසේ මිතුරන් සහ යටත් නිලධාරීන්ගේ සහාය

මෙම ප්‍රතිලාභ සැලැස්ම සෑම වසරකම සිදු කෙරෙන සේවක තෘප්තිමත් සමීක්ෂණයට ඇතුළත් වන අතර එමඟින් එම ක්ෂේත්‍රයන්ට අදාල ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම් සිදු කරනු ලබන අතර අඩු ශ්‍රේණිගත කිරීම් ඇති ක්ෂේත්‍රයන් වැඩි දියුණු කිරීමේ අවස්ථා ලෙස හඳුනාගනු ලැබේ. ආයතනයෙහි සමස්ත සේවක මණ්ඩලයම ශිෂ්‍යයින්ගේ, සේවාදායකයන්ගේ සහ සංවිධානයේ තෘප්තිය වැඩි දියුණු කිරීම සහ කෙටි කාලීනව අයවැය ආදායම සාක්ෂාත් කර ගැනීම සහ එමඟින් ඉහළ මූල්‍ය ජයග්‍රහණ ලබා දීම යන පොදු ඉලක්කය සඳහා කටයුතු කරමින් සිටියි. උපදේශකගේ සිට කම්කරුවා දක්වාම අඛණ්ඩව සංවර්ධනය කිරීම NIBM හි සියලුම ස්ථර වල සාමූහික උත්සාහය සහ සහයෝගීතාවයෙන් මෙය කළ හැකිය. ආයතනික කාර්ය විධිවිධාන වලට අනුව, සෑම සේවකයෙකුටම සුවිශේෂී කාර්යභාරයක් පැවරී ඇති අතර එමඟින් අවසානයේදී ආයතනයේ සඵලතාවයට ද සහය වේ. විවිධ ස්ථර අතර සන්නිවේදනය සිදු වන්නේ අභ්‍යන්තර ලිපි, චක්‍රලේඛ, දැන්වීම්, රැස්වීම්, වාචික උපදෙස් සහ ප්‍රතිපෝෂණ, දුරකථන ඇමතුම් සහ විද්‍යුත් තැපෑලෙනි. මහනුවර, කුරුණෑගල, ගාල්ල, මාතර සහ ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය, මහනුවර නවෝත්පාදන මධ්‍යස්ථානය සමග සන්නිවේදනය කිරීම ද සුදුසු පරිදි මෙම ක්‍රමවේදය හරහා සිදු කෙරේ.

## ශ්‍රම බලකායේ සම්බන්ධතාවය තක්සේරු කිරීම

පහත සඳහන් ක්‍රම මඟින් ආයතනය ශ්‍රම බලකායේ නියැලීම් තක්සේරු කරයි.

- සේවක තෘප්තිමත්භාවය පරීක්ෂා කිරීම
- සේවයට නොපැමිණීම
- සේවක පිරිවැටුම

ව්‍යුහාත්මක ප්‍රශ්නාවලියක් භාවිතයෙන් සිදු කරන ලද සේවක තෘප්තිමත් සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව NIBM ආයතනයේ ශ්‍රම බලකායේ නියැලීම මැන බලන අතර සමීක්ෂණය වසරකට දෙවරක් සිදු කෙරෙන අතර එහි ප්‍රතිඵල සමස්ත මානව සම්පත් පද්ධතිය තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා යොදා ගනී. සේවා නියුක්තිය තක්සේරු කිරීමේ වෙනත් ක්‍රම නම් නොපැමිණීම සහ පිරිවැටුම වැනි වක්‍ර ක්‍රම වේ.

## මානව සම්පත් සංවර්ධනය 2021

ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින් NIBM ආයතනයේ පුහුණුවීම් සහ බාහිර පුහුණු වැඩසටහන් සඳහා යොමු කර ඇත. එවැනි වැඩසටහන්වල විස්තර පහතින් දක්වා ඇත.

### දේශීය පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම 2021

| | සහභාගිවන්නාගේ නම | පුහුණු ක්ෂේත්‍රය | දිනය |
|---|---|---|---|
| 1. | උපදේශක / කථිකාචාර්යවරු | Idea Incubation වැඩමුළුව | 2021 පෙබරවාරි 09 |
| 2. | පියුමි උදාරා මෙනවිය<br>කළමනාකරණ සහකාර | දත්ත විශ්ලේෂණ පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව (අර්ධ කාලීන) | 2021 මැයි 08 |
| 3. | තිසර වීරසිංහ මහතා<br>උපදේශක / කථිකාචාර්ය<br>බාලකුමාර් මහතා<br>උපදේශක / කථිකාචාර්ය<br>එච්.එම්. ඩී.ශානිකා අබේවර්ධන මිය<br>උපදේශක / කථිකාචාර්ය<br>සඳරුවන් හේරත් මහතා<br>උපදේශක / කථිකාචාර්ය<br>නිමේෂිකා මල්ෂානි ඇලෝසියස් මෙනවිය<br>උපදේශක/කථිකාචාර්ය<br>බී. ඒ. සී. ඩී. ජයසිංහ මහත්මිය<br>කළමනාකරණ සහකාර<br>තරිඳු පරාක්‍රම මහතා<br>කළමනාකරණ සහකාර | ISO 9001:2015 අභ්‍යන්තර විගණක පුහුණුව | 2021 ජුනි 14 සහ 15 |
| 4. | සමෘද්ධි අග්‍රජා ජයසූරිය මෙය<br>කළමනාකරණ සහකාර<br>ශෂිකලා හෙට්ටිආරච්චි මෙය<br>කළමනාකරණ සහකාර - ඵලදායිතා සහ තත්ත්ව අංශය | ISO 9001:2015 ප්‍රධාන විගණක පුහුණු වැඩසටහන | 2022 නොවැම්බර් 10, 11, 12, 15 සහ 16 |
| 5. | NIBM අධ්‍යයන පීඨය සඳහා නේවාසික වැඩමුළුව | නිපුණතාවලට ගැලපෙන පරිදි වෘත්තීය තක්සේරු කිරීමේ හැකියාව සංවර්ධනය කිරීම | 2021 දෙසැම්බර් 10 සහ 11 |
| 5. | බාහිර කථිකාචාර්යවරු | ප්‍රතිඵල පදනම් කරගත් ඉගෙනුම් (OBL) සහ ඇගයීම් යෝජනා ක්‍රමය | 2021 දෙසැම්බර් 17 |

## සේවයෙන් ඉවත්ව යාම - 2021

| | නම | තනතුර | මධ්‍යස්ථානය | දිනය |
|---|---|---|---|---|
| 1596 | රණසිංහ හේවගේ නිලානි සන්ධ්‍යා ජයතිස්ස | උපදේශක / කථිකාචාර්ය | කුරුණෑගල | 7/14/2021 |
| 1659 | නිමේෂිකා මල්ෂානි ඇලෝසියස් | උපදේශක / කථිකාචාර්ය | කුරුණෑගල | 10/31/2021 |
| 1555 | වන්නිනායක මුදියන්සේලාගේ ලක්මිණි නර්මදා වන්නිනායක | උපදේශක / කථිකාචාර්ය | කුරුණෑගල | 9/11/2021 |
| 1595 | රාහුබද්දේ කංකානම්ගේ දිලිනි බුද්ධිකා | උපදේශක / කථිකාචාර්ය | ගාල්ල | 10/24/2021 |
| 1717 | හේවාවසම් මස්සලාගේ දොන් ධනුෂ්ක ප්‍රදීප් කුමාර | උපදේශක / කථිකාචාර්ය | KIC | 11/12/2021 |
| 1719 | ශෂිනි සඳමිණි රම්බන්ඩාර | උපදේශක / කථිකාචාර්ය | KIC | 11/4/2021 |
| 1697 | ජයසූරිය පටබැඳිගේ නිශාදි | උපදේශක / කථිකාචාර්ය | මාතර | 12/10/2021 |
| 1681 | සංජු කෞෂල්‍ය | උපදේශක / කථිකාචාර්ය | කොළඹ | 25/12/2021 |
| 1678 | පියුමින්දි විජේකෝන් | උපදේශක / කථිකාචාර්ය | මහනුවර | 20/12/2021 |
| 1700 | නිෂාදි ජයසූරිය | උපදේශක / කථිකාචාර්ය | මාතර | 10/12/2021 |
| 1671 | පතිරගේ ක්‍රිෂ්මලී අරේෂි මදුප්‍රීති පෙරේරා | අභ්‍යන්තර විගණක | කොළඹ | 9/16/2021 |
| 1677 | කොටකෙතන මද්දුවගේ ඔෂාන් එරංග වික්‍රමසිංහ | නඩත්තු නිලධාරි | කොළඹ | 2/11/2021 |
| 1604 | ලහිරු චන්දිම බණ්ඩාර රත්නායක | වැඩසටහන් සමායෝජක | කුරුණෑගල | 4/23/2021 |
| 1633 | නිලන්ත කුමාර කලංසූරිය | වැඩසටහන් සමායෝජක | මාතර | 10/7/2021 |
| 1584 | රත්නායක මුදියන්සේලාගේ එරන්දි අයෝද්‍යා රත්නායක | මෘදුකාංග ඉංජිනේරු | කොළඹ | 9/30/2021 |
| 1573 | තරිඳු හාෂිණී බිලොක් | කළමනාකරණ සහකාර | කුරුණෑගල | 1/7/2021 |
| 1575 | හෑගොඩ ආරච්චි තාරක දමිරුවන් | කළමනාකරණ සහකාර | මහනුවර | 4/1/2021 |
| 1612 | රන්මුතුගේ චාමලී යසාරා ස්වර්ණසිරි | කළමනාකරණ සහකාර | කොළඹ | 6/3/2021 |
| 1713 | වහන්තරාගේ සචිනි දිලීෂා මල්ෂානි | කළමනාකරණ සහකාර | කොළඹ | 8/3/2021 |
| 1198 | හිත්ගොඩ සකල ආරච්චි රාජකරුණාලාගේ රවීන්ද්‍ර ධම්මික රාජකරුණා | පරිගණක නිර්මාණ ශිල්පි | කුරුණෑගල | 5/4/2021 |
| 8462 | යශෝධ්‍යා මැණික්දිවෙල | නිර්මාණ ශිල්පී | කොළඹ | 23/10/2021 |

## සේවයෙන් විශ්‍රාම යාම - 2021

| | නම | තනතුර | මධ්‍යස්ථානය | දිනය |
|---|---|---|---|---|
| 481 | තලගලගේ දොන් සුනිල් ජයන්ත මහතා | කාර්යාල සහායක/කම්කරු | කොළඹ | 4/3/2021 |
| 1322 | දස්කොන් අදිකාරම්ලාගේ විනී වීර වික්‍රම මහතා | කාර්යාල සහායක /කම්කරු | මාතර | 10/30/2021 |
| 429 | සීතා ජයන්ති විජේසිංහ මිය | සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ වැඩසටහන් | කොළඹ | 11/17/2021 |
| 1312 | මුතුතන්ත්‍රි සරත් කුමාර කුරේ මහතා | කම්කරු | කුරුණෑගල | 11/23/2021 |
| 595 | එලිබිච්චි පතිරන්නැහැලගේ චන්ද්‍රකාන්ති සමරදිවාකර මිය | මාණ්ඩලික සහකාර | කොළඹ | 11/29/2021 |
| 557 | මුකන් බාලසූරියම් මහතා | කාර්යාල සහායක /කම්කරු | කොළඹ | 8/21/2021 |

## සේවයට බඳවාගැනීම් - 2021

| | නම | තනතුර | දිනය |
|---|---|---|---|
| 1613 | රොහාන් තිසේරා මහතා | කළමනාකරණ සහකාර | 2021/12/01 |
| 1675 | ජයනාත් සෙනෙවි පෙරේරා මහතා | කම්කරු | 2021/12/01 |
| 1692 | ජාතුංග ආරච්චි මෙනවිය | වෙබ් සංවර්ධක | 2021/12/01 |
| 1693 | ප්‍රසංගා දයානන්ද මෙනවිය | පද්ධති සංවර්ධක | 2021/12/01 |
| 1695 | එස් එස් ගුණවර්ධන මහතා | කාර්යාල සහායක | 2021/12/01 |
| 1715 | එම් ජී ටී ලක්ෂනිකා රුවන්ති මෙනවිය | උපදේශක/කථිකාචාර්ය | 2021/02/08 |
| 1716 | කේ පී තිමාෂා ප්‍රමෝදි මෙනවිය | උපදේශක/කථිකාචාර්ය | 2021/02/08 |
| 1717 | එච් එම් ඩී ඩී ප්‍රදීප් කුමාර මහතා | උපදේශක/කථිකාචාර්ය | 2021/02/08 |
| 1719 | එස් සඳමිණි රම්බණ්ඩාර මෙනවිය | උපදේශක/කථිකාචාර්ය | 2021/02/08 |
| 1720 | ආර් ජී විමුක්ති පතිරණ මයා | උපදේශක/කථිකාචාර්ය | 2021/02/08 |
| 1721 | එස් ආර් පනම්ගල විතානාච්චි මෙනවිය | උපදේශක/කථිකාචාර්ය | 2021/02/08 |
| 1722 | ආශා නිලානි ලියනගේ මෙනවිය | උපදේශක/කථිකාචාර්ය | 2021/02/08 |
| 1723 | එල් ඩබ්ලිව් අමරසිංහ මහතා | උපදේශක/කථිකාචාර්ය | 2021/01/09 |
| 1727 | ආර් ඩී පී මධුශංක පල්ලේගම මහතා | උපදේශක/කථිකාචාර්ය | 2021/08/31 |
| 1728 | කේ වී එන් එම් සිංහඝෝෂා මෙනවිය | උපදේශක/කථිකාචාර්ය | 2021/08/02 |

## සෞඛ්‍ය රක්ෂණය

යහපත් සෞඛ්‍ය සහ සේවක සුභසාධනය උදෙසා, සොෆ්ට්ලොජික් රක්ෂණ සමාගම හරහා වාර්ෂිකව වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් ආයතනය විසින් සකස් කර ඇත. මෙම යෝජනා ක්‍රමය යටතේ, රෝහල් ගත කිරීම සඳහා වන බිල්පත් වලට අමතරව, සියලුම සාමාන්‍ය වෛද්‍ය බිල්පත් සහ ආයතනයේ සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ රෝහල් බිල්පත් ආපසු ගෙවනු ලැබේ. බරපතල රෝගාබාධ වලදී වසරකට රුපියල් මිලියනය දක්වා වු ආවරණයක් ඇත. මෙය ආයතනය විසින් සේවකයින්ගේ යහපත උදෙසා කරන ඉතා වැදගත් සේවාවකි.

## අවධානම් කළමනාකරණ වාර්තාව

කොවිඩ් 19 ව්‍යාප්තියත් සමඟ, බොහෝ ව්‍යාපාරවලට නව අභියෝග අත්විඳීමට සිදුව ඇත, NIBM ආයතනයද එසේමය. ආයතනය මුහුණ දෙන විවිධ ව්‍යාපාරික අවදානම් මධ්‍යයේ, පරිසරයේ පවතින අවිනිශ්චිතතාවය හේතුවෙන් ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගැනීමේ අවදානමට දැඩි ලෙස මුහුණ දී ඇත. කෙසේ වෙතත්, NIBM ව්‍යාපාර ආකෘතියෙහි අවශ්‍ය වෙනස්කම් සහ එහි වටිනාකම් දාමයේ වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කිරීමට නැඹුරු වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වසංගත කාල පරිච්ඡේදය තුළ පවා සාර්ථකව පවත්වා ගෙන යාමට සහ කළමනාකරණය කිරීමට ආයතනයට හැකි විය.

NIBM ආයතනය මුහුණ දෙන ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම සඳහා, දිගු කාලීන සමාජ-ආර්ථික තත්ත්වය සහ අනෙකුත් අභ්‍යන්තර හා බාහිර සාධක හොඳින් තක්සේරු කර ඇත. තව දුරටත් කැපී පෙනෙන ලෙස, නව අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගනිමින් අවදානම ජය ගැනීම සඳහා විවිධ උපායමාර්ග සහ ප්‍රවේශයන් අනුගමනය කර ඇත.

NIBM ආයතනයේ දිගු කාලීන වර්ධනයට සහ තිරසාරභාවයට අවදානම් කළමනාකරණය තීරණාත්මක වන බැවින් සියලු ක්‍රියාවලීන්හි අනිවාර්ය අංගයක් වන අතර, ආයතනය තුළ සිටින සියලු දෙනාගේ වගකීමක් ලෙස මෙය සලකයි.

තව දුරටත් NIBM අවදානම් කල්තියා හඳුනා ගැනීම අරමුණු කර ගෙන ඒවා තේරුම් ගැනීමට, කළමනාකරණය කිරීමට, අවම කිරීමට, මාරු කිරීමට හෝ වළක්වා ගැනීමට හැකියාව පවතී. මෙවැනි ක්‍රියාශීලී ප්‍රවේශයක් සහ ඵලදායී අවදානම් කළමනාකරණ රාමුවක් ආයතනය පුරාම නිරන්තරයෙන් පැවතිය යුතු වේ.

NIBM ආයතනයහි හඳුනාගෙන ඇති අවදානම් සාරාංශයක් එක් එක් අවදානම, ඒවායේ අවදානම් ශ්‍රේණිගත කිරීම් සහ ඒවා මත ගෙන ඇති අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ කෙටි විස්තරයක් පහත දක්වා ඇත.

| පටුන | | අවදානම් හිමිකරු | අවදානම් මට්ටම | අවධානම ලිහිල් කිරීමේ ක්‍රියාවන් |
|---|---|---|---|---|
| **ව්‍යාපාරික අවධානම්** | කඩාකප්පල්කාරී සාධක වර්ධනය විය හැකිය, තරඟකාරිත්වය සෑම විටම දැඩි තරඟකාරිත්වයක් පවතින අතර, එය වෙළඳපල කොටසෙහි අඩුවීමක් සහ සිසුන්ට ලබාදෙන සේවය අත්හිටුවීමට හේතු විය හැක. | අලෙවි අංශය | අතිශයින් ඉහල | අවධානය යොමු කළ යුතු ප්‍රධාන තරඟකාරී ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා නිතිපතා වෙළඳපල සමීක්ෂණ සිදු කල යුතුය. |
| | අවිනිශ්චිත ආර්ථිකය තුළ වැඩසටහන් කිහිපයක් මත අධික ලෙස යැපීම අයවැය අත්පත්කර ගැනීමට හා සමස්ත ලාභයට අහිතකර ලෙස බලපෑ හැකිය. | අධ්‍යයන ප්‍රධානීන් | ඉහල | අලෙවිකරණ ක්‍රියාකාරකම් ඵලදායී ආකාරයෙන් ක්‍රියාකාරීව කළමනාකරණය කිරීම.<br>විභව වෙළඳපොලවල් වෙත ප්‍රවේශ වීමට විවිධ නව වැඩසටහන් ගවේෂණය කිරීම<br>විෂය නිර්දේශයන් සංශෝධනය කරන්න. |

| පටුන | | අවදානම් හිමිකරු | අවදානම් මට්ටම | අවධානම ලිහිල් කිරීමේ ක්‍රියාවන් |
|---|---|---|---|---|
| **මෙහෙයුම් අවදානම** | NIBM ආයතනයේ කාර්ය සාධනය, සේවා බෙදා හැරීමේ ආකාරය සහ සෞඛ්‍යය සහ ආරක්ෂාව සම්බන්ධ විවිධ මෙහෙයුම් අවදානම් වලට නිරාවරණය වේ. | අධ්‍යයන ප්‍රධානීන් | අතිශයින් ඉහල | සිසුන්ගේ ප්‍රතිපෝෂණ ලබා ගැනීම සහ ඇගයීම. ක්‍රියාවලිය පිළිබඳ අඛණ්ඩ තත්ත්ව සමාලෝචනය. සේවක කාර්ය සාධනය ඇගයීම් රැකියා ඉපැයීම් සමඟ සම්බන්ධ වේ. කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව හා සංවර්ධනය ලබා දීම |
| | සේවා සැපයීමේ දුර්වල ගුණාත්මක භාවය හේතුවෙන් සිසුන් හැර යාමේ වැඩි වීමක් සහ අඩු රඳවා ගැනීමේ අනුපාතයක් පෙනෙන්නට පුළුවන. තවද, පාරිභෝගික තෘප්තිමත් දර්ශකයේ පහත වැටීමක් තුළින් මෙය හඳුනාගත හැකිය. | නඩත්තු සහ පරිපාලන | මධ්‍යස්ථ | අර්බුද කළමනාකරණය, ආපදා යථා තත්ත්වයට පත් කිරීම, සහ නිතිපතා අභ්‍යාස සමඟ හදිසි ප්‍රතිචාරය සඳහා ව්‍යාපාර අඛණ්ඩව සැලසුම් පවත්වාගෙන යාම |
| | අනපේක්ෂිත සිදුවීම් හරහා කාර්ය මණ්ඩලයට සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු සහ දේපල වලට හානි සිදුවිය හැකිය. | මානව සම්පත් සහ පරිපාලන | මධ්‍යස්ථ | රක්ෂණ ඔප්පු ලබා ගැනීම සහ අලුත් කිරීම. කොවිඩ්-19 වසංගතයට ප්‍රතිචාර වශයෙන් සුදුසු ප්‍රතිචාර මට්ටම් සහ පාලන පියවර පවත්වා ගැනීම.<br><br>වත්කම් මත භෞතික ආරක්ෂණ පාලනය වැඩි දියුණු කිරීම. CCTV කැමරා ඵලදායි ලෙස ක්‍රියාත්මක වන බව සහතික කර ගැනීම. |
| **මූල්‍ය අවධානම** | කොවිඩ් 19 ව්‍යාප්තවීම සමඟ ආර්ථිකය විසින් විඳදරාගත් අස්ථාවරත්වය සහ අවිනිශ්චිතතාවය වැඩි දියුණු කිරීම හේතුවෙන්, NIBM හි මධ්‍ය කාලීන මූල්‍ය ක්‍රියාන්විතය හිඟ ණයගැතියන්ගේ ශේෂයන් කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය. මෙනිසා මුදල් ප්‍රවාහය සහ ද්‍රවශීලතාවය යන ක්ෂේත්‍රවල මූල්‍ය අවදානම්වලට නිරාවරණය විය හැකිය.<br><br>අනුමත නොකළ ව්‍යාජ ගෙවීම් හරහා මෙහෙයුම් මූල්‍ය අවදානම් මතුවිය හැකිය. | වැඩසටහන් අංශය/ මූල්‍ය | අතිශයින් ඉහල | ගෙවිය යුතු ගෙවීම් අදාළ පාර්ශ්ව වෙත නිසි ලෙස දැනුම් දෙනු ලැබේ. ලැබිය යුතු හිඟ මුදල් ආපසු අයකර ගැනීම සඳහා පසු විපරම් ක්‍රියා පටිපාටි සිදු කරන්න. ගෙවීම් අධිකාරියේ මෙට්‍රික්ස් මත පදනම්ව සියලුම ගෙවීම් අනුමත කර ඇති බවට සහතික වන්න<br><br>රාජකාරි වෙන් කිරීම සහතික කිරීම. මූල්‍ය සන්නිවේදනය සහ හෙළිදරව් කිරීම් වල විනිවිදභාවය සහතික කිරීම. |

| පවුන | | අවදානම් හිමිකරු | අවදානම් මට්ටම | අවධානම ලිහිල් කිරීමේ ක්‍රියාවන් |
|---|---|---|---|---|
| **නියාමන අවදානම** | NIBM රජයේ දැක්මට අනුකූලව නියාමන කොන්දේසි, TVEC හි NVQ අවශ්‍යතා, කම්කරු නීති, සහ සේවා ස්ථානවල ආරක්ෂාව සහ සෞඛ්‍යය වැනි වෙනත් විවිධ නීති සහ රෙගුලාසි වලට යටත් වේ. එම අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වීම දඩ මුදල් හෝ නඩු ඇතුළු වෙනත් සම්බාධකවලට යටත් වේ. | මානව සම්පත් සහ මූල්‍ය | මධ්‍යස්ථ | ආයතනයේ අභ්‍යන්තර සන්නිවේදන ක්‍රම ශක්තිමත් කිරීම<br>අනුකූලතා පිරික්සුම් ලැයිස්තුව කාර්තුමය වශයෙන් ඇගයීම. |
| **මානව අවදානම්** | කුසලතා ආකර්ෂණය, කුසලතා වර්ධනය කිරීම සහ රඳවා තබා ගැනීම, හොඳම දක්ෂතා ආයතනයේ සාර්ථකත්වය සඳහා ප්‍රධාන අවධානය යොමු කරන එකකි.<br>ප්‍රධාන කුසලතා, දැනුම සහ විවිධ ශ්‍රම බලකායක් රඳවා ගැනීමට නොහැකි වීම කීර්ති නාමයට හානි කිරීමට සහ ව්‍යාපාර අඛණ්ඩ පැවැත්ම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ අසාර්ථකත්වයට හේතු වනු ඇත. | මානව සම්පත් | මධ්‍යස්ථ | අනුප්‍රාප්තිය සැලසුම් කිරීම<br>සේවක තෘප්තිය පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම.<br>නව තාක්ෂණයන්, මෙවලම් සහ ගෝලීය භාවිතයන් පිළිබඳව අපගේ සේවකයින්ගේ කුසලතා අඛණ්ඩව පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම. |
| **තොරතුරු තාක්ෂණ, දත්ත රහස්‍යතාව සහ සයිබර් ආරක්ෂණ අවදානම** | දත්ත උල්ලංඝනය කිරීම, සොරකම් කිරීම, නැතිවීම සහ තොරතුරු අනිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ අවිනිෂ්චිත පරිසරයක් තුළ, දත්ත රහස්‍යතාව සහ සිසුන්ගේ සහ ව්‍යාපාරවල තොරතුරු ආරක්ෂා කිරීම ඉතා වැදගත් වේ.<br>එවැනි සිදුවීම් වැළැක්වීමට අපොහොසත් වීම පාරිභෝගික විශ්වාසයට අහිතකර ලෙස බලපෑ හැකිය; ආයතනයේ තොරතුරු පිළිබඳ රහස්‍යභාවය, සැලකිය යුතු දඩ මුදල්, ව්‍යාපාර කඩාකප්පල් කිරීම් සහ කීර්තිනාම හානි ආදිය. | තොරතුරු තාක්ෂණ | ඉහල | තොරතුරු තාක්ෂණ ආරක්ෂණ දුර්වලතා නිරීක්ෂණය කිරීම.<br>සමාලෝචන ක්‍රියාවලියක් සිදුකිරීම සහ ආරක්ෂාව පිළිබඳ මෙවලම් භාවිතා කිරීම.<br>දත්ත උපස්ථය (Backup) නිතිපතා පවත්වාගෙන යෑම.<br>කාර්ය මණ්ඩලයට පුහුණුවක් ලබා දීමට කටයුතු කිරීම |




# NIBM
# පුස්තකාලය සහ විද්‍යුත් ඉගෙනුම් මධ්‍යස්ථානය

NIBM වසර 53 ක වෘත්තීය ජීවිතය තුළ දක්ෂ පුද්ගලයින් විශාල ප්‍රමාණයක් බිහි කර ඇත. මෙම දීර්ඝ කාලසීමාව තුළ සෑම සාමාජිකයෙක්ම තම දැනුම වර්ධනය සඳහා පුස්තකාල පහසුකම් භාවිතා කළහ. වර්තමාන ලෝකය ඉතා වේගයෙන් වෙනස් වන අතර සෑම කෙනෙකුටම කාලය ඉතිරි කර ගැනීම ඉතාම වැදගත් වේ. ලෝකයේ සියලුම අධ්‍යාපන ආයතන කාලය අවම කිරීම සඳහා විද්‍යුත් පුස්තකාල (eLibrary) සංකල්පය හඳුන්වා දී ඇත.
ආයතනය විසින් අලුතින්ම නිර්මාණය කරන ලද විද්‍යුත් පුස්තකාලය විවිධ ප්‍රජාවන් සඳහා විවෘත බව අපි ආඩම්බරයෙන් ප්‍රකාශ කරමු. පුස්තකාල පරිශ්‍රයට ඇතුළු නොවී, සෑම කෙනෙකුටම විද්‍යුත් පොත්, නිර්දේශිත කියවීමේ විද්‍යුත් පොත්, අතීත ලිපි ලේඛන, ආදර්ශ පත්‍ර, විද්‍යුත් සඟරා, විෂයමාලා, අධ්‍යාපනික වීඩියෝ, විද්‍යුත් පුවත්පත්, NIBM පුවත් සහ සිදුවීම් සහ තවත් බොහෝ විද්‍යුත් සම්පත් (eLibrary) ආදිය බාවිතා කළ හැකිය.
මෙහිදී ඔබගේ ලැප්ටොප් පරිගණකය, පුද්ගලික පරිගණකය, ස්මාර්ට් ජංගම දුරකථනය, ටැබ් හෝ අන්තර්ජාල පහසුකම් සහිත වෙනත් ඕනෑම උපාංගයක් භාවිතා කිරීමෙන් ඔබට අවශ්‍ය ඕනෑම දෙයක් සම්පූර්ණයෙන්ම නොමිලේ බාවිතා කළ හැක. මෙම විද්‍යුත් පුස්තකාල සංකල්පය NIBM විසින් හඳුන්වා දුන් තවත් සමාජ සේවාවකි.

## මෙහි විශේෂාංග

නවීනතම ප්‍රකාශන කියවීම සඳහා ඔබ ලොව විශාලතම ඔන්ලයින් ප්‍රකාශන නිවාසයට සම්බන්ධ වන ඔන්ලයින් පුස්තකාලය සතියේ දින 7ම දවසේ පැය 24 පුරාම විවෘතව පවතී. ඔබට පුස්තකාල වේලාවන් පරීක්ෂා කිරීමට හෝ නියමිත දිනට පෙර එම පොත කලින් ඇණවුම් කිරීමට අවශ්‍ය නැත. ඔන්ලයින් පුස්තකාලයක් සමඟින්, ඔබ කොතැනක සිට සොයා බැලුවත්, ඔබේ ප්‍රියතම මාතෘකා වෙත පැය 24/ දින 7 ප්‍රවේශය ඔබට ලබාගත හැක.

ඔන්ලයින් පුස්තකාලයකට පරිගණකයක් ඇති ඕනෑම කෙනෙකුට ලෝකයේ ඕනෑම තැනකට පිවිසිය හැක. ජාලගත පුස්තකාලයක් වන අතර භූගෝලීය ප්‍රදේශයකට සීමා වී නැත, එයින් අදහස් කරන්නේ පුස්තකාලයට මූලික වශයෙන් ගණන් කළ නොහැකි පුද්ගලයින් සංඛ්‍යාවකට සේවය කළ හැකි බවයි, පරිගණකයක්, අන්තර්ජාල ප්‍රවේශය සහ සම්බන්ධිත පුස්තකාල සඳහා නිවැරදි URL ඇති ඕනෑම කෙනෙකුට එහි බොහෝ අංශ වලින් ප්‍රයෝජන ගත හැකිය. ehub වෙත ලියාපදිංචි වීමෙන් පසු ඕනෑම කෙනෙකුට ඔන්ලයින් පොදු ප්‍රවේශ නාමාවලිය (OPAC) භාවිත කළ හැක.

අප ආයතනය සතුව උසස් සොයාබැලීමේ පහසුකම ද ඇත. ඔබට විවිධ මාර්ග වලින් විද්‍යුත් සම්පත් සෙවිය හැක. මේවා සම්පත් වර්ගය, ද්‍රව්‍ය වර්ගය, නිර්ණායක (මාතෘකාව, කර්තෘ, ISBN, මූල පද, ISSN, NIBM ප්‍රකාශන, NIBM විෂය, A/L,O/L විෂය, ප්‍රවර්ගය) සහ සෙවුම් පෙළ ලෙස මෙහි ඇතුලත් වේ.

ඔබට ඔබගේම පැතිකඩක් (Profile එකක්) සාදාගත හැකි අතර මේ සඳහා ඔබගේ ප්‍රියතමයන් (Friends) එකතු කළ හැකිය. නවතම විද්‍යුත් සම්පත් නැරඹිය හැකිය, එසේම විද්‍යුත් සම්පත් භාවිතා කිරීම හෝ බාගත කිරීම සිදුකළ හැක.

අපි පහත මාතෘකා යටතේ ප්‍රවේශයන් තුනක් නිර්මාණය කළ අතර සෑම දිනකම අපි විද්‍යුත් පුස්තකාල වෙත නව සාමාජිකයින් එකතු කරගන්නෙමු.

**ඔබේ පරිකල්පනයෙන් ඔබ්බට ගෝලීය පුස්තකාලයකට ප්‍රවේශ වන්න.**
**විද්‍යුත් ඉගෙනුම් ද්‍රව්‍ය සමඟ සම්පූර්ණයෙන්ම ඔන්ලයින් පුස්තකාලය.**

**https://nibmehub.com/**




## සාමාන්‍ය පෙළ සිසුන් සඳහා

NIBM e-Library මගින් සාමාන්‍ය පෙළ සිසුන්ට අවශ්‍ය අතීත ප්‍රශ්න පත්‍ර, ආදර්ශ ප්‍රශ්න පත්‍ර, පෙළ පොත්, අධ්‍යාපනික වීඩියෝ, විෂය සම්බන්ධ අන්තර්ගතයන් සහ විවිධ කියවීම් ද්‍රව්‍ය නොමිලේ ප්‍රවේශය සහිතව පිරිනමයි. තවද, ඔබට සම්බන්ධිත ප්‍රකාශන බාගත කිරීමට, විද්‍යුත් පුස්තකාලය තුළ ඔබේ ඉගෙනුම් පරිසරයට කැමැතිවීමට හැකි වනු ඇත. ඔබගේ නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමට මෙතුල ලියාපදිංචි විය හැක.

## උසස් පෙළ සිසුන් සඳහා

NIBM e-Library මගින් උසස් පෙළ අවශ්‍ය අතීත ප්‍රශ්න පත්‍ර, ආදර්ශ ප්‍රශ්න පත්‍ර, පෙළ පොත්, අධ්‍යාපනික වීඩියෝ, විෂය සම්බන්ධ අන්තර්ගතයන් සහ විවිධ කියවීම් ද්‍රව්‍ය නොමිලේ ප්‍රවේශය සහිතව පිරිනමයි. තවද, ඔබට සම්බන්ධිත ප්‍රකාශන බාගත කිරීමට, විද්‍යුත් පුස්තකාලය තුළ ඔබේ ඉගෙනුම් පරිසරයට කැමැතිවීමට හැකි වනු ඇත. ඔබගේ නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමට ලියාපදිංචි විය යුතුය.

## අ.පො.ස උසස් පෙළ සහ සාමාන්‍ය පෙළ සිසුන්ගේ සම්පත්

| වර්ගය | ද්‍රව්‍යය | සම්පත් ගනන |
|---|---|---|
| අ.පො.ස උසස් පෙළ සහ සාමාන්‍ය පෙළ | අධ්‍යාපනික වීඩියෝ | 1196 |
| | ආදර්ශ පත්‍රිකා | 216 |
| | පසුගිය පත්‍රිකා | 376 |
| | විද්‍යුත් පෙළ පොත් | 352 |
| | විෂය නිර්දේශය | 80 |
| | මුළු | 2220 |



## NIBM සිසුන් / කාර්ය මණ්ඩලය

NIBM හි සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන සහ සමාජ දැනුම වැඩි දියුණු කිරීම සඳහා සුවිශේෂී උසස් කියවීම්, මොඩියුල, මාර්ගෝපදේශ, අමතර කියවීම් ද්‍රව්‍ය සහ පාඨමාලා ආශ්‍රිත ප්‍රකාශන රාශියක් භාවිතය සඳහා පවතී.

**විද්‍යුත් සම්පත් ශීර්ෂය සඳහා ද්වාරය වෙත ඇතුල් වීම**

- කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට විද්‍යුත් පුස්තකාලයට ප්‍රවේශ වීමට NIBM විද්‍යුත් තැපෑල සහ මුරපදය භාවිත කළ හැක.
- විද්‍යුත් පොත්, වෙනත් විෂය සම්බන්ධ විද්‍යුත් පොත්, විද්‍යුත් සඟරා, සහභාගිවන්නන්ගේ මාර්ගෝපදේශ, අතීත ප්‍රශ්න පත්‍ර සහ තවත් බොහෝ දේ කියවීමට මෙමගින් නිර්දේශ කෙරේ.
- කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට NIBM විද්‍යුත් පුස්තකාල හරහා පහත URL වෙත ප්‍රවේශ විය හැක හෝ වෙන වෙනම ප්‍රවේශ විය හැක.

## එමරල්ඩ් මාර්ගගත විද්‍යුත් සඟරා එකතුව

- https://www.emerald.com/insight
- මාතෘකා 56 - ව්‍යාපාර, කළමනාකරණය සහ උපාය මාර්ග
- මාතෘකා 10 - තොරතුරු සහ දැනුම කළමනාකරණය
- මාතෘකා 16 - මෙහෙයුම්, සැපයුම් සහ ගුණාත්මකභාවය
- පුස්තකාලාධිපති විසින් ඔබට ආයතනයේ ප්‍රවේශ අංකයක් (OAN) ලබා දෙනු ඇත. මෙය ඔබට ඔබේ පුද්ගලික ගිණුම ආයතනයට සම්බන්ධ කිරීමට ඉඩ සලසයි, එවිට ඔබට ආයතනයෙන් පිටත ඕනෑම ස්ථානයක සිට ඔබේ අධ්‍යයන කටයුතු වෙත ප්‍රවේශ විය හැක.

## හාවඩ් ව්‍යාපාර සමාලෝචන විද්‍යුත් එකතුව (Harvard Business Review eCollection)

- https://www.hbr.org
- HBR.org, HBR ලේඛනාගාර, සහ උසස්ම ලිපි 50 වෙත පූර්ණ ප්‍රවේශය පවතී
- වාරික ව්‍යාපාරික මෙවලම් 7ක් පවතී
- බාගත කළ හැකි/ අභිරුචිකරණය කළ හැකි විනිවිද දැකිය හැකි අංශ සහිත දෘශ්‍ය පුස්තකාලයකි

## පියර්සන් ප්‍රකාශන විද්‍යුත් පොත් (Pearson Publication eBooks)

- https://elibrary.in.pearson.com
- තොරතුරු තාක්ෂණයේ මාතෘකා 12ක්
- කළමනාකරණ මාතෘකා 49 ක් පවතී



## ටේලර් සහ ෆ්‍රැන්සිස් සමූහ ප්‍රකාශන විද්‍යුත් පොත්

- www.taylorfrancis.com
- ඔබට මිලදී ගත් විද්‍යුත් පොත් අසීමිත බාගැනීම් කළ හැක. TESOL සහ මනෝවිද්‍යාව සහ උපදේශන විද්‍යුත් පොත් වල මාතෘකා 17ක් තිබේ
- 24x7 ප්‍රවේශය: IP වැඩ කරන ඕනෑම තැනක ඔබට පැය 24 පුරා ප්‍රවේශය ලැබේ

## NIBM කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා විද්‍යුත් සම්පත්

| වර්ගය | ද්‍රව්‍යය | සම්පත් ගනන |
|---|---|---|
| NIBM කාර්ය මණ්ඩලය සහ සිසුන් | නිර්දේශිත කියවීම | 249 |
| | පියර්සන් ප්‍රකාශනය නිර්දේශිත කියවීම් | 61 |
| | එමරල්ඩ් ඊ ජර්නල්ස් එකතුව | 82 |
| | හාවඩ් ව්‍යාපාරික සමාලෝචනය | 1 |
| | ඊ ජර්නල්ස් | 363 |
| | NIBM පසුගිය පශ්න පත්‍ර | 659 |
| | විද්‍යුත් පොත් | 4142 |
| | වීඩියෝ | 1072 |
| | එකතුව | 6629 |



## වෘත්තීයවේදීන් සහ මහජනතාව

ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ට සහ මහජනතාවට ඔවුන්ගේ සේවාවන්, සාහිත්‍ය සම්භාව්‍ය මත පදනම් වූ අන්තර්ගතයේ සිට ලිපි සහ සඟරා දක්වා පුළුල් පරාසයක ප්‍රකාශන සපයා ඇත.

මෙහිදී ආවරණය වන විෂය ක්ෂේත්‍ර ලෙස ගණකාධිකරණය, ප්‍රචාරණය, කෘෂි ව්‍යාපාර, විගණනය, මෝටර් රථ, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව, බැංකු හා මුල්‍ය, ව්‍යාපාර කළමනාකරණය, වෘත්තීය සංවර්ධන සහ වෘත්තීය අධ්‍යයන, සිවිල් ඉංජිනේරු, පරිගණක විද්‍යාව, පාරිභෝගික මූල්‍ය, ඊ-වාණිජ්‍යය, ආර්ථික විද්‍යාව, විදුලි ඉංජිනේරු, ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු, ඉංජිනේරු, ව්‍යවසායකත්වය, අපනයනය සහ ආනයනය, විලාසිතා සහ රූපලාවන්‍ය, චිත්‍රපට සහ සංගීතය, ආහාර සහ පෝෂණය, ඇඟලුම්, සෞඛ්‍ය සහ යෝග්‍යතාවය, නිවාස සහ උද්‍යාන, ආගන්තුක සත්කාරය, මානව සම්පත් කළමනාකරණය (HRM), කාර්මිකකරණය, රක්ෂණය, අභ්‍යන්තර සැලසුම්, නීතිය, නිෂ්පාදන, අලෙවිකරණය, මාධ්‍ය, ඡායාරූපකරණය, භෞතික විද්‍යාව, නිෂ්පාදන කළමනාකරණය, තත්ත්ව කළමනාකරණය, ප්‍රමාණ සමීක්ෂණය, බඳුකරණය, සංචාරක සහ තවත් බොහෝ දෑ දැක්විය හැකිය.

නොමිලේ ලියාපදිංචි වී මෙම සම්පත් ලබාගත හැක.

| වර්ගය | ද්‍රව්‍යය | සම්පත් ගනන |
|---|---|---|
| වෘත්තීයවේදී සහ පොදු | ඊ ජර්නල්ස් | 363 |
| | විද්‍යුත් පොත් | 4142 |
| | වීඩියෝ | 902 |
| | එකතුව | 5407 |






| වර්ගය | ද්‍රව්‍යය | සම්පත් ගනන |
|---|---|---|
| සම්පූර්ණ එකතුව | වීඩියෝ | 2268 |
| | ආදර්ශ ප්‍රශ්න පත්‍ර | 216 |
| | O/L සහ A/L පසුගිය ප්‍රශ්න පත්‍ර | 376 |
| | විද්‍යුත් පෙළ පොත් | 352 |
| | විෂය නිර්දේශය | 80 |
| | නිර්දේශිත කියවීම් | 249 |
| | පියර්සන් ප්‍රකාශනය නිර්දේශිත කියවීම් | 61 |
| | එමරල්ඩ් ඊ ජර්නල්ස් එකතුව | 82 |
| | හාවඩ් ව්‍යාපාරික සමාලෝචනය | 1 |
| | ඊ ජර්නල්ස් | 363 |
| | NIBM පසුගිය ලිපි | 659 |
| | විද්‍යුත් පොත් | 4142 |
| | එකතුව | 8849 |



## භෞතික පුස්තකාලය

NIBM හි පාඨමාලා සඳහා සහභාගිවන්නන්ගේ සහ වෘත්තීය කාර්ය මණ්ඩලයේ තොරතුරු සහ අධ්‍යාපනික අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම මධ්‍යස්ථානය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අංගසම්පූර්ණ මෙම මධ්‍යස්ථානය තුළ පොත් 27,900කට අධික සංඛ්‍යාවක්, CD-ROM 600කට වඩා, අධ්‍යාපනික වීඩියෝ පටි සහ තෝරාගත් වාර සඟරා වලින් පරිපූර්ණව පවතී. විශේෂ එකතු කිරීම් අතර ආසියානු ඵලදායිතා සංවිධානයේ (APO) ප්‍රකාශන, පුහුණු අත්පොත්, සමාගම් වාර්ෂික වාර්තා, වාර වාර්තා, සමාජ-ආර්ථික සංඛ්‍යාලේඛන, NIBM උපදේශන සහ ශිෂ්‍ය ව්‍යාපෘති වාර්තා, ශ්‍රී ලංකා එකතුව, ශ්‍රව්‍ය දෘෂ්‍ය ද්‍රව්‍ය සහ (CD ROM) භාෂා ඒකකය ආදියෙන් සමන්විත වේ.

පුස්තකාලය තුල විශ්ව දශම වර්ගීකරණය (UDC) භාවිතා කරනු ලැබේ.

අඩංගු වී ඇති විෂය ක්ෂේත්‍ර අතර ව්‍යාපාර කළමනාකරණය, ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය, කාර්මික ඉංජිනේරු විද්‍යාව, අලෙවිකරණය, ආර්ථික විද්‍යාව, පරිගණක විද්‍යාව, සංඛ්‍යාලේඛන, මහජන සම්බන්ධතා, කාර්යාල පරිපාලනය, ඵලදායිතාව, ඉලෙක්ට්‍රොනික විද්‍යාව, ව්‍යාපාර නීතිය, සන්නිවේදනය, කුඩා පරිමාණ කර්මාන්ත, පර්යේෂණ ක්‍රමවේද, පුහුණුව, ගණිතය මනෝවිද්‍යාව, ඉංග්‍රීසි භාෂාව සහ දෙමළ භාෂාව ආදිය දැක්විය හැකිය.

පුස්තකාලය මඟින් NIBM හි අධ්‍යයන සහ විධායක කාර්ය මණ්ඩලය, සිසුන් සහ පාඨමාලා සහභාගිවන්නන් සඳහා විමර්ශන, සහ ණය දීමේ සේවා, පුස්තකාල තොරතුරු සේවා, පුස්තකාල දත්ත සමුදාය, අන්තර් පුස්තකාල ණය පහසුකම්, ඡායා පිටපත් කිරීමේ පහසුකම, සඟරා අන්තර්ගත පිටු සේවාව සහ ග්‍රන්ථ නාමාවලියේ සහාය සපයයි. දර්ශක සහ අත්පත් කර ගැනීමේ ලැයිස්තුව, තොරතුරු වරණීය බෙදා හැරීම (SDI), වත්මන් දැනුවත් කිරීමේ සේවාව, ලේඛන සේවාව (ඡායා පිටපත්, විද්‍යුත් තැපෑල, ෆැක්ස්, මුද්‍රණ පත්‍ර භාවිතයෙන් ආදිය), විමර්ශන සේවාව, තොරතුරු උපදේශනය, පුස්තකාල සාමාජිකයින් සඳහා සපයන අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් පහසුකම් නොමිලේ සිදු කරනු ලැබේ.

පුස්තකාලයේ විශේෂ ක්‍රියාකාරකම් වන්නේ NIBM ක්‍රියාකාරකම් ඇතුළු පුවත්පත් ලිපි එකතු කිරීම, දර්ශක සම්පාදනය, පොත් ප්‍රදර්ශන, පොත් හුවමාරු සේවා, විද්‍යුත් ජාලකරණය හරහා අනෙකුත් ප්‍රමුඛ පෙළේ පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථාන සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සහ සංවර්ධන තොරතුරු සඳහා ජාතික සහ ජාත්‍යන්තර සහයෝගීතාවය ලබා ගැනීමයි.

පුස්තකාලයේ ප්‍රකාශන වන්නේ ජර්නල් අන්තර්ගත පිටු, ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය සහ CD/ROM දර්ශකය, ආවර්තිතා හෝල්ඩිංග්ස් දර්ශකය සහ වත්මන් දැනුවත් කිරීමේ සේවාවන් NIBM Library eLearning Studio රජයේ නිවාඩු දිනවල හැර සතියේ දින හතේම පැය 08.30 සිට පැය 16.30 දක්වා විවෘතව පවතී.

## භෞතික සම්පත් 2021

| සම්පත් | 2020 | 2021 |
|---|---|---|
| භෞතික පොත් | 50 | 54 |
| සඟරා | 14 | 14 |
| පුවත්පත් | 13 | 12 |
| ව්‍යාපෘති වාර්තා | 47 | 7 |
| එකතුව | 124 | 87 |



## පුස්තකාලය යොමු කිරීම්

| | 2020 | | 2021 | |
|---|---|---|---|---|
| මාසය | උපදේශකයින් | ශිෂ්‍යයින් | උපදේශකයින් | ශිෂ්‍යයින් |
| ජනවාරි | 24 | 25 | 11 | 08 |
| පෙබරවාරි | 24 | 26 | 38 | 01 |
| මාර්තු | 02 | 08 | 09 | 03 |
| අප්‍රේල් | L/P | L/P | 04 | 02 |
| මැයි | L/P | L/P | L/P | L/P |
| ජූනි | L/P | L/P | L/P | L/P |
| ජූලි | 49 | 08 | L/P | L/P |
| අගෝස්තු | 07 | 09 | 02 | 01 |
| සැප්තැම්බර් | 19 | 02 | L/P | L/P |
| ඔක්තෝම්බර් | 30 | 14 | 02 | 00 |
| නොවැම්බර් | 03 | 00 | 01 | 03 |
| දෙසැම්බර් | L/P | L/P | 01 | 00 |
| එකතුව | 158 | 92 | 68 | 18 |

L/P - රට වැසූ කාලය

### NIBM පුස්තකාල සංඛ්‍යා ලේඛන 2021 - පොත් බැහැරගැනීම්



## පුස්තකාල විමර්ශණ (යොමු කිරීම්)

| | 2020 | | 2021 | |
|---|---|---|---|---|
| මාසය | උපදේශකයින් | ශිෂ්‍යයින් | උපදේශකයින් | ශිෂ්‍යයින් |
| ජනවාරි | 83 | 1062 | 49 | 246 |
| පෙබරවාරි | 74 | 728 | 73 | 563 |
| මාර්තු | 39 | 381 | 72 | 813 |
| අප්‍රේල් | L/P | L/P | 37 | 855 |
| මැයි | L/P | L/P | L/P | L/P |
| ජූනි | L/P | L/P | L/P | L/P |
| ජූලි | 56 | 262 | L/P | L/P |
| අගෝස්තු | 48 | 465 | 28 | 32 |
| සැප්තැම්බර් | 29 | 221 | L/P | L/P |
| ඔක්තෝම්බර් | 25 | 90 | 48 | 134 |
| නොවැම්බර් | L/P | L/P | 68 | 606 |
| දෙසැම්බර් | L/P | L/P | 40 | 396 |
| එකතුව | **354** | 3209 | 415 | 3645 |

L/P - රට වැසූ කාලය

## පුස්තකාල විමර්ශණ - උපදේශකයින් සහ සිසුන් 2021



# ශිෂ්‍ය ක්‍රියාකාරකම් සහ සම්බන්ධතා

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය විශාල වශයෙන් අවධානය යොමු කරන්නේ ශිෂ්‍ය ජීවිතය සහ නියැලීම කෙරෙහි වන අතර එමගින් සිසුන්ට ආයතනය තුළ ඔවුන්ගේ කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථා රාශියක් ලබා දෙන අතර උපාධි අපේක්ෂකයින් දූරදර්ශී නායකයින් බිහිකිරීම, ක්ෂේත්‍රයේ දක්ෂ වෘත්තිකයන් බවට පරිවර්තනය කිරීම සිදු කරයි. වර්තමානයේ, තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවත් සමඟ, නිර්මාණශීලිත්වය, එයට අනුවර්තනය වීමේ හැකියාව, ගැටළු විසඳීම, විවේචනාත්මක චින්තනය යන අත්‍යවශ්‍ය කුසලතා ප්‍රමුඛ වන අතර තාක්ෂණයේ දියුණුවත් සමඟ යාවත්කාලීන කළ යුතු ශක්තිමත් තාක්ෂණික කුසලතා ඇති පුද්ගලයින් කෙරෙහි සේවා යෝජකයින් වර්තමානයේ අවධානය යොමු කරන බව පෙනේ. එනිසා කර්මාන්තයේ අවස්ථා අත්පත් කර ගැනීමේ වැදගත්කම මතුවේ. අපගේ උත්සාහය වන්නේ සිසුන් සක්‍රිය පාදක ඉගෙනුම් වේදිකාවකට සම්බන්ධ කර ගැනීම, උපාධි අපේක්ෂකයින්ගේ අධ්‍යයන අත්දැකීම් වැඩි දියුණු කරන අරමුණු සහිත අවස්ථා ලබා දීම සහ **සිසුන් නිරත වන ව්‍යාපෘති හරහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නියම කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක 17ක් සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් ජීවිතයේ මූලික වටිනාකම් විදහා දක්වන පරිසරයක් තුල පුද්ගලික වර්ධනය සහ පෝෂණය කිරීමයි.**

එහි ප්‍රතිඵලයක් වශයෙන්, NIBM ශිෂ්‍ය ක්‍රියාකාරකම් සහ නියැලීම ඇතුළුව විවිධ වැඩසටහන් සමඟ සම්බන්ධ වීම ඇතුළුව NIBM සියලුම ශාඛාවල / පීඨවල සියලුම උපාධි අපේක්ෂකයින් සඳහා NIBM, Critical Enabling Skills & Training වැඩසටහන හඳුන්වා දෙනු ලැබේ. සාර්ථක වෘත්තිකයෙකු වීමේ ක්‍රියාවලිය වඩාත්ම දුෂ්කර නමුත් තීරණාත්මක එකක් ලෙස පෙනුනද පුද්ගලයෙකුගේ සිට නායකයෙකු දක්වා වෙනස් වීමට පහසුකම් සැලසීම මෙමගින් සිදු වේ.




## NIBM, Critical Enabling Skills & Training (CREST)

සිසුන් ඔවුන්ගේ වැදගත්ම කාර්යභාරය අධ්‍යයන කටයුතු වල නියලීම කාර්යසාධනය ලෙස පිළිගනු ලැබේ. කෙසේ වෙතත්, කර්මාන්තයේ නායකත්වය ගන්නා සැබෑ වෘත්තිකයෙකු වීමට කෙනෙකුගේ නායකත්වය, සන්නිවේදන කුසලතා සහ කණ්ඩායම් කාර්යසාධනය මෙහෙයවීමේ හැකියාව පිළිබඳ ගැඹුරු අවබෝධයක් අවශ්‍ය වන අතර, ඒ සඳහා ඔවුන්ව කුසලතා, තීක්ෂ්ණ බුද්ධිය සහ තාක්ෂණය මෙහෙයවීම අවශ්‍ය වේ. NIBM, Critical Enabling Skills & Training හි මෙම අද්විතීය අධ්‍යයන වැඩස-ටහන සැලසුම් කර ඇත්තේ උපාධි අපේක්ෂකයින්ට ඔවුන්ගේ පුද්ගලික නායකත්ව ශෛලීන් වැඩිදියුණු කිරීමට, චිත්තවේගීය බුද්ධිය, වෘත්තීය සැලසුම් සහ සංවර්ධනය ලගා කිරීමට සහ අනෙක් අය තුළ හොඳම දේ ගෙන ඒමට හැකි වන කුසලතා අත්කර ගැනීමට ය. ඵලදායී සන්නිවේදනය, ගැටුම් නිරාකරණය, කණ්ඩායම් ගොඩනැගීම, විවිධත්ව කළමණාකරණය වැනි නායකත්ව කුසලතා ඇතිකර ගැනීමෙන්ද ඔවුන් ප්‍රතිලාභ ලබනු ඇත. අත්දැකීම් සහිත ඉගෙනීම, වැඩිහිටි අධ්‍යාපනය, ක්‍රියාකාරී අධ්‍යාපනය, සම වයසේ අධ්‍යාපනය, පරාවර්තනය, පුහුණුවීම් සහ යෙදුම වැඩසටහන් සැලසුම තුළ ගොඩනැගීම තුළින් ශක්-තිමත් කර ඇති අතර විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් අත්දැකීම් ලබා ගතහැකිය.

විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, කලා සහ ගණිතය (STEAM) ඉගෙනීමේ අනාගතය ආවරණය කරන බව අප සැබවින්ම විශ්වාස කරන බැවින් ආරම්භක පරිසර පද්ධතියක ව්‍යවසායකත්ව අවස්ථා වෙත පිවිසීමට NIBM හි සිසුන් දිරිමත් කරනු ලැබේ. මේ අනුව, NIBM විසින් අන්තර් විෂය ක්ෂේත්‍රවල විවිධ දක්ෂතා ඇති පුද්ගලයින් නිර්මාණය කරයි. මෙහිදී, NIBM විසින් සිසුන්ට CREST වැඩසටහන හරහා සමාජ නවෝත්පාදන ආරම්භක කඳවුරක් සහ ව්‍යවසායකත්ව පුහුණුවක් සඳහා එක්සත් ජාතීන්ගේ UNDP කණ්ඩායම සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට අවස්ථාව ලබා දී ඇත. තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතිය වෙනුවෙන් දැඩි ආශාවකින් කටයුතු කරන ශ්‍රී ලංකාව. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමඟ ඇති මෙම වැදගත් හවුල්කාරිත්වය අපගේ උපාධි අපේක්ෂකයින්ගේ රැකියා අපේක්ෂකයින් බවට පත්වීමට වඩා රැකියා උත්පාදකයින් බවට පත්වීමේ අභිප්‍රේරණය ඉහළ නැංවීමට හැකි වී තිබේ.

## CREST පර්යේෂණ සහ නවෝත්පාදන මධ්‍යස්ථානය

CREST වැඩසටහන, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ සහයෝගීතාවය මත නවෝත්පාදන මධ්‍යස්ථානයක් පිහිටවීමට අපේක්ෂා කරයි. අප වැඩසටහනේ නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදන මොඩියුල පිළිබඳව පුළුල් පුහුණුවක් ලබා දෙන අතර එහිදී සිසුන් සැබෑ තිරසාර සංවර්ධන ඉලක්කයන් පිළිබඳව සත්‍ය ලෙස ජාතික ගැටළුව පර්යේෂණ කරයි. හෙිදී CREST වැඩසටහන සාර්තකව නිම කිරීමෙන් පසුව නවෝත්පාදන තරග වලදී තෝරාගත් ශිෂ්‍ය කණ්ඩායම් වලට ව්‍යවසායකත්වය ඇතිකිරීම සඳහා UNDP විසින් සංවිධානය කරන ලද සමාජ නවෝත්පාදන ඇරඹුම් කඳවුරකට සහභාගී වීමට අද්විතීය අවස්ථාව ලැබේ. එහිදී අපි අනාගතයේදී සිසුන් ආයෝජකයින් සමඟ සම්බන්ද කිරීමට බලාපොරත්තු වන අතර එතුළින් සිසුන් ඔවුන්ගේ ව්‍යවසායකත්වය තුළින් ඉදිරි ගමන් මාර්ගය සකස් කරගැනීමේ හැකියාව ලැබේ.

## UNDP වාර්ෂික ශිෂ්‍ය ක්‍රියාකාරකම් වල සහයෝගීතාවය

මෙම සුවිශේෂී හවුල්කාරිත්වය NIBM සිසුන්ට පහත සඳහන් වාර්ෂික UNDP ක්‍රියාකාරකම් වල නිරත වීමට අවස්ථාව ලබා දී ඇත.

- HackaDev ජාතික යොවුන් සමාජ නවෝත්පාදන අභියෝගය
- HackaDev ඉගෙනුම් හා කුසලතා මධ්‍යස්ථානය
- HackaDev ව්‍යවසාය සංවර්ධන වැඩසටහන (HESP)
- සීමාවක් නොමැති ගෝලීය තරුණ අභියෝග පරපුර
- Youth CO Lab - සමාජ නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය පිළිබඳ UNDP ආසියා පැසිෆික් වේදිකාව
- ජාතික තරුණ සංවාද සතිය, 2021
- HackaDev නවෝත්පාදන අභියෝග වේදිකාව

## වෘත්තීය මාර්ගෝපදේශනය සහ පුහුණු කිරීම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සමාගම් 25කට ආරාධනා කර "Career Expo" නමින් වෘත්තීය ප්‍රදර්ශනයක් ඇතුළුව උපාධි අපේක්ෂකයින් සඳහා පවත්වනු ලබන විවිධ වැඩසටහන් සමඟින් සියලුම පීඨ සිසුන්ට වෘත්තීය මාර්ගෝපදේශනය, උපදේශනය සහ පුහුණු කිරීම සඳහා පවත්වනු ලැබේ. පරිගණක විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව, ව්‍යාපාර, භාෂා සහ සැලසුම් යන විවිධ විෂයයන් මත ආයතනික නායකයින් සිසුන් සමඟ ඔවුන්ගේ වෘත්තීය සැලැස්ම සාකච්ඡා කිරීමට සහ පවතින රැකියා සඳහා අයදුම් කිරීමට සැසි 1-1 ක් පවත්වනු ලැබේ. මීට අමතරව, වසර 53 කට වැඩි උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස විවිධ ක්ෂේත්‍රවල ඉහළ නායකත්ව තනතුරු දරන ආදි ශිෂ්‍යයින් සිටින ප්‍රෞඩ ඉතිහාසයක් ඇති අපගේ සිසුන් ඔවුන්ගේ දැනුම, අත්දැකීම් සහ ප්‍රවීණත්වය බෙදා ගන්නා අවස්ථාවන්හිදී ඔවුන්ගේ සාර්ථක ගමන් මගේ කතාව බෙදාහදා ගැනීමට සම්බන්ධ වේ. NIBM ආයතනයෙන් ලැබුණු අධ්‍යාපනය සහ ඔවුන්ගේ ජීවිත හැඩ ගස්වා ගැනීමට ඔවුන් පහසුකම් ලබා ගත් ආකාරය සමඟින් ඔවුන් ඉහළම තලයට පැමිණියහ. ආයතනයේ පවතින පුළුල් පරාසයක සේවා සහ වැඩසටහන් උපාධි අපේක්ෂකයින්ට වෘත්තීය සම්පත් සමඟ සහාය දක්වා ඇත. සෑම විටම රැකියා ඉල්ලුම්පත්‍ර පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සහ සිසුන්ගේ රැකියා ලබාගැනීම් අනුපාතය 95% ක් වැනි සාර්ථකත්වයක් ලබා ගැනීමට අප උපකාර වී ඇත

## NIBM Gavel Club

සන්නිවේදන කලාව නායකත්වයේ භාෂාවයි. එබැවින්, විවිධ වාර්ෂික තරඟ ඇතුළුව ජාත්‍යන්තර Gavel & Toastmasters සම්මන්ත්‍රණ සහ ඉසව්වල නියැලෙන සිසුන්ට වඩා හොඳ සන්නිවේදකයින් සහ නායකයින් වීමට සිසුන්ගේ වර්ධනයට උපකාර වන ඔවුන්ගේ ප්‍රසිද්ධ කථන සහ නායකත්ව සංවර්ධන කුසලතා වර්ධනය කිරීම සඳහා සිසුන් සඳහා Gavel Club පිහිටුවීම අපි ආරම්භ කළෙමු. වසරේ NIBM කථන පුද්ගලයා, NIBM පාසලේ හොඳම කථිකයා යනාදිය ලෙස වාර්ෂිකව සංවිධානය කරනු ලබන සිසුන්ගේ ගෝලීය Gavel තරඟ, රැස්වීම් සහ සම්මන්ත්‍රණ හරහා සංස්කෘතික විවිධත්වය අත්විඳීමටත් Global Gavel Clubs සමඟ අන්තර් ක්‍රියා කිරීමටත් අද්විතීය අවස්ථාවන් මෙතුළින් ලබාදී ඇත.

## NIBM රොටරැක්ට් සංගමය

රොටරැක්ට් සංගමය (Rotaract Club) විවිධ පීඨවල ඉගෙනුම ලබන තරුණ වෘත්තිකයින් ප්‍රජාවේ නායකයින් සමඟ අදහස් හුවමාරු කර ගැනීමට, ඔවුන්ගේ නායකත්වය සහ වෘත්තීය කුසලතා වර්ධනය කිරීමට සහ සංගමය තුල ක්‍රියාකාරකම් සිදුකිරීම තුළින් සැබෑ සතුට අත්විඳීමට හැකියාව ලැබේ. මෙහිදී සිසුන් සාකච්ඡා වල නියැලීමෙන් සහ ව්‍යාපෘති හරහා ලෝකයේ වඩාත්ම දැවෙන අභියෝග සඳහා විසඳුම් සෙවීමෙහි නිරත වේ. තරුණ නායකයින් ගෝලීය ව්‍යාපාරයක කොටසක් ලෙස ප්‍රජා සේවය, සමාජ සේවා, වෘත්තීය සංවර්ධනය, ජාත්‍යන්තර සේවා සහ පාරිසරික සේවය ආදී ආකාරයට කටයුතු කරමින් ඔවුන් සම්බන්ධ වේ. ශිෂ්‍ය ප්‍රජාව විසින් එක් එක් රොටරැක්ටර් (Rotaractor) හි පුද්ගලික සහ වෘත්තීය සංවර්ධනය සඳහා අවස්ථා සපයන සමබර වැඩසටහනක් බව තහවුරු කර ඇත.

## AISEC NIBM ශිෂ්‍ය කණ්ඩායම

මෙම කණ්ඩායම තුළින් උපාධි අපේක්ෂකයින්ට ජාත්‍යන්තර සීමාවාසික සහ ස්වේච්ඡා අවස්ථා හරහා ඔවුන්ගේ නායකත්වය සහ හැකියාවන් වර්ධනය කර ගැනීමට ගෝලීය වේදිකාවක් නිර්මාණය කරයි. මෙහිදී, සිසුන් විවිධ පරිසරයක සන්නිවේදන කලාව ප්‍රගුණ කිරීමෙන් සවිබල ගැන්වීමට ඉගෙන ගැනීම, අභියෝග ජය ගැනීමට අනුවර්තනය වන විසඳුම් සොයන්නෙකු වීමට පුද්ගලයාගේ කුසලතා පරීක්ෂා කරන විසඳුම්-නැඹුරු වැඩ සංස්කෘතියක නිරත වීමට උපකාරී වීම ආදිය අවස්ථාවන් ලැබේ. සිසුන් ගෝලීය ගැටළු පිළිබඳව දැනුවත් කිරීමට සම්බන්ධ ව්‍යාපෘතිවල පුරවැසියකු ලෙස විශිෂ්ටත්වය සඳහා උත්සාහ කිරීම, අඛණ්ඩතාව විදහා දැක්වීම, නායකත්වය සක්‍රීය කිරීම, තිරසාර ලෙස ක්‍රියා කිරීම, සහභාගීත්වය භුක්ති විඳීම සහ ජීවන විවිධත්වයහි ධනාත්මක බලපෑමක් ඇති කරන නායකයින් බවට පත් කිරීම යන මූලික සාරධර්ම වලට අනුකූලව කටයුතු කරයි.

## NIBM LEO Club

මෙම සමාජය සමාජ සේවා කටයුතුවලට සහභාගි වෙමින් තරුණ තරුණියන්ගේ නායකත්ව ගුණාංග වර්ධනය කිරීමට දිරිගන්වන ජාත්‍යන්තර සිංහ සමාජවල තරුණ සංවිධානයකි. මෙම ශිෂ්‍ය ප්‍රජාවහි ක්‍රියාකාරීත්වයේ බලය අවබෝධ කරගත් තරුණ සිසුන් වෙනුවෙන් කැපවී සිටී. එමනිසා, සිංහ සාමාජිකයකු වීම යනු වඩා ඉහල සේවයක් බවට පත්වීමයි. සිසුන් ලෝකය වඩා හොඳ තැනක් බවට පත් කරමින් ගෝලීය තරුණ පවුලකට සම්බන්ධ වන විට නායකයෙකු ලෙස පෞද්ගලිකව වර්ධනය වීමට උපකාරී වේ.

## NIBM ක්‍රීඩා සංගමය

NIBM ක්‍රීඩා සංගමය ක්‍රීඩා සමාජ 10 කින් සමන්විත වන අතර සිසුන්ට පරිපූර්ණ මිනිසකු බවට පත්වීම සඳහා විවිධ ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩා සංවිධානය කරනු ලබයි. ආයතනයේ හි පිරිනමනු ලබන විවිධ ක්‍රීඩා අතර මලල ක්‍රීඩා, බැඩ්මින්ටන්, පැසිපන්දු, චෙස්, ක්‍රිකට්, පාපන්දු, නෙට්බෝල්, රග්බි, වොලිබෝල් සහ පිහිනුම් අවස්ථා ඇතුළත් වන අතර එහිදී සිසුන් වෙනත් ජාතික මට්ටමේ තරඟ ඇතුළු විවිධ අන්තර් සහ අභ්‍යන්තර විශ්ව විද්‍යාල ශූරතා සඳහා සහභාගී වේ. NIBM ශිෂ්‍ය ක්‍රීඩා ප්‍රජාව අතරින් දකුණු ආසියානු ක්‍රීඩා ශූරයන් බිහි කිරීමට ලැබීම ගැන අපි ආඩම්බර වෙමු. Covid පැතිරීම හේතුවෙන්, සිසුන් ක්‍රීඩා සංසදයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධ කර ගැනීම සඳහා සිසුන් මාර්ගගත ක්‍රීඩා තරඟාවලි මාලාවක් ආරම්භ පවත්වන ලදි.

## NIBM Model United Nations Chapter

අපගේ ශිෂ්‍ය ප්‍රජාවෙන් සමන්විත මෙම කණ්ඩායම මෑතකදී NIBM හි පිහිටුවන ලද අතර එය එක්සත් ජාතීන්ගේ අධ්‍යයන අනුකරණයක් හරහා සිසුන්ගේ නායකත්ව වර්ධනය පෝෂණය කිරීම සිදු කෙරේ. එහිදී සිසුන්ට විවිධ ප්‍රාන්තවල නියෝජිතයින්ගේ භූමිකාවන් ඉටු කිරීමට අවස්ථාව සහ පුහුණුව ලබා දෙන අතර ලෝකයේ පවතින සත්‍ය ගැටළු විසඳීමට උත්සාහ කරයි. රාජ්‍ය තාන්ත්‍රිකභාවය, ජාත්‍යන්තර සබඳතා සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය පිළිබඳ දැනුම සහ අත්දැකීම් ලබා ගන්නා සිසුන් දේශීයව සහ ජාත්‍යන්තරව MUN සම්මන්ත්‍රණවලදී ඔවුන්ට පවරා ඇති රටේ ප්‍රතිපත්ති සහ ඉදිරි දර්ශන සාකච්ඡා කරයි. මෙම ඉගෙනුම් ක්‍රියාවලිය විවේචනාත්මක චින්තනය, කණ්ඩායම් වැඩ සහ නායකත්වයට අමතරව පර්යේෂණ, කථන, විවාද සහ ලිවීමේ කුසලතා ආදිය උගන්වයි.

## NIBM IEEE ශිෂ්‍ය කණ්ඩායම

IEEE ශිෂ්‍ය කණ්ඩායම මානව වර්ගයා සඳහා තාක්ෂණය දියුණු කිරීමේ දැක්ම ඇතිව පරිගණක විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව හදාරන සිසුන් සමඟ එහි පිහිටුවීමේ අවසන් අදියරේ පවතී, IEEE සහ එහි සාමාජිකයින් විසින් උසස් උපුටා දක්වන ලද ප්‍රකාශන, සම්මන්ත්‍රණ, තාක්ෂණ ප්‍රමිතීන් සහ වෘත්තීය සහ අධ්‍යාපනික ක්‍රියාකාරකම් හරහා ගෝලීය ප්‍රජාව දිරිමත් කරවීම ගෝලීය මට්ටමින් සිදුකරන ලදී. ලොව විශාලතම තාක්ෂණික වෘත්තීය සංවිධානයේ ශිෂ්‍ය සාමාජිකයෙකු වන අපගේ සිසුන්ට වඩා හොඳ හෙටක් සඳහා නවෝත්පාදනයන් ගෙනයාම සඳහා ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණ සහ Hackathons සහ Ideathon වැනි ඉසව් වලට සහභාගී වීමේ වරප්‍රසාදය මෙමඟින් ලැබේ.

## NIBM වාර්ෂික ශිෂ්‍ය ක්‍රියාකාරකම්

මීට අමතරව, සියලුම පීඨවල සිසුන් ඔවුන්ගේ කුසලතා වර්ධනය කර ගැනීමට සම්බන්ධ කර ගැනීමේ මූලික අභිප්‍රේරණය සමඟින් කර්මාන්තයේ වෘත්තිකයන් බවට පත්වීමටත්, සිසුන්ට විවිධාංගීකරණය වූ විෂයයන් තුළින් ඔවුන්ගේ දක්ෂතා ප්‍රදර්ශනය කිරීමටත් අවස්ථාව ලබාදීමේ අරමුණින් අපි තරඟ, උත්සව සහ විවිධ සැමරුම් නිරන්තරයෙන් සංවිධානය කරන්-නෙමු. මෙහිදී, වාර්ෂික ක්‍රියාකාරකම් වලට වෘත්තීය ප්‍රදර්ශන, ආදි ශිෂ්‍ය වෘත්තීය උපදේශන කථිකාවක්, කෝණ මංගල්‍යය, වෙසක් සහ පොසොන් සැමරුම්, ශාස්ත්‍රීය කුසලතා ප්‍රදර්ශනය, රාමසාන් සහ දීපවාලි සැමරුම්, වාර්ෂික ක්‍රීඩා හමුව, NIBM පාගමන, පීඨ ශිෂ්‍ය පර්යේෂණ සම්මන්ත්‍රණය, NIBM විවෘත දිනය, නත්තල් සැමරුම්, NIBM විවෘත දිනය ආදිය ඇතුළත් වේ. NSEC(NIBM ශිෂ්‍ය ඉසව් කමිටුව) සියලුම පීඨ සහ ශාඛාවල සහභාගීත්වයෙන් ක්‍රියාකාරකම් මෙහෙයවීම සිදුකරනු ලැබේ.

## විශ්වවිද්‍යාල හවුල්කාරිත්වයන්

ඩීකින් විශ්ව විද්‍යාලය - ඕස්ට්‍රේලියාව

ඕස්ට්‍රේලියාවේ ප්‍රමුඛ පෙළේ තෘතීයික අධ්‍යාපන සැපයුම්කරුවෙකු ලෙස වසර 45 කට වැඩි පළපුරුද්දක් ඇති ඩීකින් විශ්ව විද්‍යාලය සම්මාන රාශියක් දිනාගෙන ඇති අතර සෑම වසරකම සිසුන් 60,000 කට වඩා අධ්‍යාපන ලබයි. ඩීකින් අපගේ සිසුන්ට ජාත්‍යන්තර මට්ටමේ වැඩසටහන් සහ අසීමිත අවස්ථා ලබා දෙයි. ඩීකින්හිදී, අපි ප්‍රගතිශීලීව ඉගැන්වීම් සහ නව්‍ය පර්යේෂණ තුළින් අධ්‍යාපනය ඉදිරියට ගෙන යන්නෙමු. අධ්‍යාපනයේ සහ පර්යේෂණවල නවෝත්පාදන සහ විශිෂ්ටත්වය තුළින්, ඩීකින් සමාජ, සංස්කෘතික, ආර්ථික සහ පාරිසරික යහපැවැත්ම වැඩි දියුණු කරන අදහස් ජනනය කරයි. ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්ව විද්‍යාලය, ලෝකයේ හොඳම තරුණ විශ්ව විද්‍යාල 50 අතරට ශ්‍රේණිගත කර ඇති අතර ඕස්ට්‍රේලියානු වික්ටෝරියා ප්‍රාන්තයේ අංක එකේ විශ්ව විද්‍යාලය ලෙස ශ්‍රේණිගත කර ඇත. නවීන සහ දූරදර්ශී, දේශීය හා ගෝලීය වශයෙන් නව මංපෙත් විවර කිරීම සඳහා ඩීකින් විශ්වවිද්‍යාලයට කීර්තියක් ඇත. ඇත්ත වශයෙන්ම, අප වැඩි වැඩියෙන් ඩිජිටල් අනාගතයක් කරා ගමන් කරන විට, අපගේ සිසුන් හෙට දවසේ රැකියා සඳහා අවශ්‍ය කුසලතා සහ දැනුමෙන් සන්නද්ධ වන බව සහතික කිරීම සඳහා නවීන තාක්ෂණය, අති නවීන ඉගෙනුම් මෙවලම් සහ පහසුකම් සඳහා ඩීකින් විශ්ව විද්‍යාලය සකස් කර ඇත. විශිෂ්ට විශ්වවිද්‍යාල පහක් සහ නම්‍යශීලී අධ්‍යයන විකල්පයන් හරහා පිරිනැමෙන පාඨමාලා සිය ගණනක් සමඟින්, අනාගතය සඳහා ඔබේ ඉලක්ක හඹායන අතරතුර ඔබේ ජීවන රටාවට ගැලපෙන උපාධියක් තෝරා ගත හැකිය. NIBM පරිගණක සහ ඉංජිනේරු පාසල, මෙම 2021 වසරේ පෙබරවාරි 19 වන දින ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්ව විද්‍යාලය සමඟ හවුල් වී තොරතුරු තාක්ෂණ උපාධිය, මෘදුකාංග ඉංජිනේරු උපාධිය (ගෞරව) සහ ව්‍යාපාර විශ්ලේෂණ උපාධිය පිළිබඳ උපාධි වැඩසටහන් පිරිනැමීමට කටයුතු ආරම්භ කළේය.

ග්‍රිෆිත් විශ්ව විද්‍යාලය - ඕස්ට්‍රේලියාව

## 2021 විශ්ව විද්‍යාල හවුල්කාරිත්වය පිළිබඳ අඛණ්ඩ සාකච්ඡා

අපි පහත සඳහන් විශ්ව විද්‍යාල සමඟ දැනට සාකච්ඡා කරමින් සිටින්නේ මූලික වශයෙන් විවිධ ක්ෂේත්‍රවල විශේෂිත අංශ ඉංජිනේරු, සැලසුම්, ව්‍යාපාර සහ නීති පිළිබඳව, NIBM හි අදාළ පීඨ සමඟ සම්බන්ධීකරණය කිරීමටය.

- Queensland තාක්ෂණික විශ්වවිද්‍යාලය - ඕස්ට්‍රේලියාව
- Queensland විශ්ව විද්‍යාලය (බ්‍රිස්බේන්) - ඕස්ට්‍රේලියාව
- Chulalongkorn විශ්වවිද්‍යාලය - තායිලන්තය

## ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් සවිබල ගැන්වීමේ ජාතික මුලපිරීම

### 1. NIBM සමඟ දවස ගතකිරීම

NIBM මෙම වසරේ "NIBM සමඟ දවස ගත කරන්න" නමින් නව සේවාව ආරම්භ කරන ලද අතර එය අඩු වරප්‍රසාද ලත් දරුවන් සහ ඔවුන්ගේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරන ජාතික මුලපිරීමක් වන අතර එමගින් ඔවුන්ගේ මුහුණේ සිනහවක් ඇති කිරීමට අපි බොහෝ ආකාරවලින් ජීවිතයට නායකත්වය දීමට ඔවුන්ට සහාය වීම ආදිය සිදුකෙරේ. සැබෑ සතුට යනු ඔබ සතු දේ සතුට සොයන අය සමඟ බෙදා ගැනීමයි. මේ හේතුව නිසා, NIBM හට අවශ්‍ය වන්නේ මිනිසුන්ගේ එදිනෙදා ජීවිතයේ යථාර්ථයන් අත්විඳීමට - සතුට ලැබිය යුතු නමුත් ජීවිතයේ සැබෑ සතුට ළඟා කර ගැනීමට අරගල කිරීම සහ අවශ්‍යතා ඇති අයට උපකාර කිරීමට අවස්ථාවක් ලබා දීමයි. එබැවින් "NIBM සමඟ දවස ගත කරන්න" යනු අපගේ සිසුන්ට මිනිසුන්ගේ සැබෑ ජීවිත අත්දැකීම් ලබා දෙන නව ව්‍යාපෘතියකි, එහිදී සිසුන් විසින්ම තෝරාගත් පවුලක් සමඟ ඔවුන්ගේ සිතුවිලි, හැඟීම් සහ කරුණාව බෙදා ගැනීමට ඔවුන් දිරිමත් කරනු ඇත.

අපි මෙම ව්‍යාපෘතිය SDGs සමඟ සම්බන්ධ කිරීමෙන්, දැනුම සහ ප්‍රවීණත්වය බෙදා ගැනීම සහ වරප්‍රසාද ලත් ළමුන්ගේ පැවැත්මට, සමෘද්ධිමත් වීමට සහ ඔවුන්ගේ හැකියාවන් නව යොවුන් වියේදීම සපුරාලීමට, ළමා සෞඛ්‍යය, පෝෂණය, අධ්‍යාප-නය, යන ක්ෂේත්‍රවල ආධාරකයක් වීමට සැලසුම් කර එක් පියවරක් ඉදිරියෙන් සිටින්නේ අපගේ ජාතියේ තරුණ තරුණියන්ගේ ජීවිත වැඩි දියුණු කිරීමේ මෙහෙවර සමඟින් වාර්ෂික UN ව්‍යාපෘතියක් සමඟ NIBM ව්‍යාපෘතිය සමඟ දවස ගත කරන අතරම කුසලතා ගොඩනැගීම සහ ආරක්ෂාව ශ්‍රී ලංකාවේ විවිධ පළාත් සමඟ සම්බන්ධ වී ව්‍යාපෘතිය පුළුල් කිරීම සඳහා තාක්ෂණික සහ මූල්‍ය සහාය ලබා ගැනීම එ.ජා.සංවිධාන වැනි සංවිධානවලින් අපේක්ෂා කෙරේ.

### 2. ප්‍රධාන විධායක නිලධාරී ග්ලෝබල් (The CEO Global) - ව්‍යාපාර ආකෘති පරිවර්තනය කිරීම

52 වැඩි වසරක විශිෂ්ටත්වය සමරන ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනය මේ වසරේ "The CEO Global - Transforming" නමින් වාර්ෂික සඟරාවක් නිකුත් කරමින් වර්ධනය වන කර්මාන්තවලට සහය වෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වයට පා තබන තරුණ තරුණියන් සවිබල ගැන්වීම සඳහා නව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට තීරණය කළේය. ගෝලීය සන්නාමයක් වර්ධනය කිරීම සඳහා විශිෂ්ට ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක වූ ව්‍යාපාර ආකෘතීන්, උපායමාර්ග සහ අදහස් පිළිබඳ තීරණාත්මක තොරතුරු බෙදා හදා ගනිමින්, ඔවුන්ගේ සාර්ථකත්වයේ රහස් ඉස්මතු කරමින්, වඩාත් සාර්ථක ප්‍රධාන විධායක නිලධාරීන්ගේ තීක්ෂණ බුද්ධිය සහ ආශ්වාදය බෙදා ගැනීමට මෙතුළින් අපි බලාපොරොත්තු වේ.

### NIBM මියන්මාර ශාඛාව පිහිටවීම

යන්ගුන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා මියන්මාර ආයෝජන කොමිෂන් සභාව (MIC) වෙත ලැබුණු ආරාධනයට අනුව, NIBM මියන්මාරයේ ශාඛාවක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන අතර සිදුවෙමින් පවතින තාක්ෂණික දියුණුවට ගැලපෙන පරිදි ඉහළ නිපුණතා සහිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමට සිය රජයේ උත්සාහයට මේ හරහා දායක වේ. ගෝලීය වශයෙන් දැනටමත් රට තුළ සිය ආධිපත්‍යය පතුරුවා හැරීමෙන්, NIBM හට මියන්මාරය වැනි අග්නිදිග ආසියාතික රටක ව්‍යාප්ත කිරීමට සහ අවශ්‍යතා ඇති ලොව පුරා සිටින සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමට මෙය අවස්ථාවක් වනු ඇත. පරිගණක, ඉංජිනේරු, මානව ශාස්ත්‍ර සහ සැලසුම් යන ක්ෂේත්‍රවල කර්මාන්තයේ ඉහළ ඉල්ලුමක් පවතින පශ්චාත් උපාධි/ උපාධි වැඩසටහන්වල සිට සහතිකපත්‍ර දක්වා වැඩසටහන් 17ක් පැවැත්වීමට NIBM ආයතනය යෝජනා කර ඇත. අපි ප්‍රධාන වශයෙන් පීඨ/කාර්ය මණ්ඩල පුහුණුව, පාඨමාලා උපංග සංවර්ධනය සහ අන්තර්ගත බෙදාහැරීම වැනි ක්ෂේත්‍ර සඳහා ආ-යෝජනය කිරීමට මෙතුලින් බලාපොරොත්තු වෙමු.

## 2021: නව දියුණු කිරීම් - සැළසුම්කරන ලද සහ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති

• UNDP හවුල්කාරිත්වය සමඟින් CREST වැඩසටහන පැවැත්වීම

• වාර්ෂික UNDP වැඩසටහන් සඳහා සහයෝගීතාව දැක්වීම

• ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ප්‍රවේශය සහ හවුල්කාරිත්වය ඇතිකිරීම - ඩීකින් විශ්ව විද්‍යාලය සහ ග්‍රිෆිත් විශ්ව විද්‍යාලය සමග හවුල් ගිවිසුම් ඇතිකරන ලදි, සහයෝගීතාවය සඳහා සාකච්ඡා කරමින් පවතින අනෙකුත් විශ්ව විද්‍යාල වන්නේ ඕස්ට්‍රේලියාවහි Queensland තාක්ෂණ විශ්ව විද්‍යාලය, ඕස්ට්‍රේලියාවේ බ්‍රිස්බේන් විශ්ව විද්‍යාලය, තායිලන්තයේ Chulalongkorn විශ්ව විද්‍යාලය ආදිය වේ.

• NIBM - මියන්මාර හවුල්කාරිත්වය සම්බන්ධයෙන් දැනට සාකච්ඡා කරමින් පවතී.

• විවිධ සමිගම් සහ සමිතිවල වාර්ෂික ක්‍රියාකාරකම් සිදුකිරීම

• නායකත්ව සංවර්ධනය සහ ජාත්‍යන්තර ප්‍රවේශය ප්‍රවර්ධනය වන නව සංගම් සහ සමිති පිහිටුවීම

• ආයතනයේ සාමාන්‍යයෙන් වාර්ෂික සිදුකරනු ලබන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සිදු කිරීම.

• ප්‍රධාන විධායක නිලධාරී ග්ලෝබල් සඟරාව - ජාතික මුලපිරීම මෙම වසරදී ආරම්භ කරන ලදි.

**නායකත්වය සහ නිපුණතා සංවර්ධනය - Gavel Club (2021)**

1. සවිබල ගැන්වීමට කතා කරන්න - සම්මන්ත්‍රණය (පිවිසුම; ශ්‍රී ලංකාවේ සියලුම Gavel Clubs)
2. සෑම මාර්ගගත රැස්වීමකදීම වෘත්තීය පුහුණුකරුවන් විසින් මහජන කථන සහ නායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම
3. ජාත්‍යන්තර Toastmasters ඉසව්වලට සහභාගී වන Gavel සාමාජිකයින් (සමාජය/ අංශය/ දිස්ත්‍රික් සම්මන්ත්‍රණ මාර්ගගත ලෙස සිදු කරයි)
4. Toastmasters තරග සඳහා සහභාගී වන Gavel සාමාජිකයින් (සමාජය/ අංශය/ දිස්ත්‍රික් තරග මාර්ගගතව)
5. NIBM කථන පිළිමය 2021
6. ආශ්වාදයේ වචන - පෞරුෂ සම්මුඛ පරීක්ෂණ වැඩසටහන - Facebook හි සජීවී ලෙස
7. වෙනත් සමාජ ශාලා සමඟ මාර්ගගත අධ්‍යාපනික රැස්වීම් / ඒකාබද්ධ රැස්වීම් පැවැත්වීම
8. ජාත්‍යන්තර Gavel රැස්වීම් සහ තරග මාර්ගගතව
9. My Gavel Life - NIBM Gavel Club හි සිසුන්ගේ සම්මුඛ සාකච්ඡාව
10. පවර් ඔෆ් ඩ්‍රීම්ස් - ක්ෂේත්‍රයේ සාර්ථක පුද්ගලයින් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම සඳහා මුහුණු පොතහි සජීවීව ප්‍රකාශ කිරීම/සංදර්ශනය
11. Le Real Life Talks - Online Podcast
12. ජාත්‍යන්තර Gavel Club තරග
13. ජාත්‍යන්තර Gavel Club ඒකාබද්ධ රැස්වීම්

**Rotaract Club හි ක්‍රියාකාරකම්**

1. නුවණ - පොත් පරිත්‍යාග ප්‍රජා සේවය
2. නත්තල් කාඩ් නිර්මාණ තරගය - මහජන සම්බන්ධතා උත්සවය
3. ජිංගල් වයිම්ස් - ක්ලබ් සර්විස් - ඔන්ලයින් නත්තල් ක්‍රීඩා
4. දිස්ත්‍රික් සභා රැස්වීම - Excom සහභාගීත්වය - සමාජ සේවා
5. බේක් සේල් - අරමුදල් රැස් කිරීම
6. කුඩා පියවර - ප්‍රජා සේවය (සියදිවි නසාගැනීම් වැළැක්වීම / ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීම)
7. තරුණ හදවත් සඳහා අත්වැල් බැඳගැනීම - ජාත්‍යන්තර සේවය (නේපාල සමාජය _ ළමා නිවාසය)
8. වීරයන් - වෘත්තීය සංවර්ධනය
9. රොටරි ජීවිතය - දැනුවත් කිරීමේ සැසිය (රොටරි වලින් ඔබට ප්‍රයෝජන ගත හැකි ආකාරය)
10. රාත්‍රිය පුරාම - අතථ්‍ය චිත්‍රපට රාත්‍රිය
11. The Lense හරහා - ආධුනිකයන්ගේ ඡායාරූප කුසලතා අගය කිරීමේ ව්‍යාපෘතිය.
12. නව සාමාන්‍ය - රොටරැක්ටර් සහ නව පරම්පරාව පශ්චාත් කොවිඩ් ලෝකයට අනුවර්තනය වී වර්ධනය විය හැකි ආකාරය
13. නවක වදය නවත්වන්න - නවක වදය සහ එය බලපාන ආකාරය පිළිබඳ දැනුවත් කිරීම
14. ඇය ඉතිරි කරයි - කාන්තාවන්ට මූල්‍යමය වශයෙන් ස්වාධීන විය හැකි ආකාරය
15. හරිත වර්ණ - තිරසාරත්වය සහ පරිසර දූෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ තරඟකාරිත්වය.
16. Fight Back - ගැහැණු පිරිමි දෙපාර්ශවයටම ආත්මාරක්ෂාව ඉගෙනීම
17. නොවැම්බර් මාසය සඳහා දිස්ත්‍රික් සභා රැස්වීම
18. 3 න් වන සංගමය පිහිටුවීම

**AISEC ශිෂ්‍ය කණ්ඩායමෙහි ක්‍රියාකාරකම්**

1. අප්‍රේල් - සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උත්සවය
2. මැයි - OGX ප්‍රවර්ධන වැඩසටහන
3. ජූනි - තීක්ෂ්ණ බුද්ධිය
4. ජූනි - අන්තර් ක්‍රියාකාරී සැසිය UN SDGs
5. ජූලි - ප්‍රසිද්ධ කථා සහ නායකත්ව සංවර්ධන උත්සවය
6. ඔක්තෝබර් - නායකත්ව සංවර්ධන සම්මන්ත්‍රණය
7. නොවැම්බර් - නායකත්ව මණ්ඩල රැස්වීම
8. දෙසැම්බර් - ව්‍යවසායක ව්‍යාපාර අදහස සහ ව්‍යාපාර සැලසුම් තරගය
9. ජනවාරි - වාර්ෂික AIESEC සම්මාන උළෙල

**NIBM IEEE ශිෂ්‍ය ශාඛාව (අගෝස්තු 2021)**

1. IEEE ශ්‍රී ලංකා අංශයෙන් පවත්වනු ලබන පුහුණුවීම්
2. එක්කොම් ස්ථාපනය කිරීම සඳහා පවත්වන ලද පලමුවන මහා සභා රැස්වීම
3. මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන් පත් කිරීම
4. නායකත්වය සහ ප්‍රජා ව්‍යාපෘති මාලාවක් සමඟින් වසර සැලැස්ම අවසන් කර ඇත
5. ජාත්‍යන්තර ප්‍රවේශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම
6. කණ්ඩායමහි ශ්‍රී ලංකා අංශය සහ IEEE ජාත්‍යන්තර ක්‍රියාකාරකම් සම්බන්ධ කිරීම

**NIBM LEO Club (ජුනි - දෙසැම්බර් 2021)**

1. සාමාජිකත්වය දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය
2. ඔන්ලයින් ක්‍රීඩා උළෙල
3. ආපදා කළමනාකරණ වැඩසටහන
4. අපරාධ සහ අනතුරු වැළැක්වීමේ ව්‍යාපෘතිය
5. පුරවැසි සංවර්ධනය - දරිද්‍රතාවය සහ යහපත් ජීවිතය
6. සාමය, ආගමික සහ සංස්කෘතික හුවමාරුව
7. තරුණයින් ගොඩනැගීමේ වැඩසටහන
8. කාන්තා සවිබල ගැන්වීමේ උත්සවය

**NIBM ආකෘතිය UN පරිච්ඡේදය (ජුලි-දෙසැම්බර් 2021)**

1. දැනුවත් කිරීමේ ආකෘතිය, UN වැඩසටහන - 2021 වර්ෂය දිරිගැන්වීම
2. ආදර්ශ UN ප්‍රශ්න විචාරාත්මක හෝරාව
3. ආදර්ශ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණ සංවිධාන කිරීමේ වැඩමුළුව
4. මාස්ටර් සූම් සම්මන්ත්‍රණ වැඩමුළුව
5. UN NIBM 1 වන ආකෘති සමුළුව (ඔන්ලයින් - ශ්‍රී ලංකාවේ සියලුම පාසල් වලට ආරාධනා කිරීම)
6. සාධාරණත්වය සඳහා මාවත - ගෝලීය සතියේ සහභාගී වී තීරණය ක්‍රියාකිරීම
7. G17 විශ්ව විද්‍යාල නියෝජිත වැඩසටහන - සහභාගීත්වය සඳහා හිමිකම (අඛණ්ඩව පවත්වා ගෙන ඇත.)

## ශිෂ්‍ය සම්බන්ධතා වාර්ෂික ක්‍රියාකාරකම් 2021

- පෙබරවාරි - The CEO Global – Transforming Business Models - මූලික සාකච්ඡා 2021 දෙසැම්බර් ආරම්භ කරන ලදි.
- මාර්තු - ආදි ශිෂ්‍ය වෘත්තීය උපදේශක වෙබිනාර් - දියත් කිරීම - මාර්තු 20
- අප්‍රේල් - වෘත්තීය දිනය - අප්‍රේල් 4
- අප්‍රේල් - කෝණ මංගල්‍යය - අප්‍රේල් 30
- මැයි - වෙසක් උත්සවය - පහන් කූඩු තරඟය - මැයි 25
- ජුනි - පොසොන් උත්සවය - බක්ති ගී - ජුනි 23
- ජුනි - ශාස්ත්‍ර - ටැලන්ට් ෂෝ - උත්සවය සැලසුම් කර කල් දමා ඇත
- අගෝස්තු - පර්යේෂණ සම්මන්ත්‍රණය සියලුම පීඨ - අගෝස්තු 2021
- සැප්තැම්බර් - විවෘත දිනය සියලුම පීඨ - මාර්ගගත ක්‍රියාකාරකම් පවත්වන ලදී
- නොවැම්බර් - දීපවාලි - නොවැම්බර් 16 / සඟරා නිකුත් කිරීම
- දෙසැම්බර් - නත්තල් උත්සවය - Frozen Fest උත්සවය - දෙසැම්බර් 16 - ඔන්ලයින්

## 2022 සඳහා සැලසුම්

A. CREST නවෝත්පාදන කේන්ද්‍රය ස්ථාපිත කිරීම - විවිධ ක්ෂේත්‍රවල රැකියා නිර්මාපකයින් ප්‍රවර්ධනය කිරීම සඳහා සියලුම මධ්‍යස්ථානවල - තාක්ෂණ ඉන්කියුබේටර්

B. ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සහයෝගිතා දියත් කර ඇති විවිධ පීඨවල පරිගණක විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව, ව්‍යාපාර සහ සැලසුම් ආදී උපාධි වැඩසටහන් ස්ථාපිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

C. වාර්ෂික විශ්වවිද්‍යාල ක්‍රියාකාරකම් - මාර්ගගත සහ නොබැඳි

D. සියලුම සමාජ ශාලා සහ සමිති වාර්ෂික නියැලීමේ ක්‍රියාකාරකම් මාලාවක් සිදුකිරීම- මාර්ගගත සහ නොබැඳි

E. අපගේ සියලුම පීඨවල සිසුන්ට UNDP වාර්ෂික ක්‍රියාකාරකම් වල නිරත වීමට අවස්ථාව ලබා දී ඇත.

F. NIBM සමඟ දවස ගත කරන්න UNICEF හවුල්කාරිත්වය සමඟින් සියලු ශාඛාවන් අතර ව්‍යාප්ත කිරීම

G. ප්‍රධාන විධායක නිලධාරී ග්ලෝබල් - ව්‍යාපාර ආකෘති පරිවර්තනය කිරීම- වාර්ෂික සඟරාව - 2 වන එළිදැක්වීම

H. NIBM ව්‍යවසායකයින්ගේ මධ්‍යස්ථානය - NIBM උපාධිධාරීන් සහ උපාධි අපේක්ෂකයින් සම්බන්ධ කරන සමාජ මාධ්‍ය වේදිකාවක් තැනීම.

## අතථ්‍ය උපාධි ප්‍රදානෝත්සවය 2021 (Virtual Graduation)

2021 අගෝස්තු 6 වැනි සිකුරාදා අපගේ සහයෝගී හවුල්කරුවන්ගෙන් (Coventry University / Limkokwing University) ඉගෙනුම ලැබූ සිසුන් සඳහා අතථ්‍ය (Virtual) උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වන ලදි.

මෙහිදී රටෙහි පැවති අසීරු තත්වය තුල සහ ජාත්‍යන්තර වශයෙන් දිගටම පවතින සීමා කිරීම් හේතුවෙන් භෞතික උපාධි ප්‍රදානෝත්සව පැවැත්විය නොහැකි වුවද, www.eventsforce.net/cugroup/274/hom හරහා අතථ්‍ය උපාධි ප්‍රදානෝත්සවයක් සාර්තකව සිදුකරන ලදි.

## NIBM | COVENTRY උපාධි ප්‍රධානෝත්සවය 2021

NIBM | COVENTRY උපාධි ප්‍රධානෝත්සවය 2021 නොවැම්බර් 16 වන දින BMICH හිදී පැවැත් වුහ. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය ගරු සීතා අරඹේපොල මහත්මියයි.



## NIBM සඳහා UNV50 ජාතික සම්මානය

තිරසාර සංවර්ධන ඉලක්ක 17 සහ නායකත්වයේ තරුණයින් සවිබල ගැන්වීම කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවයේ කැපී පෙනෙන සේවය අගයමින් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM) විසින් ඉටු කරන ලද සේවාවන් සඳහා NIBM හට UNV50 ජාතික සම්මානයක් ආචාර්ය ඩී එම් ඒ කුලසූරිය මහතා, අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබාගන්නා ලදි. එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවකයන්ගේ ස්වර්ණමය සංවත්සරය සනිටුහන් කරමින් 2021 දෙසැම්බර් 7 වැනි දින පවත්වන ලද UNV50 ජාතික සම්මාන උළෙලේදී ස්වේච්ඡා සේවය පිළිගෙන සමරනු ලැබීය.

## නිර්මාණ උපාධිය ප්‍රධානෝත්සවය 2021

NIBM හි නිර්මාණ උපාධි ප්‍රධානෝත්සවය, 2021 නොවැම්බර් 29 වන දින BMICH හිදී පැවැත්විණි. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ (NIBM) සභාපති වී කේ චොක්සි මහතා (ජනාධිපති නීතිඥ) සහ NIBM හි අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී එම් ඒ කුලසූරිය මහතා ප්‍රධාන ආරාධිතයන් ලෙස මෙම අවස්ථාවට සහභාගී විය.

## NIBM 39 වැනි ඩිප්ලෝමා ප්‍රධානෝත්වය 2021

NIBM මාර්ගගත ක්‍රමවේදයට ඩිප්ලෝමා සම්මාන ප්‍රධානෝත්වය 2021 ඔක්තෝම්බර් 07 වන දින පවත්වන ලදි. සිසුන් 1800 කට වැඩි සිසුන් ප්‍රමාණයක් ඩිප්ලෝමා පාඨමාලා සාර්ථකව නිම කරන ලදි. NIBM හි අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී එම් ඒ කුලසූරිය මහතා 39 වන ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සාර්ථක කර ගැනීමට දායක වූ සැමට එහිදී ප්‍රශංසා කරන ලදි.



## තරඟකාරී වෙළඳපොලට මුහුණදීම සඳහා වූ ක්‍රමවේදයන්

වර්තමාන දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ පාඨමාලා සඳහා සුදුසුකම් හා කුසලතාවන්ගෙන් යුත් වෘත්තිකයින්, උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන්, බිහිකිරීම අරමුණු කරගෙන ආයතනයේ පාඨමාලාවන් විධිමත් හා සංවිධානාත්මකව පැවැත්වීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2021 දී අනුගමනය කරන ලද ක්‍රමවේදයන් පහත දැක්වේ.

- සියළුම සේවා සැපයීම සඳහා ආයතනය පෝය දින හැර සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනවල (පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා) විවෘතව තැබීම.
- අයදුම්කරුවන් දුරකථනයෙන් සහ අන්තර්ජාලය හරහා ලියාපදිංචි කිරීමට කටයුතු යොදා ඇත.
- අපේක්ෂකයින්ට අදාළ තොරතුරු ලබාගෙන ආයතනයේ වෙබ් අඩවිය මඟින් ලියාපදිංචි විය හැකිය. වෙබ් අඩවිය www.nibm.lk.
- පාඨමාලා ගාස්තු මුදල් වලින්, චෙක් වලින් මෙන්ම ණයපත් වලින් ද ගෙවීමට පහසුකම් සලසා ඇත.
- අධ්‍යයන වර්ෂය ආරම්භ වීමට පෙර පාඨමාලා සැලසුම් කර ඇති අතර එමඟින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ට තම සේවකයින් සඳහා සුදුසු පුහුණු පාඨමාලා කල්තියාම තෝරා ගත හැකිවීම.
- ආයතනයේ කාර්යභාරය, එහි වැඩසටහන් හා සේවාවන්, ලිපි, මුද්‍රිත ද්‍රව්‍ය හා අන්තර්ජාලය හරහා රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ලබා දෙනු ඇත.
- වැඩමුළුවේ කාලය දින 7 ට අඩු නම් වැඩමුළුව අවසන් වූ දිනයේම සහතිකපත්‍ර නිකුත් කිරීම.
- අනෙකුත් පාඨමාලා සම්බන්ධයෙන් සහතිකපත්‍ර පාඨමාලාව අවසන් වූ දින සිට මාසයක් ඇතුළත නිකුත් කෙරේ.
- ප්‍රදර්ශන, වැඩමුළු, පුවත්පත් දැන්වීම් විවිධ සමාජ මාධ්‍ය ඔස්සේ සහ රූපවාහිනී දැන්වීම් තුළින් ආයතනයේ සේවාවන් ආකර්ෂණීය ලෙස ජනතාවගේ අවධානයට යොමු කෙරේ.
- කොළඹ පමණක් සීමා වී පැවති පාඨමාලා මහනුවර, කුරුණෑගල, ගාල්ල සහ මාතර යන ප්‍රදේශවලට ද ව්‍යාප්ත කර ඇත.
- උපදේශනය, ඵලදායිතාව සහ කළමනාකරණ සංවර්ධන සේවාවන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල අවශ්‍යතාවන්ට අනුගතව සකස් කර ඇත.
- ඩිප්ලෝමා ප්‍රදානෝත්සව සහ උපාධි ප්‍රදානෝත්සව වාර්ෂිකව චාරිත්‍රානුකූලව බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වේ.



# අංශවල කාර්යසාධනය

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වටිනා ගනුදෙනුකරුවන් සඳහා ඵලදායි ලෙස සේවා සැපයීම අරමුණු කරගෙන ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ගෙන් යුත් නිපුණතා හා හැකියාවන්ගෙන් යුත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා ආයතනය සිය මෙහෙයුම් කටයුතු ප්‍රධාන අංශ තුනක් යටතේ සිදුකරනු ලැබේ.

1. ව්‍යාපාරික පාසල (SOB)
2. පරිගනක සහ ඉංජිනේරු පාසල (SOCE)
3. නිර්මාණකරනය භාෂා සහ මානවශාස්ත්‍ර පාසල



# ව්‍යාපාරික පාසල (SOB)

ව්‍යාපාර පාසල මඟින් රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා විවිධ විෂයන් සඳහා උසස් ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා පාඨමාලා ලබා දේ.

- සාමාන්‍ය කළමනාකරණ වැඩසටහන්
- මානව සම්පත් කළමනාකරණය
- ව්‍යාපාර කළමනාකරණ
- ඵලදායිතාව සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ වැඩ සටහන්
- උපදේශන සේවා
- භාෂා වැඩටහන්
- පරිගනක යෙදවුම් වැඩසටහන්
- ටේලර්-මේඩ් පුහුණු වැඩසටහන්

එහි මූලික පරමාර්ථය වන්නේ ව්‍යාපාරික සංවිධාන වල මෙන්ම පුද්ගලයින්ගේ ඵලදායිතාව සහ කළමනාකරණ පුරුදු පහසු කිරීම සහ වැඩිදියුණු කිරීමයි. මෙම අංශය මඟින් පුහුණුව, අධ්‍යාපනය සහ උපදේශන සේවා යන ක්ෂේත්‍රයන්හි පුළුල් පරාසයක වැඩසටහන් ඉදිරිපත් කෙරේ. එහි සේවාවන් පාසල් හැරගිය තැනැත්තාගේ සිට ඉහළම වෘත්තිකයා දක්වා සමාජයේ පැතිකඩයන් වලට ලබා ගත හැකිය. මෙම අධ්‍යාපන හා පුහුණු අවස්ථා රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි සංවිධානවල උනන්දුවක් දක්වන පුද්ගලයින් සඳහා නිර්දේශ කෙරේ.
දශක ගණනාවක් පුරාවට ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා ඵලදායිතාව සහ තත්ත්ව කළමනාකරණ පද්ධති හඳුන්වා දීමේදී ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය ඉදිරියෙන්ම සිටියේය. මෑතකදී මෙම අංශය ලොව පිළිගත් ඵලදායිතාව සහ ගුණාත්මක වර්ධන පද්ධතියක් වන ලීන් (Lean) නිෂ්පාදන සහ සිග් සිග්මා පද්ධති හදුන්වා දුන්නේය. ලීන් නිෂ්පාදන සහ සිග් සිග්මා පද්ධති භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ කර්මාන්ත විශාල සංඛ්‍යාවක් මේ වන විටත් ගුණාත්මකභාවය සහ ඵලදායිතාව ඉහළ නැංවීම ආරම්භ කර ඇත.

මෙම අංශය සිය උපදේශන කටයුතු කරගෙන යාමේදී උසස් වෘත්තීය මට්ටමක් පවත්වා ගනී. අපගේ උපදේශකයින්ගේ උපදෙස් සියලුම අදාළ කරුණු සහ මතයන් විශ්ලේෂණයක් මත පදනම් වූ ස්වාධීන දෘෂ්ඨියකින් උපදේශනය කරනු ඇත. අභ්‍යන්තර හා බාහිර වෘත්තිකයින්ගෙන් සමන්විත NIBM උපදේශක කණ්ඩායමට ඕනෑම අධ්‍යයන ව්‍යාපෘතියක් හසුරුවා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා කළමනාකරණ කුසලතාවයන් සහ ප්‍රායෝගික භාවිතය පිළිබඳ පළපුරුද්දක් සහිත උපදේශක මඬුල්ලකි.



## ව්‍යාපාරික පාසලේ වැඩසටහන්

2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ව්‍යාපාරික පාසල වැඩසටහන් 104ක් පවත්වා ඇත. මෙම වැඩසටහන් උපාධි වැඩසටහන් 05ක්, උසස් ඩිප්ලෝමා වැඩසටහන් 12ක්, උසස් ඩිප්ලෝමා වැඩසටහන් 17ක්, ඩිප්ලෝමා වැඩසටහන් 15ක්, උසස් සහතිකපත්‍ර වැඩසටහන් 18ක්, සහතික පත්‍ර වැඩසටහන් 11ක්, පදනම් වැඩසටහන් 01ක්, උපදේශන වැඩසටහන් 22 කින් සහ කෙටිකාලීන වැඩසටහන් 01කින් සමන්විත වේ.

2020 සහ 2021 වර්ෂය තුළදී ව්‍යාපාර පාසල මගින් සිදු කරන ලද වැඩසටහන් වල සාරාංශයක් පහත වගුවේ දක්වා ඇත.

| | | 2020 | | 2021 | |
|---|---|---|---|---|---|
| | පාඨමාලාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව |
| 1 | උපාධි | 3 | 136 | 5 | 363 |
| 2 | උසස් ඩිප්ලෝමා | 9 | 305 | 12 | 358 |
| 3 | ඉහල ඩිප්ලෝමා | 18 | 714 | 17 | 434 |
| 4 | ඩිප්ලෝමා | 2 | 61 | 15 | 439 |
| 5 | උසස් සහතිකපත්‍ර | 16 | 434 | 18 | 308 |
| 6 | සහතිකපත්‍ර | 10 | 252 | 11 | 218 |
| 7 | පදනම් පාඨමාලා | 1 | 23 | 1 | 34 |
| 8 | කටි කාලීන | 0 | 0 | 3 | 52 |
| 9 | උපදේශන | 8 | 8 | 22 | 22 |
| | එකතුව | 67 | 1933 | 104 | 2168 |



## ව්‍යාපාර පාසලට වැඩසටහන් සඳහා සහභාගී වීම

2021 වර්ෂය තුළ ව්‍යාපාරික පාසලේ වැඩසටහන් සඳහා 2168 දෙනෙක් සහභාගී වූහ.

## ව්‍යාපාරික පාසලේ සංවර්ධන ප්‍රයත්නයන්

පෞද්ගලික අංශයේ සේවාලාභීන්ගේ ඉල්ලුම හා අවශ්‍යතා සපුරාලන පුහුණු වැඩසටහන් දියුණු කිරීමට විවිධ උත්සාහයන් ගෙන ඇත. ඒ අනුව මෙම වසර තුළදී නව පුහුණු වැඩසටහන් කිහිපයක් හඳුන්වා දෙන ලදී. මේ සියලු වැඩ සටහන් වලින් ව්‍යාපාරික පාසල විසින් හඳුන්වා දුන් පාඨමාලා වැදගත් වේ. මෙම වසර තුළදී භාෂා පුහුණුව පිළිබඳ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. නව වැඩ සටහන් දියුණු කිරීම සඳහා ව්‍යාපාර පාසල මගින් ගනු ලබන පියවර කිහිපයක් පහත දැක්වේ.

- පාරිභෝගික ඇගයීම් පද්ධතිය ස්ථාපිත කර වැඩි දියුණු කිරීම
- ගනුදෙනුකරුවන් සඳහා යාවත්කාලීන දත්ත බැංකුවක් පවත්වාගෙන යාම සහ ඔවුන් තුළ ආයතනයේ ගෞරවය ඉහළ නැංවීම
- නව ප්‍රචාරණ ශිල්පීය ක්‍රම හඳුන්වාදීම
- පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා සපුරාලන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම
- අභ්‍යන්තර පුහුණු වැඩසටහන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම

## ආදායම් උත්පාදනය

2021 වර්ෂය තුළ ව්‍යාපාරික පාසල රු. මිලියන 391 ක් උපයා ඇත. පහත වගුව සහ රූප සටහන පෙන්නුම් කරන්නේ පෙර වසරවලට සාපේක්ෂව ව්‍යාපාරික පාසලහි ආදායමේ සැලකිය යුතු වර්ධනයක් ඇති බවයි.

රු. මිලියන

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| ව්‍යාපාරික පාසලහි ආදායම් උත්පාදනය | 285 | 274 | 388 | 352 | 391 |



# පරිගණක සහ ඉංජිනේරු පාසල (SOCE)

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය යනු තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සුදුසුකම් සහ පුහුණුව ලබා දෙන පරිගණක පුහුණු ආයතනයකි. සහභාගිවන්නන්ට රැකියා ලබා ගැනීමට හා පිළිගත් සුදුසුකම් ලබා ගැනීමට අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කිරීම සඳහා එම අංශය පරිගණක වැඩසටහන් පවත්වයි. නව අවශ්‍යතා සපුරාලීම සඳහා පාඨමාලා මොඩියුලන් නිරන්තරයෙන් යාවත්කාලීන කරනු ලැබේ. මෙම අංශය උසස් ඩිප්ලෝමා, ඩිප්ලෝමා වැඩසටහන් සහ සහතික පත්‍ර මට්ටමේ වැඩසටහන් ඉදිරිපත් කරයි. ප්‍රධාන පරිගණක වැඩසටහන් වලින් සමන්විත වන්නේ පරිගණක පද්ධති සැලසුම්කරණය පිළිබඳ වසරක ඩිප්ලෝමාවක් වන අතර එය පරිගණක පදනම් තොරතුරු පද්ධති පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් සඳහා වසර දෙකක වැඩසටහනකි. මෙම හොඳින් ව්‍යුහගත පරිගණක පුහුණු වැඩසටහන් සිසුන් අතර පුළුල් පිළිගැනීමක් ලබා ඇති අතර ඒවා දේශීය හා විදේශීය සේවා යෝජකයන් විසින් පිළිගෙන ඇත.

2008 සිට අංශයන් මඟින් සපයන ලද උසස් අධ්‍යාපනයේ සහ සේවාවන්හි උසස් තත්ත්වය තහවුරු කරමින් SOC අංශය ISO 9001: 2000 සහතිකය ලැබීය.



## පරිගණක පාසලේ ක්‍රියාකාරකම්

2021 වර්ෂය තුළදී උපාධි වැඩසටහන් 07ක්, උසස් ඩිප්ලෝමා වැඩසටහන් 07ක්, ඩිප්ලෝමා පාඨමාලා 18ක්, උසස් සහතිකපත්‍ර වැඩසටහන් 01ක්, සහතික පත්‍ර වැඩසටහන් 26ක්, පදනම් වැඩසටහන් 03 ක් ගෘහස්ත වැඩසටහන් 5ක් සහ උපදේශන වැඩසටහන් 01ක් ලෙස වැඩසටහන් කිහිපයක් අංශය විසින් පවත්වන ලදී.

## පරිගණක පාසල විසින් පවත්වනු ලබන වැඩසටහන්

| | | 2020 | | 2021 | |
|---|---|---|---|---|---|
| | පාඨමාලාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව |
| 1 | උපාධි | 7 | 121 | 7 | 157 |
| 2 | උසස් ඩිප්ලෝමා | 6 | 220 | 7 | 213 |
| 3 | ඩිප්ලෝමා | 14 | 548 | 18 | 547 |
| 4 | උසස් සහතිකපත්‍ර | 2 | 16 | 1 | 12 |
| 5 | සහතිකපත්‍ර | 29 | 849 | 26 | 796 |
| 6 | පදනම් පාඨමාලා | 0 | 0 | 3 | 25 |
| 7 | ගෘහස්ත | 0 | 0 | 5 | 595 |
| 8 | උපදේශන | 3 | 3 | 1 | 1 |
| | එකතුව | 61 | 1757 | 68 | 2346 |



2021 වර්ෂය තුළ පරිගණක සහ ඉංජිනේරු පාසලේ වැඩසටහන් සඳහා සිසුන් 2346 ක් සහභාගී වී ඇත.

## ආදායම් උත්පාදනය

2021 වසර තුළ පරිගණක සහ ඉංජිනේරු පාසල විසින් රුපියල් මිලියන 336 ක ආදායමක් උපයා ඇත. 2017-2021 කාලපරිච්ඡේදය තුළ උපයාගත් ආදායම පහත වගුව 07 මගින් පෙන්නුම් කෙරේ.

රු. මිලියන

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| ආදායම් උත්පාදනය - පරිගණක සහ ඉංජිනේරු පාසල | 172 | 241 | 345 | 350 | 336 |






DESIGN
HUMANITIES
BUSINESS ANALYTICS

# ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය

NIBM ලිම්කොක්විං ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය (NIC) යනු ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සිය ස්වර්ණ ජුබිලිය සමරන ලද වසරේදී ජාතියට කරන ලද සුවිශේෂී දායකත්වයකි. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය මැලේසියාවේ ලිම්කොක්විං නිර්මාණාත්මක තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ අත්වැල් බැඳගනිමින්, නිර්මාණාත්මක තාක්ෂණයන් සඳහා 23 වන සියවසේදී ශ්‍රී ලංකාව ඩිජිටල් ජාතියක් බවට පත් කිරීමට දරන අඛණ්ඩ උත්සාහයේ කොටසක් ලෙස මෙය ස්ථාපිත කර ඇත. ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය පිහිටුවීමේදී NIBM හි දැක්ම සිව් වැදෑරුම් වේ.

පළමුව, NIBM සිසුන් ඔවුන්ගේ අනාගතය ගැන සැලකිලිමත් වනු ඇතැයි අපේක්ෂා කරයි. "අනාගතය සැලසුම් කරන්න", ඔවුන්ට කියනු ලැබේ. "ඔබට ඇත්තේ එකම ජීවිතයකි, අන් අයට ඔබ වෙනුවෙන් තීරණ ගැනීමට ඉඩ දෙන්නේ ඇයි, එය ඔබේම කරගන්න. අත්හදා බලන්න, නිර්භීත වන්න සහ අභියෝගවලට මුහුණ දෙන්න. එවිට ඔබට වීමට අවශ්‍ය පුද්ගලයා ඔබ වනු ඇත. ඔබ අන් අය වෙනුවෙන් වැඩ කිරීමට අකමැතිද. එම සිතුවිල්ල ඉතා හොඳ දෙයක්ය, ඔබේම ව්‍යාපාරයක් ආරම්භ කරන්න. ව්‍යවසායකයෙක් වෙන්න. ඔබ රැකියා සොයන්නෙකු නොව රැකියා උත්පාදකයෙකු විය යුතුය." (NIBM විසින් ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානයේ කළමනාකරණ කුසලතා පුහුණු කරනු ලබන්නේ ඒ සඳහා ය.)

දෙවනුව, NIBM සිසුන් ජාත්‍යන්තර පුරවැසියන් වීම සඳහාද පුහුණු කරයි. NIBM- ලිම්කොක්විං NIC හි "ඔබේ ජාත්‍යන්තර සම්බන්දතා ජාලය ගොඩනගාගන්න" ඔවුන් රටවල් 150 ක සිසුන් සමඟ සම්බන්ද වී ඇත. ඔවුන්ගේ අධ්‍යයන වලින් කොටසක් විදේශයකදී සිදුකරනු ලැබේ. ඔවුන්ට හමුවන්නේ අළුත් මුහුණු පමණක් නොව, නව සංස්කෘතීන් සහ නව අදහස් ය. ඔවුන්ට මහද්වීප පහක මිතුරන් හමුවනු ඇත. ඔවුන් තම සීමාවන් පුළුල් කරනු ලැබේ. පැරිසියේ සිට මෙල්බර්න් දක්වා ඕනෑම තැනක පහසුවක් දැනෙන සැබෑ ජාත්‍යන්තර පුරවැසියන් විය හැක, ආයතනයේ සිසුන් අපේක්ෂා කරන්නේද එයයි.



ඉහළ ආදායම් ලබන වෘත්තිකයන් සඳහා හොඳම මාර්ගය ද ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය විසින් ගොඩනගයි. ආයතනයේ සිසුන්ගේ දැනුම නව ලෝකයට ගමන්කිරීමේ ඔවුන්ගේ මාවත වනු ඇත. NIBM ලිම්කොක්විං NIC හි ඔවුන් ජාත්‍යන්තර ව්‍යාපාරික ක්ෂේත්‍රයේ තරුවක් වීම සඳහා සිසුන්ගේ පූර්ණ හැකියාවන් වර්ධනය කර ගැනීමට පුහුණු කරනු ලැබේ. සිසුන්ට ජාත්‍යන්තරය පිළිගත් සහතිකයක් ලැබේ. එය ඔවුන්ගේ විදේශ ගමන් සඳහා බලපත්‍රයක් ලෙස සැබෑ වෘත්තිකයන්ගේ ලෝකය පුරා ගෙන යා හැකිය.

අවසාන වශයෙන්, ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය විසින් කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ උසස් අධ්‍යාපනය ලබාදෙනු ලැබේ. NIBM ලිම්කොක්විං NIC, කර්මාන්තය සමඟ ඇති සමීප සබඳතාවයන් සමඟ සිසුන්ට වැඩ ආරම්භ කිරීමට පුහුණු කරනු ලැබේ, එය ඔවුන්ගේ ප්‍රියතම කණ්ඩායම් සමඟ හෝ ඔවුන්ගේම ජීවිතයේ නව ආරම්භයක් විය හැකිය. ඔවුන්හට එළිදැක්විය හැකි කුසලතා කට්ටලයක් පවතී. ඒ අනුව ඔවුන් සැබෑ වෘත්තිකයන්, නිර්මාණශීලී සහ ව්‍යවසායකයින් වනු ඇත. ඔවුන් ව්‍යාපාරික භාෂාව කතා කරන අතර කර්මාන්තයේ අවශ්‍යතා තේරුම් ගනු ඇත.
මෙහි සෘජු ප්‍රතිලාභීන් හිමිවන්නේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන නමුත් එකවර දැරිය හැකි මිලකට පුහුණු වීමට කැමති ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් ය.

මීට අමතරව, මෙම මුලපිරීම තරුණයින්ට ඔවුන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට ව්‍යවසායකත්ව කුසලතා ද ලබා දෙනු ඇත. ග්‍රැෆික් නිර්මාණකරුවන්, අභ්‍යන්තර නිර්මාණකරුවන්, විලාසිතා නිර්මාණකරුවන්, ලේඛකයින්/කර්තෘවරුන්, කලාකරුවන්, කලා අධ්‍යක්ෂවරුන්, බහුමාධ්‍ය කලාකරුවන්, මාධ්‍ය සංස්කාරකවරුන්, ඡායාරූප ශිල්පීන්, බහුමාධ්‍ය ඉංජිනේරුවන්, චිත්‍රපට අධ්‍යක්ෂවරුන්, මාධ්‍යවේදීන් සහ නිර්මාණශීලී තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්, වාණිජ/කාර්මික නිර්මාණකරුවන්, වැනි කර්මාන්තවල කෙටි කාලයක් තුළ රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් නිර්මාණය කිරීම මෙහි අරමුණයි.
ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගේ සහ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ආරාධනයෙන් 2017 ඔක්තෝම්බර් 20 වැනි දින අතිගරු ජනාධිපතිතුමා අතින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

ශ්‍රී ලංකාවේ ආයතනයන්හි නිර්මාණාත්මක අංශය වෙනස් කරන්නෙකු ලෙස, ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානය විසින් බහුමාධ්‍ය, විලාසිතා, සැලසුම්, අභ්‍යන්තර ගෘහ නිර්මාණ ශිල්පය, සන්නිවේදනය, පුවත්පත් කලාව, ශබ්ද සහ සංගීතය සහ තොරතුරු තාක්ෂණය වැනි වැඩසටහන් මාලාවක් ඉදිරිපත් කරයි. මෙතුළින් නිර්මාණාත්මක කර්මාන්තවලට නායකත්වය ලබා දෙන නව උපාධිධාරී පරම්පරාවක් සවිබල ගන්වනු ඇත.



## NIC පවත්වන ලද වැඩසටහන්

2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ නිර්මාණ පාසල වැඩසටහන් 42ක් පවත්වා ඇත. මෙම වැඩසටහන් පශ්චාත් උපාධි වැඩසටහන් 01 ක් උපාධි වැඩසටහන් 15කින්, උසස් ඩිප්ලෝමා වැඩසටහන් 12කින්, උසස් සහතිකපත්‍ර වැඩසටහන් 01කින්, සහතික පත්‍ර වැඩසටහන් 09 කින්, පදනම් වැඩසටහන් 03කින් සහ වැඩමුළු 01කින් සමන්විත වේ. 2020 සහ 2021 වසර තුළ ජාතික නවෝත්පාදන මධ්‍යස්ථානයහි නිර්මාණ පාසල විසින් පවත්වන ලද වැඩසටහන් වල සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

| | | 2020 | | 2021 | |
|---|---|---|---|---|---|
| | පාඨමාලාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව |
| 1 | පශ්චාත් උපාධි | 0 | 0 | 1 | 12 |
| 2 | උපාධි | 12 | 296 | 15 | 349 |
| 3 | උසස් ඩිප්ලෝමා | 0 | 0 | 5 | 62 |
| 4 | ඉහල ඩිප්ලෝමා | 6 | 122 | 7 | 135 |
| 5 | උසස් සහතිකපත්‍ර | 3 | 17 | 1 | 9 |
| 6 | සහතිකපත්‍ර | 11 | 95 | 9 | 79 |
| 7 | පදනම් පාඨමාලා | 2 | 32 | 3 | 48 |
| 8 | වැඩමුළු | 0 | 0 | 1 | 20 |
| | එකතුව | 34 | 652 | 42 | 714 |



## ආදායම් උත්පාදනය

2021 වසරේ නිර්මාණ පාසල විසින් උපයා ඇති ආදායම රුපියල් මිලියන 263 කි. 2020-2021 කාලපරිච්ඡේදය තුළ උපයාගත් ආදායම පහත වගුව මගින් පෙන්නුම් කෙරේ.

## ආදායම් උත්පාදනය - නිර්මාණ පාසල

රුපියල් මිලියන

| | 2019 | 2020 | 2021 |
|---|---|---|---|
| ආදායම් උත්පාදනය - නිර්මාණ පාසල | 82 | 140 | 263 |






## ඉංග්‍රීසි භාෂා ඒකකය

එක් පූර්ණ කාලීන උපදේශකයෙකු සමග 2006 නොවැම්බර් මාසයේදී ඉංග්‍රීසි භාෂා ඒකකය පිහිටුවන ලදී. මෙම ඒකකය දැන් අධ්‍යක්ෂකවරයෙක් යටතේ පූර්ණ කාලීන උපදේශකයින් කිහිප දෙනෙකු සමග ක්‍රියාත්මක වේ. සෑම වර්ගයකම ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ඉංග්‍රීසි භාෂා කුසලතා පිළිබඳ නිපුණතා ගොඩනැගීමට නමක් දිනා ඇති අතර පෞද්ගලික හා රාජ්‍ය යන අංශ දෙකෙහිම සේවකයින් සඳහා ඉංග්‍රීසි භාෂා වැඩසටහන් මෙන්ම අභ්‍යන්තර ඉංග්‍රීසි වැඩසටහන් ද සාර්ථකව පවත්වා ඇත.

ගුණාත්මක ඉංග්‍රීසි වැඩසටහන් සඳහා දිනෙන් දින ඉහළ යන ඉල්ලුමට ප්‍රතිචාර වශයෙන්, ඉංග්‍රීසි ඒකකය සහතිකපත්‍ර මට්ටමේ සිට ඩිප්ලෝමා මට්ටම දක්වා වැඩසටහන් කිහිපයක් සැලසුම් කර ක්‍රියාත්මක කර ඇති අතර සහභාගිවන්නන්ට ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීමේ ප්‍රවීණයින් බවට පත් විය හැකිය. සාර්ථක වෘත්තීයක් සඳහා ශක්තිමත් පදනමක් ලෙස ඉංග්‍රීසි භාෂා නිපුණතා වැඩි දියුණු කර ගැනීමට උත්සාහ කරන අයට මෙම වැඩසටහන් ඉතා යෝග්‍ය වේ. සියලු වර්ගවල දෙවන භාෂා ඉගෙන ගන්නන් හසුරුවා ගැනීමේදී පළපුරුද්දක් ඇති සම්පත් දායකයින්ගේ සේවාවන් ඉංග්‍රීසි ඒකකය මඟින් සපයනු ලැබේ. ඉංග්‍රීසි සන්නිවේදන මාධ්‍යයක් ලෙස භාවිතා කිරීමේදී ඉගෙනගන්නන්ගේ විශ්වාසය ගොඩනැගීමට ඔවුන්ගේ නිවැරදි මඟ පෙන්වීම අත්‍යවශ්‍යයි. ඉංග්‍රීසි භාෂා ඒකකය කර්මාන්තයට සහ රටට ඉංග්‍රීසි නිපුණතා පිළිබඳ පුහුණු සපයන්නෙකු ලෙස සේවය කරන අතර අනෙකුත් දේශීය හා විදේශීය භාෂාවලින් භාෂා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමේ ව්‍යාප්තිය සඳහා සැලසුම් කර ඇත.

| | | 2020 | | 2021 | |
|---|---|---|---|---|---|
| | පාඨමාලාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව |
| 1 | උසස් ඩිප්ලෝමා | 1 | 18 | 2 | 65 |
| 2 | ඩිප්ලෝමා | 2 | 61 | 4 | 79 |
| 3 | උසස් සහතිකපත්‍ර | 7 | 198 | 9 | 201 |
| 4 | සහතිකපත්‍ර | 4 | 96 | 6 | 169 |
| | එකතුව | 14 | 373 | 21 | 514 |




## ආදායම් උත්පාදනය - ඉංග්‍රීසි භාෂා ඒකකය

2021 වසරේ ඉංග්‍රීසි භාෂා ඒකකය විසින් උපයා ඇති ආදායම රුපියල් මිලියන 29 කි.



# ප්‍රාදේශීය මධ්‍යස්ථාන

ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය 2021 වසර වන විට ප්‍රාදේශීය මධ්‍යස්ථාන හතරක් පිහිටුවා ප්‍රාදේශීය මට්ටමින් පුහුණු පාඨමාලා සිදු කරනු ලැබේ.

# කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය

1986 දී ආරම්භ කරන ලද කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන පාඨමාලා අතර පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලා සහ පරිගණක පද්ධති සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා, පරිගණක යෙදුම් පිළිබඳ ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා, මානව සම්පත් කළමනාකරණය සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පදනම් පාඨමාලා, උසස් සහතික පත්‍ර සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා ආදිය ඇතුළත් වේ. මෙම වැඩසටහන් ක්‍රමානුකූලව පැවැත්වීම සඳහා 2008 වර්ෂයේදී නව ගොඩනැගිල්ලක් ඉදිකර විවෘත කරන ලද අතර එම ව්‍යාපෘතියේ මුළු වියදම රු. මිලියන 141 කි. එය පහත සඳහන් පහසුකම් සහිත සිව්මහල් ගොඩනැගිල්ලකි.

- අංග සම්පූර්ණ දේශන ශාලා.
- අවශ්‍ය සියලුම උපකරණ සහිත පරිගණක පර්යේෂණාගාර.
- නවීන ශ්‍රවණාගාරයක්
- පුස්තකාල පහසුකම්
- අන්තර්ජාල සහ බ්‍රෝඩ් බෑන්ඩ් පහසුකම්
- සුභසාධන සහ ආපනශාලා පහසුකම්
- සියලු පහසුකම් සහිත බද්ධ නිවාස දෙකක්
- වාහන නැවැත්වීමේ පහසුකම්



2020 සහ 2021 කාලය තුළ පහත පාඨමාලා කුරුණෑගල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

| | | 2020 | | 2021 | |
|---|---|---|---|---|---|
| | පාඨමාලාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව |
| 1 | උසස් ඩිප්ලෝමා | 4 | 98 | 4 | 74 |
| 2 | ඉහල ඩිප්ලෝමා | 14 | 300 | 5 | 122 |
| 3 | ඩිප්ලෝමා | 0 | 0 | 9 | 150 |
| 4 | උසස් සහතිකපත්‍ර | 7 | 139 | 10 | 204 |
| 5 | සහතිකපත්‍ර | 16 | 353 | 17 | 401 |
| 6 | පදනම් පාඨමාලා | 0 | 0 | 1 | 4 |
| 7 | වැඩමුළු | 1 | 20 | 1 | 9 |
| | එකතුව | 42 | 910 | 47 | 964 |



## ආදායම් උත්පාදනය

කුරුණෑගල මධ්‍යස්ථානයේ 2021 වර්ෂයේදී, ව්‍යාපාරික සහ පරිගණක පාසල මගින් රු. මිලියන 94 ක ආදායමක් උත්පාදනය කර ඇති අතර කුරුණෑගල මධ්‍යස්ථානයේ ආදායම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බව පහත වගුවේ දැක්වේ.

රු. මිලියන

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| කුරුණෑගල මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනය | 82 | 87 | 96 | 81 | 94 |



# මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය සහ KIC

පරිගණක හා කළමනාකරණ සංවර්ධන අධ්‍යයන සඳහා මධ්‍යම පළාතේ වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි මහනුවර මධ්‍යස්ථානය 1996 දී විවෘත කරන ලදී. පසුව එම මධ්‍යස්ථා-නය මහනුවර අස්ගිරි පාරේ පිහිටි නවීන පහසුකම්වලින් සමන්විත වඩාත් ඉඩකඩ සහිත සිව්මහල් ගොඩනැගිල්ලකට ගෙන යන ලදී. අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සහ පරිසරය වඩාත් යෝග්‍ය වන මෙම මධ්‍යස්ථානයෙන් වඩාත් හොඳ ප්‍රතිඵල ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ වැඩසටහන් කිහිපයක් මෙම මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබේ.



## මහනුවර මධ්‍යස්ථානයේ පාඨමාලා

2020 සහ 2021 කාලය තුළ මහනුවර මධ්‍යස්ථානයේ පවත්වන ලද පාඨමාලා පහත සදහන්කර ඇත.

| | | 2020 | | 2021 | |
|---|---|---|---|---|---|
| | පාඨමාලාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව |
| 1 | උපාධි | 2 | 41 | 4 | 102 |
| 2 | උසස් ඩිප්ලෝමා | 7 | 139 | 8 | 159 |
| 3 | ඉහල ඩිප්ලෝමා | 16 | 324 | 5 | 91 |
| 4 | ඩිප්ලෝමා | 10 | 110 | 18 | 258 |
| 5 | උසස් සහතිකපත්‍ර | 20 | 293 | 8 | 104 |
| 6 | සහතිකපත්‍ර | 1 | 19 | 18 | 261 |
| 7 | පදනම් පාඨමාලා | 0 | 0 | 3 | 22 |
| | එකතුව | **56** | **926** | **64** | **997** |



## ආදායම් උත්පාදනය

2021 වර්ෂයේදී මහනුවර මධ්‍යස්ථානයේ ව්‍යාපාරික පාසල සහ පරිගණක පාසල විසින් උපයා ඇති ආදායම රු. මිලියන 95 කි. පහත වගුවේ දැක්වෙන්නේ මහනුවර මධ්‍යස්ථානයේ ආදායම වසර ගණනාවක් තිස්සේ වෙනස් වී ඇති ආකාරය වේ.

රු. මිලියන

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| ආදායම් උත්පාදනය - මහනුවර මධයස්ථානය | 101 | 102 | 109 | 122 | 95 |



# ගාල්ල ප්‍රාදේශිය මධ්‍යස්ථානය

දකුණු පළාතේ කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම සඳහා මධ්‍යස්ථානයක් ගාල්ලේ දී ආරම්භ කරන ලදි. එය අලුතින් ගොඩනගන ලද අංගසම්පූර්ණ ආයතනයක් වන අතර උසස් අධ්‍යාපනය අපේක්ෂා කරන සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම පියවරෙන් පියවර අධ්‍යාපන සහ වෘත්තීය මාර්ග විවර කරදීම සහතික කරයි. කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උපාධි වැඩසටහන්, ඩිප්ලෝමා වැඩසටහන්, සහතික පත්‍ර වැඩසටහන්, උපදේශන සහ ගෘහස්ථ වැඩසටහන්, විවිධ වැඩමුළු සහ පුහුණු වැඩසටහන් 2010 වර්ෂයේ සිට ගාලු මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබේ.

මෙම කලාපයේ දිනෙන් දින ඉහල යන පුහුණු සහ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා NIBM විසින් ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් තුළ ගුණාත්මක වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ග්‍රාමීය ප්‍රදේශවලට ගෙන යාමේ අරමුණින් වැඩසටහනක් ආරම්භ කර ඇත. එම අරමුණ මනසේ තබා ගනිමින් තරුණ තරුණියන්ගේ අභිලාෂයන් සහ සුදුසුකම් ලත් සහ පුහුණු පුද්ගලයින් නිර්මාණය කරමින් කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රධාන දිස්ත්‍රික්කවල තවත් කලාපීය මධ්‍යස්ථාන ඉදිරියේදී පිහිටුවනු ඇත.



## ගාල්ල මධ්‍යස්ථානයේ පාඨමාලා

2020 සහ 2021 කාලය තුළ ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී පහත පාඨමාලා පවත්වන ලදී.

| | | 2020 | | 2021 | |
|---|---|---|---|---|---|
| | පාඨමාලාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව |
| 1 | උසස් ඩිප්ලෝමා | 6 | 71 | 7 | 134 |
| 2 | ඉහල ඩිප්ලෝමා | 13 | 247 | 5 | 75 |
| 3 | ඩිප්ලෝමා | 6 | 141 | 13 | 186 |
| 4 | උසස් සහතිකපත්‍ර | 16 | 284 | 5 | 90 |
| 5 | සහතිකපත්‍ර | 0 | 0 | 16 | 237 |
| | එකතුව | **41** | **743** | **46** | **722** |



## ආදායම් උත්පාදනය

ගාල්ල මධ්‍යස්ථානයේ ව්‍යාපාර පාසල සහ පරිගණක පාසල විසින් 2021 වර්ෂයේදී රු. මිලියන 85 ක ආදායමක් උපයා ඇත. පහත වගුවේ දැක්වෙන්නේ ගාලු මධ්‍යස්ථානයෙන් උපයාගත් ආදායම ඉහළ ගොස් ඇති අයුරු වේ.

රු. මිලියන

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| ආදායම් උත්පාදනය - ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 65 | 68 | 74 | 77 | 85 |



# මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානය

දකුණු පලාත සඳහා මාතර නගර මධ්‍යයේ පිහිටා ඇති NIBM මාතර ප්‍රාදේශීය මධයස්ථානය තුල ඵලදායිතාව, කළමනාකරණය, තොරතුරු තාක්ෂණ සහ භාෂා යන ක්ෂේත්‍රවලට අදාළ ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපනය පහසුකම් ලබාදීම සඳහා නවීනතම පරිගණක විද්‍යාගාර සහ කැපවූ අධ්‍යයන සහ කාර්ය මණ්ඩලයේ පහසුකම්  සපයා ඇත.

මෙම කලාපවල වර්ධනය වන පුහුණු සහ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා තරුණයින්ගේ අභිලාෂයන් සහ සුදුසුකම් ලත් සහ පුහුණු පුද්ගලයින් සඳහා කර්මාන්ත අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රධාන දිස්ත්‍රික්කවල අනාගතයේදී තවත් කලාපීය මණ්ඩපයක් පිහිටුවීමට NIBM කටයුතු කරයි.



## මාතර මධ්‍යස්ථානයෙහි වැඩසටහන්

මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානයහි 2020 සහ 2021 කාලය තුළ පහත වැඩසටහන් පවත්වා ඇත.

| | | 2020 | | 2021 | |
|---|---|---|---|---|---|
| | පාඨමාලාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව | පාඨමාලා ගණන | සිසුන් සංඛ්‍යාව |
| 1 | උසස් ඩිප්ලෝමා | 3 | 42 | 3 | 76 |
| 2 | උසස් ඩිප්ලෝමා | 12 | 233 | 2 | 33 |
| 3 | ඩිප්ලෝමා | 0 | 0 | 10 | 155 |
| 4 | උසස් සහතිකපත්‍ර | 6 | 107 | 5 | 79 |
| 5 | සහතිකපත්‍ර | 10 | 269 | 9 | 171 |
| | එකතුව | **31** | **651** | **29** | **514** |



## ආදායම් උත්පාදනය

මාතර මධ්‍යස්ථානයේ ව්‍යාපාරික පාසල සහ පරිගණක පාසල මඟින් 2021 දී ආදායම් උත්පාදනය රු. මිලියන 63 ක් වේ. පහත වගුවේ දැක්වෙන්නේ මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් 2017 සිට 2021 දක්වා උපයා ඇති ආදායමයි.

රු. මිලියන

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| මාතර මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනය | 47 | 51 | 67 | 56 | 63 |





# විභාග ඒකකය

2007 දී පිහිටුවන ලද NIBM හි විභාග ඒකකය (EU) විභාග ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කරන NIBM හි ප්‍රධානතම මෙහෙයුම් අංශයකි. එබැවින් විභාග ඒකකයට සිසුන්ගේ වාර්තා ආරක්ෂා කිරීමේ භාරදූර වගකීමක් පැවරේ. ප්‍රශ්න පත්‍ර සහ ප්‍රතිඵල රහස්‍ය තොරතුරු ලෙස සලකමින් රහස්‍යභාවය මෙන්ම ආරක්ෂාව ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි සෑම පියවරක්ම ගන්නා කාර්ය මණ්ඩල සාමාජිකයින් නව දෙනෙකුගෙන් විභාග අංශය සමන්විත වේ.

විභාග අංශයේ කාර්යයන්

- ආයතනයේ නීතිරීති සහ රෙගුලාසි වලට අනුකූලව සියලුම විභාග ක්‍රියාවලීන් කළමනාකරණය කිරීම
- විභාග පැවැත්වීමේදී සිසුන්ගේ විනය නිරීක්ෂණය කිරීම
- ප්‍රාදේශීය මධ්‍යස්ථාන සමඟ විභාගවලට අදාළ සියලුම සිසුන්ගේ වාර්තා කළමනාකරණය කිරීම.
- මුල් සහතික නිකුත් කිරීම
- සිසුන්ට පිටපත් සැකසීම සහ නිකුත් කිරීම
- ප්‍රාදේශීය මධ්‍යස්ථානවල සියලුම වාර්තා කළමනාකරණය කිරීම
- අධීක්ෂණ අවශ්‍යතා කළමනාකරණය කිරීම



# වෘත්තීය මාර්ගෝපදේශන සහ කාර්මික පුහුණු ඒකකය

වෘත්තීය මාර්ගෝපදේශනය සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන ජීවිත කාලය පුරාවටම මග පෙන්වීමේ ප්‍රධාන කාර්යයකි. ආයතනික ලෝකයට පිවිසීමට පෙර උපාධි අපේක්ෂකයින් සඳහා කාර්මික පුහුණුවකට මුහුණදීමට අවශ්‍ය වේ.
වෘත්තීය මාර්ගෝපදේශන සහ කාර්මික පුහුණු ඒකකය (CGIT) සිසුන්ට ඔවුන්ගේ ඉදිරි කාර්මික පුහුණු වැඩසටහනට හැඩගැසීමට මගපෙන්වීම ලබා දෙයි, එහිදී එම ඒකකය සිසුන්ට ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රවල සේවා යෝජකයින්ගේ විවිධ කර්මාන්තකරුවන් හමුවීමට සහාය, උපදෙස් සහ මග පෙන්වීම ලබා දෙයි.

මෙම ඒකකයේ ප්‍රධාන අරමුණ වන්නේ සිසුන් කර්මාන්තයට යොමු කිරීම සහ කර්මාන්තයේ අපේක්ෂාවන් සහ සිසුන්ගේ වර්තමාන දැනුම මට්ටම, කුසලතා සහ ආකල්ප අතර පරතරය අවම කිරීමයි.

### CGIT ඒකකයේ ප්‍රධාන කාර්යයන්

- කාර්මික පුහුණු වැඩසටහන් සකස්කිරීම, සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
- සිසුන්ගේ වෘත්තීය සංවර්ධන සැලැස්ම සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශක සහ සහාය ලබාදීම.
- සිසුන් ඔවුන්ගේ දැනුම, කුසලතා සහ කර්මාන්තය කෙරෙහි දක්වන ආකල්පය සමගින් හැඩගැස්ම වීම.
- කර්මාන්ත සබඳතාව පවත්වා ගැනීම සහ වෘත්තීය පොළවල් සංවිධානය කිරීම.
- කර්මාන්ත විශ්ලේෂණයන් පැවැත්වීම.
- පුහුණු හා සංවර්ධන කටයුතු සිදුකිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
- ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

## වෛද්‍ය මධ්‍යස්ථානය

NIBM හි සිසුන්ගේ සහ සේවකයින්ගේ සෞඛ්‍යය පිළිබඳ සොයා බැලීමේ අරමුණින් සෞඛ්‍ය මධ්‍යස්ථානයක් විවෘත කර ඇත. සායනය MBBS සුදුසුකම් ඇති වෛද්‍යවරයෙකුගේ සහ සුදුසුකම් ලත් හෙද නිලධාරියෙකුගේ සේවය මෙහිදී සිසුන්ට සහ කාර්යමණ්ඩලය සඳහා සපයයි.





## ආපනශාලාව

අපගේ සිසුන්ගේ සෞඛ්‍ය සහ පෝෂණයට ප්‍රමුඛත්වය දෙමින් NIBM ආපනශාලාව සාධාරණ මිලකට සාමාන්‍ය ශ්‍රී ලාංකික ආහාර වර්ග සපයනු ලැබේ. එය NIBM පරිශ්‍රයේ බිම් මහලේ පිහිටා ඇති බැවින් සිසුන්ට තම ආහාරපාන ආදිය පහසුවෙන් ලබාගැනීමට හැකියාව පවතී.







# NSBM හරිත විශ්වවිද්‍යාලය

NIBM පනතේ විධිවිධාන මත පදනම්ව ජාතික ව්‍යාපාර කළමනාකරකාරීත්ව ආයතනයේ පාලක සභාව 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ජාතික ව්‍යාපාර කළමනාකරකාරීත්ව පාසල (NSBM) නමින් ව්‍යාපාරික පාසලක් වාණිජ ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමට තීරණය කළේය. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද "පොදු ව්‍යවසායයේ මාර්ගෝපදේශකය - සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල" මත පදනම්ව මෙය ආරම්භ කරන ලදී. මෙහිදී ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් ලෙස NSBM ආයතනය පිහිටුවා ඇත.

## NSBM දැක්ම

ජාත්‍යන්තරව පිළිගත් ශ්‍රී ලංකාවේ හොඳම ක්‍රියාකාරී උපාධි පාසල බවට පත්වීම

## NSBM මෙහෙවර

ව්‍යාපාර ඉල්ලා සිටින ගෝලීය වශයෙන් තරඟකාරී සහ වගකීම් සහගත උපාධිධාරීන් සංවර්ධනය කිරීම, අපගේ සියලුම පාර්ශ්වකරුවන් සමඟ සහයෝගීව වැඩ කිරීම සහ සමාජයට අපගේ දායකත්වය ලබාදීම

## NSBM පාලනය සහ කළමනාකරණය

**මහාචාර්ය ඊ. ඒ. වීරසිංහ මහතා**
උපකුලපති, ප්‍රධාන විධායක නිළධාරී

**මහාචාර්ය චමින්ද රත්නායක මහතා**
නියෝජ්‍ය උපකුලපති, විධායක අධ්‍යක්ෂ

**මහාචාර්ය ජේ. බී. දොඩන්කොටුව මහතා**
ප්‍රධානි - අධ්‍යයන සංවර්ධන සහ තත්ත්ව සහතික, අධ්‍යක්ෂ

**ආචාර්ය එච්.ආර්.ආර්.ඒ. රණවීර මහතා**
පීඨාධිපති - පරිගණක පීඨය, අධ්‍යක්ෂ

**ආචාර්ය චන්දන පෙරේරා මහතා**
පීඨාධිපති, ඉංජිනේරු පීඨය, අධ්‍යක්ෂ

**තිළිණි ද සිල්වා මහත්මිය**
පීඨාධිපති, ව්‍යාපාර පීඨය, අධ්‍යක්ෂ

**වෛද්‍ය නුවන්ති කටුවාවිල මහත්මිය**
පීඨාධිපති, විද්‍යා පීඨය, අධ්‍යක්ෂ

**ජී.සී.වික්‍රමසිංහ මහත්මිය**
විධායක නොවන අධ්‍යක්ෂ

**ජී.එස්.සුමනසිංහ මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ

**ආචාර්ය එම්.එම්.පී.ප්‍රේමකුමාර මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ

**ඩී.ටී.එස්.එච්.මුදලිගේ මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ

**මහාචාර්ය ඒ.එච්.එන්.කාරියවසම් මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ

**කේ.ආර්. පත්මප්‍රිය මහතා**
විධායක නොවන අධ්‍යක්ෂ

## NSBM සත්‍ය වශයෙන්ම ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක්

NSBM හරිත විශ්ව විද්‍යාලය මුලින්ම 2011 වර්ෂයේදී ජාතික ව්‍යාපාර කළමනාකරකාරිත්ව පාසල (NSBM) නමින් ආරම්භ කරන ලද්දේ දිගු කලක් පැවති අදහසක් යථාර්ථයක් බවට පත් කරමිනි. එය ශ්‍රී ලංකාව තුළ දැනුම පදනම් කරගත් ආර්ථිකයක් ගොඩනැගීමේ අරමුණු ඇතිව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2011 ඔක්තෝබර් 7 වැනි දින ආරම්භ කරන ලදී. NSBM යනු නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන උසස් අධ්‍යාපන ආයතනයකි.

2021 වසර, NSBM හරිත විශ්වවිද්‍යාලය බොහෝ ඉලක්ක අත්පත් කරගෙන ඇති අතර විවිධ ක්‍රියාකාරකම් සහ කාර්යයන් හරහා සහයෝගීව කටයුතු කළ වසරකි. NSBM හරිත විශ්ව විද්‍යාලය වසර පහක එනම් කෙටි කාල සීමාවක් වුවත් තම තේජාන්විත ජයග්‍රාහී ගමනේ කැපී පෙනෙන ලෙස මූලික අරමුණෙහි සන්ධිස්ථානයක් සනිටුහන් කළ වසර ලෙස මෙය හැඳින්විය හැක. 2021 වසර NSBM උපාය මාර්ගික මෙහෙයුම් ක්‍රියාවලියෙන් විශිෂ්ට වූ සහ අරමුණු පිළිබඳ සාමූහික හැඟීමක් සහ හවුල් වටිනාකම් තුළින් මූල්‍ය තිරසාරත්වය ළඟා කර ගත් වසරක් ලෙසද හැඳින්විය හැක.

වසංගතය හේතුවෙන් බොහෝ විශ්ව විද්‍යාලවල බඳවාගැනීම් සංඛ්‍යාව අඩුවෙමින් පවතින අතර, NSBM ඉතිහාසය තුළ වාර්තාගත නව සිසුන් බඳවාගැනීම් සංඛ්‍යාවක් අත්පත් කරගනිමින්, 2021 වසරේ NSBM සිසුන් සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. එපමණක් නොව, පර්යේෂණ ශක්තියද හොඳින් පැවති වසරක් ද වේ.

කීර්තිමත් ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතන සමඟ අනුබද්ධවීම පිළිබඳව නිරන්තරයෙන් විමසිල්ලෙන් සිටින ආයතනයක් ලෙස, 2021 වර්ෂයේදී දිගුකාලීන අධ්‍යයන හවුල්කරුවන් වන එක්සත් රාජධානියෙහි Plymouth විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා විශ්ව විද්‍යාලය, අයර්ලන්තය ඩබ්ලින් විශ්ව විද්‍යාලය සමඟ සහයෝගීතාවයන් ශක්තිමත් කළ වසරකි. මෙම උපාධි වැඩසටහන් ශ්‍රී ලංකාවේ දියත් කිරීම ජාත්‍යන්තර අවස්ථා සොයමින් රට හැර යාමට තීරණය කරන බොහෝ තරුණ සිත් අධෛර්යමත් කළ අතර එය ශ්‍රී ලංකාව ආසියාවේ දැනුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කරමින් NSBM හි බලාපොරොත්තු වන අරමුණ ලඟාකර ගැනීම ශක්තිමත් කළේය.

වර්තමානයේ වසරකට ආසන්න වශයෙන් නව බඳවාගැනීම් 2400 ක් පමණ සිදුකරන අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සහ ගෝලීය වශයෙන් කීර්තිමත් උසස් ශ්‍රේණිගත කරන ලද විදේශීය විශ්වවිද්‍යාල සමඟ හවුල්කාරිත්වය යටතේ උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන් 50 කට ආසන්න ප්‍රමාණයක් ව්‍යාපාර පීඨය, පරිගණක පීඨය, ඉංජිනේරු පීඨය සහ විද්‍යා පීඨය යන පීඨ හතර තළ සිසුන් 11,000 කට වැඩි සංඛ්‍යාවක් 2021 වන විට NSBM තුළ හදාරමින් සිටී.

හරිත විශ්ව විද්‍යාලක අත්දැකීම මීළඟ මට්ටමට ගමන්කරමින්, 2021 වර්ෂයේදී, ආයතනය විසින් NSBM හරිත විශ්ව විද්‍යාල ව්‍යාපෘතියේ II අදියර ඉදිකිරීම ආරම්භ කරන ලදි. විශ්ව විද්‍යාල පරිශ්‍රයට යාබදව තවත් අක්කර 15 ක ඉඩමක් එකතු කරන ලද අතර, එමගින් අලුතින් යෝජිත නව පීඨ තුනක් එනම් නීති පීඨය, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය සහ සෞඛ්‍ය විද්‍යා පීඨයහි පහසුකම් ද පුළුල් කරගත හැකිවනු ඇත. NSBM විසින් පස් වන සංවත්සරයේ උත්සවාකාර සැමරුමට සමගාමීව, NSBM හරිත විශ්වවිද්‍යාලය-II අදියර යටතේ නව ක්‍රීඩා පිටියහි ඉදිකිරීම් සනිටුහන් කරමින් විවෘත කරන ලදී.

එබැවින්, NSBM හරිත විශ්ව විද්‍යාලයහි දැක්ම සහ අරමුණ තුළින් අපේක්ෂා කරන පරිදි, වර්ධනය ශක්තිමත් කිරීම, බාධා ජය ගැනීම සහ එහි පැවැත්ම පුළුල් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන භූමිය ප්‍රතිනිර්මාණය කිරීම තුළින් 2021 මූල්‍ය වර්ෂය අවසානයේදී ආයතනය තවත් ඉදිරියට ගමන්කිරීම සිදු වී ඇත.


Income
LKR 3.5 Billion
Profitability
LKR 679 Million
2,784
Enrolled
1,943 students
Graduated
Students Satisfaction Ratio
94%
On campus students
10,628
Total Assets
LKR 11 Billion

## මෙහෙයුම් සමාලෝචනය

### වසරේ මෙහෙයුම්වල විශේෂ අවස්ථා

NSBM හරිත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශනය සහ කාර්යසාධන ව්‍යුහය ප්‍රධාන වටිනාකම් ප්‍රවාහ හතරකට: ව්‍යාපාර, පරිගණක, ඉංජිනේරු සහ සැලසුම්, සහ විද්‍යා ලෙස කේන්ද්‍රගතව පවතී. එම ප්‍රවාහ ඔවුන්ගේ අධ්‍යයන ක්ෂේත්‍රයේ දැනුම විහිදුවන සුවිශේෂී පීඨ හතරක් යටතේ ව්‍යුහගත කර ඇත.

### බඳවා ගැනීම් වල වර්ධනය

ගෝලීය වසංගත තත්වයන් මධ්‍යයේ විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීම අභියෝගයක් ලෙස සලකනු ලැබූ වකවානුවක, NSBM ආයතනය 2021 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම් වැඩසටහන් දෙකකින් සමන්විත වූ වාර්තාගත ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇතුළත් කරගන්නා ලදි. NSBM ආයතනික සැලැස්මේ ඉලක්ක වලට අනුකූලව, 2021 දෙසැම්බර් 31 වනදා වන විට කැම්පස් ශිෂ්‍ය සංඛ්‍යාව 10,628ක් සමග ස්ථාවරව පැවතුනි. මෙය පෙර වාර්තා කරණ ලද කාලපරිච්ඡේදයට සාපේක්ෂව 09% ක වර්ධනයකි.

| | NSBM (UGC අනුමැතිය ලත් උපාධි) | Dublin විශ්වවිද්‍යාලය | Plymouth විශ්වවිද්‍යාලය | Limkokwing විශ්වවිද්‍යාලය | Victoria විශ්වවිද්‍යාලය | එකතුව |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපාරික පීඨය | 3,464 | 360 | 2,478 | - | 172 | 6,474 |
| පරිගණක පීඨය | 1,143 | 264 | 1,797 | - | 158 | 3,362 |
| ඉංජිනේරු පීඨය | 581 | - | 52 | 46 | - | 679 |
| විද්‍යා පීඨය | 113 | - | - | - | - | 113 |
| විශ්ව විද්‍යාලයේ සිසුන් | 5,301 | 624 | 4,327 | 46 | 330 | 10,628 |
| ව්‍යාපාරික පීඨය | 54% | 6% | 38% | 0% | 3% | 100% |
| පරිගණක පීඨය | 34% | 8% | 53% | 0% | 5% | 100% |
| ඉංජිනේරු පීඨය | 86% | 0% | 8% | 7% | 0% | 100% |
| විද්‍යා පීඨය | 100% | 0% | 0% | 0% | 0% | 100% |
| උපාධිධාරීන් ගණන | 713 | 213 | 917 | - | 96 | 1,939 |

2021 වර්ෂයේදී එක් එක් විශ්වවිද්‍යාලය විසින් පිරිනමන ලද විවිධ උපාධි වැඩසටහන් යටතේ විවිධ පීඨවල ඉගෙනුම ලබන සිසුන් බෙදා හැරීම පහත තීරු සටහනේ දැක්වේ. මෙම සෑම විශ්වවිද්‍යාලයක්ම තමන්ගේම අනන්‍ය විෂයයන්ගෙන් සමන්විත පුළුල් පරාසයකින් පවතී.




ශිෂ්‍ය බඳවාගැනීමේ ධනාත්මක වර්ධනය සහ ශිෂ්‍ය රැඳවා ගැනීමේ ඉහළ අනුපාත NSBM විසින් සෑම වසරකම අත්පත් කර ගැනීම මගින් කීර්තිමත් මට්ටමක් පෙන්නුම් කරයි. NSBM විසින් දේශීය අධ්‍යාපන ව්‍යුහය යටතේ සහ එක්සත් රාජධානිය, අයර්ලන්තය සහ ඕස්ට්‍රේලියාව ඇතුළු ලොව පිළිගත් විශ්වවිද්‍යාල යටතේ විවිධ විෂය ක්ෂේත්‍රයන්හි විවිධ විකල්ප පරාසයක ඇති විශිෂ්ට උසස් අධ්‍යාපනය අවස්ථා ලබා දීම සම්බන්ධයෙන් හිමිකම් පා ඇත.

- **සියළු සිසුන් – විශ්වවිද්‍යාල අනුව**




| | |
|---|---|
| NSBM (UGC අනුමත උපාධි) | 5,301 |
| University College Dublin | 624 |
| Plymouth විශ්වවිද්‍යාලය | 4327 |
| Limkokwing විශ්වවිද්‍යාලය | 46 |
| Victoria විශ්වවිද්‍යාලය | 330 |

- **සියළු සිසුන් – පීඨ අනුව**




| | |
|---|---|
| ව්‍යාපාරික පීඨය | 6,474 |
| පරිගණක පීඨය | 3,362 |
| ඉංජිනේරු පීඨය | 679 |
| විද්‍යා පීඨය | 113 |

- **සියළු සිසුන් – ස්ත්‍රී පුරුෂභාවය අනුව**




| | |
|---|---|
| පිරිමි | 52% |
| ගැහැණු | 48% |

## මූල්‍ය සමාලෝචනය

### 2021 මූල්‍ය කාර්ය සාධනය

NSBM විසින් (ඉහළ ප්‍රාග්ධන ආයෝජනයක් සහිත ආයතන සමඟ පොදුවේ) භාවිතා කරන ප්‍රධාන මූල්‍ය තිරසාර ප්‍රමිතිකය වන්නේ පොලී, බදු, ක්ෂයවීම් සහ ක්ෂයවීම් වලට පෙර ඉපැයීම් (EBITDA) වේ. අපගේ රුපියල් බිලියන 8.6 ක කාලීන ණය සඳහා පාලනය කළ නොහැකි දැවැන්ත ණය පොලිය මුළු ලාභයෙන් සැලකිය යුතු කොටසක් අවශෝෂණය කරන බැවින් මේ පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. පොලී සහ බදු වලට පෙර ඉපැයීම් සමඟ වර්ෂයහි රුපියල් මිලියන 1,387 (2020: රුපියල් මිලියන 1,353) අතිරික්තයක් සමඟ වසර තුළ මූල්‍ය කාර්යසාධනය අතිශයින් ධනාත්මක වේ. මෙම වසරේ ප්‍රතිඵල ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආදායම් වැඩිවීමයි. NSBM පසුගිය වසර කිහිපය තුළ ශිෂ්‍ය සංඛ්‍යාවේ දිගුකාලීන වර්ධනයකින් සහ අපගේ පිරිවැය පදනමේ සලකා බලන පාලනයකින් විශේෂයෙන් ප්‍රතිලාභ ලබා ඇත.




මෙහෙයුම්වල සාර්ථක වර්ධනයත් සමඟ ආයතනයේ දළ ලාභය රුපියල් මිලියන 2,456 (2020 දී රුපියල් මිලියන 2,399) විය. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය කාලසීමාව සඳහා ශුද්ධ ලාභ අනුපාතය 19% ක් (2020 දී 14% ක්) වේ. ආදායම වැඩිවීම මගින් වියදම් වැඩිවීම මනාව කළමනාකරණය වන බව මෙමගින් පෙන්නුම් කෙරේ. ධනාත්මක සහ වැඩිවන මෙහෙයුම් ලාභය අපේක්ෂා කළ හැකි අනාගතය සඳහා සමාගමේ තිරසාර බව පිළිබිඹු කරයි



## ආදායම්

2021 උසස් පෙළ විභාගය නොපැවැත්වීමේ ප්‍රතිඵලයක් ලෙස ඔක්තෝම්බර් මාසයෙහි අදාල බඳවාගැනීම් සිදු නොවිණි. එබැවින් NSBM හට 2021 සඳහා එම බඳවාගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇත. ප්‍රධාන වශයෙන් මූල්‍ය වර්ෂය තුළ මුළු දළ ආදායම 6% (2020 දී 10%) කින් පමණ වර්ධනය විය.  2021 රටේ කෝවිඩ් තත්වය නොසළකා NSBM ඉතිහාසයේ ඉහලම ආදායම වාර්තා කර ඇති බැවින් 2021 වසර විශිෂ්ඨ වසරක් විය. 2021 වසරේ කැපී පෙනෙන ජයග්‍රහනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පසුගිය වසර කිහිපය තුළ අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාවෙ හි දැවැන්ත වැඩි වීමයි. ඉදිරි වසර වලදීද මෙම වර්ධනය තවත් වැඩි වනු ඇත.

මෙහෙයුම්වල තිරසාර වර්ධනයත් බදු ලාභය රුපියල් මිලියන 2,456 ක් විය (2020 දී රුපියල් මිලියන 2,399) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය කාල සීමාව සඳහා ශුද්ධ ලාභ අනුපාතය 19%ක් වේ (2020 දී 14%). ආදායම සාමාන්‍ය වියදම් මඟින් මනාව කළමනාකරණය වන බව පෙන්නුම් කෙරේ. ධනාත්මක සහ වැඩිවන ලාභය අපේක්ෂා කළ හැකි අනාගතය සඳහා සමාගම තිරසාර බව තහවුරු කරයි




විශාලතම ආදායම් මාර්ගය වන වැඩසටහන් ගාස්තු සමස්ත මෙහෙයුම් ආදායමෙන් 98%ක් (2020 දී 98%) වන අතර, එය 2021 වර්ෂයේදී රුපියල් බිලියන 3.2 සිට රුපියල් බිලියන 3.4 දක්වා රුපියල් මිලියන 185 කින් වර්ධනය විය. වර්ධනය වන පාඨමාලා ආදායමට ප්‍රධාන දායකත්වය සපයන්නේ ශිෂ්‍ය සංඛ්‍යාවේ වැඩිවීමක් සමඟ පාඨමාලා ආදායම වැඩිවීම තුළින් වන අතර මෙතුළි-න් සමාගමේ වර්ධන අපේක්ෂාව මනාව පිළිබිඹු වේ. ලියාපදිංචි ගාස්තු 2020 වසරේ රුපියල් මිලියන 27 සිට රුපියල් මිලියන 30 දක්වා 2021 මූල්‍ය වර්ෂය තුළ 12% කින් වර්ධනය විය

2021 වර්ෂයේදී, මෙහෙයුම් ආදායමට දායකත්වය සපයන වෙනත් ආදායම් 7% කින් වැඩි වී ඇත. උපාධි ප්‍රදානෝත්සව වියදමට ප්‍රධාන දායකත්ව සපයන සාධකයක් ලෙස COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 දී උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීමට නොහැකි වීම හේතු විය.

## වියදම්

සමාගමේ ඍජු මෙහෙයුම් වියදම් වල වර්ධනය 15% කින්, එනම් රුපියල් බිලියනයක් දක්වා වැඩි වී ඇත. (2020 වසරේ ඍණ -01%කි). නව අධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ බලපෑම සහ විදේශීය අනුබද්ධ විශ්වවිද්‍යාල සඳහා ගෙවීම් පිළිවෙලින් 18% කින් සහ 14% කින් ලෙස පෙන්නුම් කෙරේ. 2021 වර්ෂයෙහි මුළු ඍජු වියදම්වලින් විදේශීය අනුබද්ධ විශ්වවිද්‍යාල සඳහා ගෙවීම් 66% ක් පමණ වන අතර අධ්‍යයන කාර්ය මණ්ඩල පිරිවැය 27% ක් වේ.

මුළු වියදමෙන් 38% ක් නියෝජනය කරන පරිපාලන වියදම 1% කින් (2020 දී 37%) වර්ධනය විය. වැටුප් (27% කින්) වැඩිවීම සහ සනීපාරක්ෂක හා ගෙවතු නඩත්තු වියදම් (28%කින්) වැඩිවීම පිරිවැය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

සමාගමේ විශාලතම පිටතට ගලායාම වන පරිපාලන වියදම් මුළු වියදමෙන් 22% ක් නියෝජනය කරයි. 2021 වසරේ පොලී අනුපාත අඩුවීම මෙන්ම, 2021 දෙසැම්බර් 31 අවසන් වන විට ප්‍රාග්ධන ගෙවීම් වැඩි වීම හේතුවෙන් පොලී සඳහා වන පිරිවැය 21% කින් අඩු වී ඇත.

## අවිනිශ්චිතතාවයන් සහ අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම - 2021

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුරෝගාමියෙකු ලෙස සීමාසහිත ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යාතන සමාගම මෙම අභියෝගාත්මක කාලය තුළ සිය සේවකයින්ගේ, සිසුන්ගේ සහ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා රජය සහ සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද නිර්දේශ, මාර්ගෝපදේශ සහ ක්‍රියාමාර්ග අඛණ්ඩව අනුගමනය කරන ලදි.

සමස්තයක් ලෙස ගත් කල, වසර ගණනාවක් පුරා ගොඩනැගුණු ශක්තිමත් අඛණ්ඩ ව්‍යාපාරික සැලසුම් හේතුවෙන් ආයතනයේ ආදායමට හෝ මුදල් ප්‍රවාහයට කිසිදු බාධාවක් නොමැතිව මෙහෙයුම් කටයුතු සිදු කිරීමට සමත් විය. සමාගමේ සියලුම තොරතුරු තාක්ෂණ පද්ධති උසස් මට්ටමක පවතින අතර, දිවයින පුරා විසිරී සිටින NSBM සිසුන් 9,500 කට අධික සංඛ්‍යාවකගේ අධ්‍යාපන අවස්ථාවන්ට බාධාවක් නොවන පරිදි සේවකයන් මෙම දුෂ්කර කාලවලදී නිවසේ සිට වැඩ කිරීම (WFH) තුළින් සියලුම කාර්යයන් කඩිනමින් නිම කිරීමට හැකි විය.

සාමාන්‍යයෙන් ආයතනයේ මාර්තු බඳවා ගැනීම 2021 ජුනි මාසයදී සිදු කරන ලද අතර උසස් පෙළ විභාගය කල් දැමීම හේතුවෙන් සාමාන්‍යයෙන් ඔක්තෝබර් වලදී කළ යුතු බඳවා ගැනීම සිදු නොකරන ලදි. තවද, වසංගත තත්ත්වය හේතුවෙන් "වාර්ෂික සම්මන්ත්‍රණ සතිය" වැඩසටහන සාමාන්‍ය පරිදි දෙසැම්බර් මාසයේදී පැවැත්වීමට නොහැකි විය. කෙසේ වෙතත්, එම තත්වයට මුහුණදුන් සිසුන්ගේ සියලුම අධ්‍යයන කටයුතු අවසන් කරන ලද අතර ඔවුන්ගේ අධ්‍යයන වාරය සාමාන්‍ය පරිදි බාධාවකින් තොරව අවසන් කිරීමට මෙනිසා හැකි විය.

ආයතනයට කිසිදු ගැටලුවකින් තොරව කාල සීමාව පුරා පවතින මූල්‍ය තත්ත්වය වෙත ප්‍රවේශ වීමට හැකි වී ඇත. ණය දෙන ආයතන සමඟ ඇති ණය ගිවිසුම්වලට අනුකූලව කටයුතු කර ඇති අතර දැනට පවතින ණය බැඳීම් සපුරාලීමට ආයතනයට හැකියාව පවතී.

ප්‍රධාන වශයෙන්, රජය සහ සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ පලමුව පිළිපැදීමෙන් අප සේවකයින්ගේ, සිසුන්ගේ සහ අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳව ආයතනය සහතික විය. සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් පරිදි සියලුම කාර්යාල සනීපාරක්ෂාව සහ විෂබීජහරණය කිරීම නිතිපතා සිදු කරන ලදී. කිසිදු ආකාරයේ රැස්වීම් නොපවත්වන ලෙස සේවකයින්ගෙන් ඉල්ලා සිටින අතර, එවැනි සමාජීය සිදුවීමකට මුහුණුදෙන ඕනෑම අයෙකු ස්වයං නිරෝධායනයට කටයුතු කරන ලෙස ඉල්ලා ඇත. තවද, සියලුම පාර්ශව කරුවන්ගේ රැස්වීම් නවීනතම තාක්ෂණික මෙවලම් භාවිතයෙන් සිදුකරන ලදි.

ආයතනය මෙහෙයුම් මට්ටමේදී, තීරණාත්මක ව්‍යාපාරික මෙහෙයුම් හඳුනාගෙන එම ව්‍යාපාරික ක්‍රියාකාරකම් හැසිරවීමට පුහුණු වූ කණ්ඩායම් දෙකක් පිහිටුවා "බෙදන ලද මෙහෙයුම්" (Split Operations) හඳුන්වා දෙන ලදි. මෙම කණ්ඩායම් දෙකෙන් එක් කණ්ඩායමක් සේවයට වාර්තා කරන විට විවිධ ස්ථානවල කටයුතු ක්‍රියාත්මක කරන අතර අනෙක් කණ්ඩායම නිවසේ සිට වැඩ කරනු ලැබේ. එමගින් සියලුම කණ්ඩායම් සාමාජිකයින් එකවර COVID-19 වෙත නිරාවරණය වීමේ අවදානම අවම විය. තීරණාත්මක ව්‍යාපාර මෙහෙයුම් ක්‍රියාකාරකම් සිදු කළ සේවකයින් හැර, අනෙකුත් සියලුම සේවකයින්ට වසර ගණනාවක් තිස්සේ ගොඩනගන ලද ආයතනයේ නවීනතම තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණ ආරක්ෂණ පද්ධතිවල සහාය ඇතිව නිවසේ සිට වැඩ කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.

ආයතනයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සහතික කිරීම සඳහා මෙම තීරණාත්මක කාල පරිච්ඡේදය තුළදී, සුපුරුදු පරිදි ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු සිදු කිරීමට ඉහත අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග පිටුවහල් වී ඇත.

උපායමාර්ගික මට්ටමින්, කළමනාකාරිත්වය බාහිර පරිසරයේ සිදුවන වෙනස්කම් අඛණ්ඩව අධීක්ෂණය කරමින් සිටින අතර වත්මන් COVID-19 වසංගතය හේතුවෙන් ආයතනය ට සිදුවන සෘණාත්මක බලපෑම වළක්වා ගැනීම සඳහා ක්‍රියාශීලී ක්‍රියාමාර්ග සිදුකර ඇත. තවද, මෙවැනි වසංගත වලදී බාධාවකින් තොරව ව්‍යාපාරික මෙහෙයුම් කරගෙන යෑමට හැකි වන පරිදි නවතම තාක්ෂණ සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සඳහා ආයතනය  අඛණ්ඩව ආයෝජනය කරනු ලැබේ.

සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට ප්‍රමුඛ ආදර්ශයක් සපයමින් සියලුම සෞඛ්‍ය හා ආර්ථික අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට NSBM සමත් වූ බව මෙම සියලු පියවරයන් සහතික කරයි. තවද, ආයතනයට පාලනය කළ නොහැකි මෙම අභියෝග සිය මෙහෙයුම් කෙරෙහි ඇති කරන බලපෑම අඛණ්ඩව අධීක්ෂණය කරන අතර, මෙම අභියෝගාත්මක කාලය තුළදී පවා ව්‍යාපාරය හැකිතාක් බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහතික කිරීමට ක්‍රියාශීලීව පියවර අනුගමනය කරනු ලැබේ.



# මූල්‍ය ප්‍රකාශන

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)*

| | | NIBM | | | NSBM | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සටහන් | 2021 දෙසැම්බර් 31 | 2020 දෙසැම්බර් 31 (නැවත ප්‍රකාශිත) | 2020 ජනවාරි 01 (නැවත ප්‍රකාශිත) | 2021 දෙසැම්බර් 31 | 2020 දෙසැම්බර් 31 | 2020 ජනවාරි 01 | 2021 දෙසැම්බර් 31 | 2020 දෙසැම්බර් 31 (නැවත ප්‍රකාශිත) | 2020 ජනවාරි 01 (නැවත ප්‍රකාශිත) |
| **වත්කම්** | | | | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | | | | |
| දේපළ, පිරියත, උපකරණ | 3 | 1,000,528,702 | 831,201,406 | 894,877,200 | 9,454,464,492 | 9,505,389,439 | 9,795,232,123 | 10,454,993,194 | 10,336,590,845 | 10,690,109,323 |
| අස්පෘශ්‍ය වත්කම් | 4 | 2,296,219 | 2,257,993 | 1,806,436 | 11,986,675 | 25,432,846 | 29,040,413 | 14,282,894 | 27,690,839 | 30,846,849 |
| අනුබද්ධ ආයතනවල ආයෝජනය | 5 | 800,000,010 | 800,000,010 | 800,000,010 | - | - | - | - | - | - |
| වත්කම් භාවිතා කිරීමේ අයිතිය | 6 | 274,849,898 | 131,062,715 | 40,830,162 | 314,905,314 | 333,841,565 | 369,008,151 | 589,755,212 | 464,904,280 | 409,838,313 |
| වෙනත් ජංගම නොවන වත්කම් | | 16,623,061 | 22,254,778 | 23,688,170 | - | - | - | 16,623,061 | 22,254,778 | 23,688,170 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **2,094,297,890** | **1,786,776,901** | **1,761,201,978** | **9,781,356,481** | **9,864,663,850** | **10,193,280,687** | **11,075,654,361** | **10,851,440,741** | **11,154,482,655** |
| ආරක්ෂිත තැන්පත් | | 15,062,500 | 10,750,000 | 10,750,000 | - | - | - | 15,062,500 | 10,750,000 | 10,750,000 |
| **ජංගම වත්කම්** | | | | | | | | | | |
| බඩු තොග | 7 | 9,292,293 | 12,287,275 | 11,035,684 | 27,936,091 | 15,726,105 | 12,766,833 | 37,228,384 | 28,013,380 | 23,802,517 |
| කෙටිකාලීන ආයෝජන | 8 | 569,159,852 | 581,879,840 | 397,738,713 | 513,008,309 | 712,937,868 | - | 1,082,168,161 | 1,294,817,708 | 397,738,713 |
| වෙළෙඳාම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 9 | 323,952,011 | 277,830,221 | 184,676,267 | 960,873,143 | 510,056,500 | 372,991,600 | 1,284,825,154 | 787,886,721 | 557,667,867 |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | | 6,861,410 | 3,565,917 | 3,825,602 | 2,838,790 | - | - | 9,700,200 | 3,565,917 | 3,825,602 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 10 | 41,681,364 | 36,164,777 | 41,395,470 | (206,254,464) | 115,264,126 | 58,315,041 | (164,573,100) | 151,428,903 | 99,710,511 |
| **මුළු ජංගම වත්කම්** | | **950,946,930** | **911,728,030** | **638,671,736** | **1,298,401,869** | **1,353,984,599** | **444,073,474** | **2,249,348,799** | **2,265,712,629** | **1,082,745,210** |
| **මුළු වත්කම්** | | **3,060,307,320** | **2,709,254,933** | **2,410,623,714** | **11,079,758,349** | **11,218,648,447** | **10,637,354,161** | **13,340,065,660** | **13,127,903,369** | **12,247,977,864** |
| **අරමුදල් සහ වගකීම්** | | | | | | | | | | |
| **ප්‍රධාන** | | | | | | | | | | |
| රජයේ දායකත්වය | 11 | 57,175,767 | 57,175,767 | 57,175,767 | - | - | - | 57,175,767 | 57,175,767 | 57,175,767 |
| වෙනත් ප්‍රධාන | 12 | - | - | 1,068,000 | - | - | - | - | - | 1,068,000 |
| ප්‍රාග්ධන ප්‍රධාන | 13 | 311,735,921 | 321,804,028 | 331,969,695 | - | - | - | 311,735,921 | 321,804,028 | 331,969,695 |
| **මුළු ප්‍රධාන** | | **368,911,688** | **378,979,795** | **390,213,462** | **-** | **-** | **-** | **368,911,688** | **378,979,795** | **390,213,462** |
| **ප්‍රාග්ධන සහ වෙන්කිරීම්** | | | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | - | - | - | 800,000,010 | 800,000,010 | 800,000,010 | - | - | - |
| නැවත ඇගයීම් සංචිතය | 14 | 298,389,682 | 247,392,885 | 247,392,885 | - | - | | 298,389,682 | 247,392,885 | 247,392,885 |
| රඳවාගත් ඉපැයුම් | | 1,409,151,649 | 1,272,584,953 | 1,155,567,076 | 799,890,890 | 120,631,103 | (346,841,453) | 2,209,042,539 | 1,393,216,056 | 808,725,623 |
| **මුළු ප්‍රාග්ධනය සහ සංචිත** | | **1,707,541,331** | **1,519,977,838** | **1,402,959,961** | **1,599,890,900** | **920,631,113** | **453,158,557** | **2,507,432,221** | **1,640,608,941** | **1,056,118,508** |
| **මුළු අරමුදල** | | **2,076,453,018** | **1,898,957,632** | **1,793,173,423** | **1,599,890,900** | **920,631,113** | **453,158,557** | **2,876,343,908** | **2,019,588,735** | **1,446,331,970** |
| **ජංගම නොවන වගකීම්** | | | | | | | | | | |
| පුස්තකාල තැන්පත් | | 810,000 | 591,000 | 1,308,000 | 1,471,000 | 1,624,000 | 1,754,000 | 2,281,000 | 2,215,000 | 3,062,000 |
| බැංකු ණය | | - | - | - | 7,260,589,070 | 7,550,000,000 | 7,820,000,000 | 7,260,589,070 | 7,550,000,000 | 7,820,000,000 |
| විලම්භිත බදු බැරකම් | 15 | 82,814,192 | 57,738,462 | 69,999,305 | 669,103,096 | 561,080,608 | 454,032,156 | 751,917,288 | 618,819,070 | 524,031,461 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැරකම් | 16 | 44,234,866 | 42,809,142 | 30,394,600 | 30,615,800 | 25,097,121 | 18,362,071 | 74,850,666 | 67,906,263 | 48,756,671 |
| බදු ණය දෙන්නන් | 19 | 139,450,300 | 67,488,737 | 33,150,208 | - | 17,548,825 | 19,417,065 | 139,450,300 | 85,037,562 | 52,567,273 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **267,309,358** | **168,627,341** | **134,852,113** | **7,961,778,966** | **8,155,350,554** | **8,313,565,292** | **8,229,088,324** | **8,323,977,895** | **8,448,417,405** |
| **ජංගම වගකීම්** | | | | | | | | | | |
| පුස්තකාල තැන්පත් | | 810,000 | 861,000 | 360,000 | - | - | - | 810,000 | 861,000 | 360,000 |
| නේවාසිකාගාර තැන්පත් | | - | - | - | 15,180,000 | 12,976,000 | 14,301,997 | 15,180,000 | 12,976,000 | 14,301,997 |
| වෙළඳ සහ වෙනත් ණයහිමියෝ | 17 | 605,207,429 | 563,706,893 | 465,816,515 | 708,493,468 | 1,555,864,838 | 1,315,600,866 | 1,313,700,897 | 2,119,571,731 | 1,781,417,381 |
| බැංකු ණය | | - | - | - | 790,589,070 | 570,000,000 | 525,000,000 | 790,589,070 | 570,000,000 | 525,000,000 |
| ජංගම බදු වගකීම | 18 | 23,449,032 | 22,594,757 | (14,955,887) | - | - | - | 23,449,032 | 22,594,757 | (14,955,887) |
| බදු ණය දෙන්නන් | 19 | 86,310,700 | 54,107,231 | 31,000,470 | 3,825,939 | 3,825,940 | 15,727,445 | 90,136,639 | 57,933,171 | 46,727,915 |
| වෙන්කිරීම් | 20 | 767,780 | 400,080 | 377,080 | - | - | - | 767,780 | 400,080 | 377,080 |
| **මුළු ජංගම වගකීම්** | | **716,544,941** | **641,669,961** | **482,598,178** | **1,518,088,477** | **2,142,666,778** | **1,870,630,308** | **2,234,633,423** | **2,784,336,739** | **2,353,228,486** |
| **මුළු හිමිකම සහ වගකීම්** | | **3,060,307,320** | **2,709,254,934** | **2,410,623,714** | **11,079,758,349** | **11,218,648,447** | **10,637,354,161** | **13,340,065,660** | **13,127,903,369** | **12,247,977,864** |

සමූහයේ මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වල අවශ්‍යතාවයන්ට අනුකූල බව මම සහතික කරමි.

............................

**අධ්‍යක්ෂ (මූල්‍ය)**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පාලක සභාව වගකිව යුතුය.

**පාලක සභාව වෙනුවෙන් සහ ඒ වෙනුවෙන් අනුමත කර අත්සන් කර අ**

.......................................... ..........................................

**අධ්‍යක්ෂ ජනරාල්** **පාලක සභා සාමාජික**

**දිනය 2022 අගෝස්තු 16**

**කොළඹ,**

# ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)*

| | | NIBM | | NSBM | | සමූහය | |
|---|---|---|---|---|---|---|---|
| | සටහන් | 2021 දෙසැම්බර් 31 | 2020 දෙසැම්බර් 31 (නැවත ප්‍රකාශිත) | 2021 දෙසැම්බර් 31 | 2020 දෙසැම්බර් 31 | 2021 දෙසැම්බර් 31 | 2020 දෙසැම්බර් 31 (නැවත ප්‍රකාශිත) |
| ආදායම | 21 | 1,354,439,147 | 1,196,641,617 | 3,489,628,698 | 3,299,695,895 | 4,844,067,845 | 4,496,337,512 |
| සෘජු වියදම් | 22 | (697,496,185) | (659,821,095) | (1,086,840,473) | (968,242,405) | (1,784,336,658) | (1,628,063,500) |
| **දළ ලාභය** | | **656,942,962** | **536,820,522** | **2,402,788,225** | **2,331,453,490** | **3,059,731,187** | **2,868,274,012** |
| වෙනත් ආදායම් | 23 | 11,589,193 | 11,881,022 | 6,622,553 | 12,964,712 | 18,211,746 | 24,845,734 |
| පරිපාලන වියදම් | 24 | (477,196,649) | (411,693,892) | (1,010,429,230) | (977,471,660) | (1,487,625,879) | (1,389,165,552) |
| වෙනත් වියදම් | 25 | (7,795,595) | (10,996,992) | (11,750,084) | (8,778,664) | (19,545,679) | (19,775,656) |
| **මෙහෙයුම් තුලින් ලද ලාභය** | | **183,539,911** | **126,010,660** | **1,387,231,464** | **1,358,167,878** | **1,570,771,375** | **1,484,178,538** |
| ශුද්ධ මූල්‍ය පිරිවැය/ ආදායම | 26 | 18,278,499 | 30,768,630 | (592,590,395) | (773,417,081) | (574,311,896) | (742,648,451) |
| **බදු පෙර ලාභය** | | **201,818,410** | **156,779,290** | **794,641,069** | **584,750,797** | **996,459,479** | **741,530,087** |
| බදු වියදම | 27 | (41,903,361) | (28,047,965) | (116,818,197) | (115,782,128) | (158,721,558) | (143,830,093) |
| **වර්ෂයේ ලාභය** | | **159,915,049** | **128,731,325** | **677,822,872** | **468,968,669** | **837,737,921** | **597,699,994** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත වෘත්තීයමය ලාභය / (පාඩුව) | | (1,348,765) | (10,906,638) | 1,670,831 | (1,739,689) | 322,066 | (12,646,327) |
| දේපළ, පිරියත සහ උපකරණ නැවත අගය කිරිම මත ඇති වූ අතිරික්තය | | 52,171,557 | - | - | - | 52,171,557 | - |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම මත ක්‍රියාකාරී ලාභය/(අලාභය) මත බදු බලපෑම | | (7,328,376) | 1,526,929 | (233,916) | 243,556 | (7,562,292) | 1,770,485 |
| විනිමය ප්‍රතිලාභ / පාඩු | | - | - | - | - | - | - |
| | | **43,494,416** | **(9,379,709)** | **1,436,915** | **(1,496,133)** | **44,931,331** | **(10,875,842)** |
| **වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම** | | **203,409,465** | **119,351,616** | **679,259,787** | **467,472,536** | **882,669,252** | **586,824,152** |

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)*

**2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

| **NIBM** | රජයේ දායකත්වය | ප්‍රාග්ධන සහ වෙනත් ප්‍රධාන | අගයකිරිමේ අතිරික්තය | රදවාගත් ඉපයීම් | මුළු හිමිකම |
|---|---|---|---|---|---|
| **2020 ජනවාරි 01 දිනට ශේෂය** | 57,175,767 | 333,037,694 | 247,392,885 | 1,155,567,076 | 1,793,173,422 |
| ගැලපීම | | | | (3,401,739) | (3,401,739) |
| ආදායම් බදු ප්‍රතිපාදන ගැලපීම | | | | | - |
| **ශේෂය 2020 ජනවාරි 1 වන දිනට (නැවත ප්‍රකාශිත)** | **57,175,767** | **333,037,694** | **247,392,885** | **1,152,165,337** | **1,789,771,683** |
| වත්කම් නැවත තක්සේරු කිරීමේ වටිනාකම | - | - | - | - | - |
| වෘත්තීයමය (පාඩු)/රැකියා ප්‍රතිලාභ ලැබීම | - | - | - | (9,379,709) | (9,379,709) |
| වර්ෂය තුළදී ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | - | (1,068,000) | - | 1,068,000 | - |
| ප්‍රාග්ධන ප්‍රදාන වලින් පිළිගත් ආදායම | - | (10,165,667) | - | - | (10,165,667) |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | 128,731,325 | 128,731,325 |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **57,175,767** | **321,804,027** | **247,392,885** | **1,272,584,953** | **1,898,957,632** |
| PPE හි නැවත ඇගයීමේ වටිනාකම | - | - | 52,171,557 | - | 52,171,557 |
| වත්කම් වල නැවත තක්සේරු කිරීමේ වටිනාකම | - | - | (1,174,780) | 1,174,780 | - |
| වෘත්තීයමය (පාඩු)/රැකියා ප්‍රතිලාභ ලැබීම | - | - | - | (1,348,765) | (1,348,765) |
| පස්චාත් රැකියා පුතිලාභ වගකීම මත | | | | | |
| බදු බලපෑමෙහි සැබෑ ලාභ / පාඩු | - | - | - | (7,328,376) | (7,328,376) |
| වර්ෂය තුළදී ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | - | (10,068,107) | - | - | (10,068,107) |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | - | - | - | (15,845,992) | (15,845,992) |
| ප්‍රාග්ධන ප්‍රදාන වලින් පිළිගත් ආදායම | - | - | - | - | - |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | 159,915,049 | 159,915,049 |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **57,175,767** | **311,735,920** | **298,389,662** | **1,409,151,649** | **2,076,452,998** |

| **NSBM** | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවා ගත් ඉපැයීම් | මුළු හිමිකම |
|---|---|---|---|
| **2020 ජනවාරි 01 දිනට ශේෂය** | 800,000,010 | (346,841,433) | 453,158,577 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත සැබෑ ලාභය / (අලාභය). | - | (1,496,133) | (1,496,133) |
| විනිමය ලාභය / (අලාභය) | - | - | - |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය). | - | 468,968,669 | 468,968,669 |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **800,000,010** | **120,631,103** | **920,631,113** |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත සැබෑ ලාභය / (අලාභය). | | 1,436,915 | 1,436,915 |
| විනිමය ලාභය / (අලාභය) | | - | - |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය). | | 677,822,872 | 677,822,872 |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **800,000,010** | **799,890,890** | **1,599,890,900** |

| **සමූහය** | රජයේ දායකත්වය | ප්‍රාග්ධන සහ වෙනත් ප්‍රධාන | අගයකිරිමේ අතිරික්තය | රඳවා ගත් ඉපැයීම් | මුළු හිමිකම |
|---|---|---|---|---|---|
| **2020 ජනවාරි 01 දිනට ශේෂය** | **57,175,767** | **333,037,694** | **247,392,885** | **808,725,623** | **1,446,331,969** |
| ගැලපීම් | - | - | - | (3,401,719) | (3,401,719) |
| ආදායම් බදු ප්‍රතිපාදන ගැලපීම | - | - | - | - | - |
| **2020 ජනවාරි 01 දිනට ශේෂය (නැවත තහවුරු කළ)** | **57,175,767** | **333,037,694** | **247,392,885** | **805,323,904** | **1,442,930,250** |
| PPE හි නැවත ඇගයීමේ අගය | - | - | - | - | - |
| රැකියා ප්‍රතිලාභ මත සැබෑ ලාභ/(අලාභ) | - | - | - | (10,875,842) | (10,875,842) |
| වර්ෂය තුළ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | - | (1,068,000) | - | 1,068,000 | - |
| ප්‍රාග්ධන ප්‍රදාන වලින් හඳුනාගත් ආදායම | - | (10,165,667) | - | - | (10,165,667) |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) (නැවත ප්‍රකාශිත) | - | - | - | 597,699,994 | 597,699,994 |
| විනිමය ලාභය / (අලාභය) | - | - | - | - | - |
| ගෙවා ඇති ලාභාංශ | - | - | - | - | - |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **57,175,767** | **321,804,027** | **247,392,885** | **1,393,216,056** | **2,019,588,735** |
| PPE හි නැවත ඇගයීමේ අගය | - | - | 52,171,557 | - | 52,171,557 |
| රැකියා ප්‍රතිලාභ මත සැබෑ ලාභ /(අලාභ) | - | - | - | (7,240,226) | (7,240,226) |
| පසුගිය වසරවල ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | - | (10,068,107) | - | - | (10,068,107) |
| ප්‍රාග්ධන ප්‍රදාන වලින් හඳුනාගත් ආදායම | - | - | - | - | - |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | 837,737,921 | 837,737,921 |
| ඉවත්කරන වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ වාසිය | | | | | |
| රදවාගත් ඉපයුම් වලට මාරුකරන ලද | - | - | (1,174,780) | 1,174,780 | - |
| රජයේ ඒකාබද්ධ අරමුදලට දායකත්වය | - | - | - | (15,845,992) | (15,845,992) |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **57,175,767** | **311,735,920** | **298,389,662** | **2,209,042,539** | **2,876,343,888** |

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)*

| | NIBM | | NSBM | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| **2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා** | **2021** | **2020 (නැවත ප්‍රකාශිත)** | **2021** | **2020** | **2021** | **2020 (නැවත ප්‍රකාශිත)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය** | | | | | | |
| බදු පෙර ලාභය/ පාඩු | 201,818,435 | 161,112,102 | 794,641,069 | 584,750,797 | 996,459,504 | 745,862,899 |
| **ගැලපීම්;** | | | | | | |
| ක්ෂය වීම | 77,819,379 | 93,589,681 | 448,452,613 | 448,018,547 | 526,271,992 | 541,608,228 |
| ස්ථාවර වත්කම් විකිණීමේදී ශුද්ධ(ලාභය)/පාඩුව | 613,447 | (93,700) | - | - | 613,447 | (93,700) |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | 6,086,169 | 5,256,445 | 7,980,385 | 6,634,879 | 14,066,554 | 11,891,324 |
| ක්‍රමක්ෂය කිරීම් අස්පෘශ්‍ය දේ | 1,187,214 | 505,943 | 13,446,171 | 3,607,567 | 14,633,385 | 4,113,510 |
| කල්දැමූ ආදායම | (10,068,107) | (10,165,667) | - | - | (10,068,107) | (10,165,667) |
| ආයෝජන සඳහා පොලී | (26,656,216) | (38,940,107) | (31,014,488) | - | (57,670,704) | (38,940,107) |
| (අඩු වීම)/ප්‍රතිපාදන වැඩි කිරීම | 48,041,524 | 6,812,858 | - | - | 48,041,524 | 6,812,858 |
| බදු පොලිය | 10,383,546 | 8,660,795 | 1,794,450 | 3,335,139 | 12,177,996 | 11,995,934 |
| වත්කම් ක්‍රමක්ෂ කිරීම භාවිතා කිරීමේ අයිතිය | 85,906,288 | 63,996,619 | 18,936,251 | 35,166,585 | 104,842,539 | 99,163,204 |
| විනිමය ලාභය/ (අලාභය) | - | - | - | - | - | - |
| **ප්‍රාග්ධන වෙනස් කිරීමට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)** | **395,131,679** | **290,734,969** | **1,254,236,451** | **1,081,513,514** | **1,649,368,130** | **1,372,248,483** |
| **කාරක ප්රාග්ධනයේ වෙනස්කම්** | | | | | | |
| ඉන්වෙන්ටරිවල අඩුවීම / (වැඩිවීම). | 2,994,982 | (1,251,590) | (12,209,986) | (2,959,272) | (9,215,004) | (4,210,862) |
| වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු දේවල අඩුවීම / (වැඩිවීම | (93,795,613) | (141,043,814) | (450,816,643) | (137,064,900) | (544,612,256) | (278,108,714) |
| පුස්තකාල තැන්පතු වැඩි වීම/(අඩු වීම) | 168,000 | (216,000) | (153,000) | (130,000) | 15,000 | (346,000) |
| වෙනත් මූල්‍ය නොවන වත්කම්වල වැඩි වීම/(අඩු වීම) | 2,336,225 | 1,693,077 | (2,838,790) | - | (502,565) | 1,693,077 |
| තැන්පතු වැඩි වීම /(අඩු වීම) | (4,312,500) | - | 2,204,000 | (1,325,997) | (2,108,500) | (1,325,997) |
| කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවිය යුතු මුදල් වැඩි කිරීම /(අඩු වී | - | - | - | - | - | - |
| වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු වැඩි වීම /(අඩු වීම) | 41,500,537 | 93,728,989 | (847,371,370) | 240,263,972 | (805,870,833) | 333,992,961 |
| **මෙහෙයුම් වලින් ලද මුදල් (උත්පාදනය කරන ලද)** | **344,023,310** | **243,645,631** | **(56,949,338)** | **1,180,297,318** | **287,073,972** | **1,423,942,949** |
| ගෙවූ බදු | (23,301,729) | (1,231,235) | (9,029,626) | (8,490,119) | (32,331,355) | (9,721,354) |
| ලීසිං පොලී ගෙවා ඇත | - | (8,660,795) | (1,794,450) | (3,335,139) | (1,794,450) | (11,995,934) |
| පාරිතෝෂිත ගෙවීම් | (6,009,210) | (3,748,540) | (790,875) | (1,639,500) | (6,800,085) | (5,388,040) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් / (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය** | **314,712,371** | **230,005,061** | **(68,564,289)** | **1,166,832,560** | **246,148,082** | **1,396,837,621** |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහය** | | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ/ කෙරීගෙන යන වැඩ සඳහා ප්‍රසම්පාදනයන් | (196,272,204) | (42,043,629) | (397,541,266) | (158,175,863) | (593,813,470) | (200,219,492) |
| | | | | | 697,235 | |
| දේපළ, පිරියත සහ උපකරණ අපහරණය ක්‍රියාවලිය | 683,635 | 93,700 | 13,600 | - | | 93,700 |
| ROU අත්පත් කරගැනීම | (66,000,000) | - | - | - | (66,000,000) | - |
| කෙරීගෙන යන වැඩ සඳහා ආයෝජනය | - | - | - | - | - | - |
| පොලී ලැබීම් | 26,656,216 | 38,940,107 | 31,014,488 | - | 57,670,704 | 38,940,107 |
| අස්පෘශ්‍ය වත්කම් අත්කරගැනීම | (1,225,440) | (957,500) | - | - | (1,225,440) | (957,500) |
| ලාභාංශ | - | - | - | - | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් / (භාවිතා කරන) ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(236,157,793)** | **(3,967,322)** | **(366,513,178)** | **(158,175,863)** | **(602,670,971)** | **(162,143,185)** |
| **මූල්‍ය කටයුතු වලින් මුදල් ගලා ඒම** | | | | | | |
| ණය ගැනීම් වලින් ලැබෙන ආදායම | - | - | (68,821,860) | (225,000,000) | (68,821,860) | (225,000,000) |
| කල්බදු ක්‍රියාකාරකම් | (69,911,986) | (47,127,301) | (17,548,825) | (13,769,746) | (87,460,811) | (60,897,047) |
| රජයේ ඒකාබද්ධ අරමුදලට දායකත්වය | (15,845,992) | - | - | - | (15,845,992) | - |
| **මූල්‍ය කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(85,757,978)** | **(47,127,301)** | **(86,370,685)** | **(238,769,746)** | **(172,128,663)** | **(285,897,047)** |
| **වර්ෂය තුළ මුදල් හා මුදල් සමානකම්වල ශුද්ධ වෙනස්කම්** | **(7,203,400)** | **178,910,438** | **(521,448,152)** | **769,886,951** | **(528,651,552)** | **948,797,389** |
| වසරේ ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | 618,044,618 | 439,134,179 | 828,201,995 | 58,315,043 | 1,446,246,612 | 497,449,222 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **610,841,215** | **618,044,618** | **306,753,845** | **828,201,995** | **917,595,060** | **1,446,246,612** |

| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමානකම් | NIBM | | NSBM | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| නියෝජනය කරන්නේ; | **2021** | **2020** | **2021** | **2020** | **2021** | **2020** |
| බැංකුවේ මුදල් | 41,316,863 | 34,627,271 | (206,485,614) | 115,230,314 | (165,168,751) | 149,857,585 |
| අතැති මුදල් | 364,500 | 1,537,507 | 231,150 | 33,812 | 595,650 | 1,571,319 |
| කෙටිකාලීන තැන්පතු | 569,159,852 | 581,879,840 | 513,008,309 | 712,937,868 | 1,082,168,161 | 1,294,817,708 |
| | **610,841,215** | **618,044,618** | **306,753,845** | **828,201,995** | **917,595,060** | **1,446,246,612** |

# 1. ආයතනික තොරතුරු

### 1.1 නෛතික හා ව්‍යවස්ථාපිත ආකෘතිය

1991 අංක 21 දරන සංශෝධන පනතින් සංශෝධනය කරන ලද 1976 අංක 23 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය ස්ථාපිත කරන ලදී. ආයතනය පිහිටා ඇත්තේ අංක 120/5, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපින-යෙහි ය.

### 1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය.

වසර පුරා සිදුකරන ලද ආයතනයේ සහ සමූහයේ කාර්යයන් පහත පරිදි වේ

- ගුණාත්මක ව්‍යාපාර කළමනාකරණ අධ්‍යාපනයේ හා ආශ්‍රිත ක්ෂේත්‍රයන් සඳහා උපදෙස් සැපයීම.
- සංවිධානවල කළමනාකරුවන් හා අධීක්ෂණ කාර්යමණ්ඩල නිපුණතා සංවර්ධනය
- සංවිධානවල සේවකයන් පුහුණු කිරීම හා ඔවුන්ට අධ්‍යාපනය ලබාදීම.
- සංවිධානවල ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා පහසුකම් සැපයීම.
- කළමනාකරණ උපදේශන හා උපදේශක සේවාවන් සැපයීම.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම.

මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධව ආයතනයේ පාලක සභාව වගකියනු ලබයි.

# 2. අදාළ වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 2.1.1 මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLFRS/LKAS) අනුව මූල්‍ය ප්‍රකාශන සකසා ඇත.

මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLAS) වලට අනුකූලව 2011 දෙසැම්බර් 31 අවසන් වූ වසර තෙක්, එම වසර ද ඇතුළත්ව, ක්‍රියාත්මක වන කාලසීමාව සඳහා, ආයතනය මගින් සකසන ලදී.

#### 2.1.2 ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන, වෙළෙඳපොළ වටිනාකම මත ඇතැම් වත්කම් හා බැරකම් හැර සකස්කර ඇත. ඓතිහාසික පිරිවැය පදනම මතයි.

#### 2.1.3 ව්‍යවහාර මුදල් හා ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශනවල ඇති අයිතමයන් මැන ඇත්තේ ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ ඇති මුදල් වලිනි. (ව්‍යවහාර මුදල්) මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කර ඇත්තේ ආයතනයේ ව්‍යවහාර හා ඉදිරිපත් කිරීමේ මුදල් වන ශ්‍රී ලංකා රුපියල්වලිනි.

#### 2.1.4 අනුකූලතා ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශන") යනාදිය සකස් කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමය මගින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS හා SLFRS) වලට අනුකූලව ය.

**2.1.5 ප්‍රවර්තන ව්‍යාපාරය**

පාලක සභාවේ සාමාජිකයන්, ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස පැවතීමට ආයතනයේ හා එහි ඇති හැකියාව තක්සේරු කර ඇති අතර එහි වාණිජ කටයුතු අවසන් කිරීමට හෝ නැවැත්වීමට අදහස් නොකරයි.

**2.1.6 සන්සන්දනාත්මක තොරතුරු**

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ආයතනය මගින් සමානුයෝගීව භාවිතා කරන අතර පෙර වසර සමග ද අනුකූල වේ. මෙම වසරේ ඉදිරිපත් කිරීම/වර්ගීකරණය හා අනුගත වීම පිණිස පෙර වසරේ සංඛ්‍යා හා ස්ථානවල අවශ්‍ය පරිදි වෙනස්කම් සිදුකර ඇත.

**2.1.7 ද්‍රව්‍යාත්මක හා සමාහාර බව**

සමාන අයිතමයන්ගේ සෑම ද්‍රව්‍යාත්මක දේවල් වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර ඇත. වෙනස් අයිතමයන් ද්‍රව්‍යාත්මකව අසමාන නොවන දේවල් නොවන්නේ නම් එකිනෙකට වෙනමම දක්වා ඇත.

**2.1.8 අදාළ වන ගිණුම් විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන**

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී, ආදායම් වියදම් වත්කම් හා බැරකම්වල වාර්තාගත ප්‍රමාණයට බලපාන හා වාර්තා කරන දිනය වන විට ඇති අනිශ්චිත බැරකම් අනාවරණය සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන යනාදිය ඇති කර ගැනීමට කළමනාකාරීත්වයට සිදුවේ.

මීළඟ මූල්‍ය වර්ෂයේ වත්කම් හා බැරකම් ප්‍රමාණවලට ද්‍රව්‍යාත්මක ගැලපුම් සිදු කිරීමේ අවදානමක් ඇති කරන මූල්‍ය තත්ත්ව දිනයට අදාළ ඇස්තමේන්තු අනිශ්චිතතාවයන්ගේ ප්‍රධාන මූලාශ්‍ර සහ අනාගතයට බලපාන ප්‍රධාන උපකල්පනයන් අවධානයට ගෙන ඇත.

**2.2 වත්කම් තක්සේරු කිරීමේ පදනම**

**2.2.1 දේපළ, පිරියත හා උපකරණ**

**(අ) ඇගයීම**

දේපළ, පිරියත හා උපකරණයන්හි සියළු අයිතමයන් මූලික පිරිවැය මත වාර්තා කර ඇත. දේපළ පිරියත හා උපකරණයන්හි අයිතමයන් ප්‍රත්‍යාගණනය කර ඇති විටක, එම වත්කම්වල සමස්ත වර්ගයට ප්‍රත්‍යාගණනය කරනු ලැබ ඇත. එදිනෙදා සේවා, සමුච්ඡිත ක්ෂයවීම් අවමය හා සමුච්චගත හානිකරන සඳහා පිරිවැය හැරුණුකොට දේපළ, පිරියත හා උපකරණ පිරිවැය මත පදනම්ව ඉදිරිපත් කොට ඇත.

වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට ඉදිරියට රැගෙන යන ප්‍රමාණයේ ඕනෑම වැඩි වීමක්, එය නැවත වියදමක් නොවන්නේ නම්, සෘජුවම ප්‍රත්‍යාගණිත අතිරික්තය වෙත බැර කෙරේ. එවන් තත්ත්වයක් යටතේ දී පෙර ලියා තබන ලද වටිනාකමෙහි තරමට එම වැඩිවීම ආදායමක් ලෙස ගණන් ගැනේ. කිසියම් වත්කමක ඉදිරියට ගෙන ආ වටිනාකම ප්‍රත්‍යාගණනයක් හේතුවෙන් අඩු කරනු ලබන්නේ නම් එම අඩු කිරීම වත්කමට අදාළව පැවති පූර්ව වැඩි කිරීමක් ප්‍රතිවර්තනය නොවන්නේ නම් එවිට අදාළ අඩු කිරීම වියදමක් සේ හඳුනා ගැනේ. එවන් අවස්ථාවක දී එකී වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි රඳවා ගනු ලබන වටිනාකම ඉක්මවා අඩු කිරීම නොයන දුරට ප්‍රත්‍යාගණන අතිරික්තය සිදු කෙරේ. වත්කමක් සම්බන්ධයෙන් වන ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි පවත්නා ශේෂයන් සෘජුවම වත්කම් අපහරණය හෝ අවභාවිතය මත සමුච්චිත ලාභ හෝ අලාභයට සෘජුවම මාරු කෙරේ.

**(ආ) දේපළ, පිරියත හා උපකරණයන්හි ඵලදායි ජීවිත කාලය**

එක් එක් වාර්තා කෙරෙන දිනයන් වන විට වත්කම්වල ඵලදායී ජීවිත කාලය හා වත්කම්වල සුන්බුන් අගයන් හඳුනාගෙන, මෙම අගයන් ඇස්තමේන්තු කිරීමේ දී වෘත්තීයමය නිපුණතාවය මත පදනම්ව කළමනාකරණය ගනු ලැබූ විනිශ්චයන්, අනුපාත හා ක්‍රමවේදයන් යනාදිය ආයතනය මඟින් විග්‍රහ කෙරේ.

**(ඇ) ක්ෂය වීම**

වත්කම මත රඳා පවතින අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත රටාව පිළිබිඹු කරන ලෙස දේපළ, පිරියත හා උපකරණයන්හි එක් එක් අයිතමයන්ගේ ඵලදායි ජීවිත කාලය මත තබමින් ලාභ අලාභ ක්ෂය වීම් හඳුනාගෙන ඇත. සින්නක්කර ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

ආර්ථිකමය ඵලදායී ජීවිත කාලයන් පහත පරිදි ය.

| | |
|---|---|
| අස්පෘශ්‍ය වත්කම් | 33.5% |
| ගොඩනැගිලි ඉදිකිරීම් | 2% |
| නවීකරණය | 10% |
| සීලිං විදුලිපංකා | 25% |
| ගිනි නිවන | 20% |
| ගෘහභාණ්ඩ හා උපකරණ | 20% |
| කාර්යාලීය උපකරණ | 20% |
| පරිගණක උපකරණ | 25% |
| මෝටර් වාහන | 25% |
| පුස්තකාල පොත් | 20% |

භාවිතා කිරීම සඳහා වත්කම් ලබාගත් විට ක්ෂය කිරීම ආරම්භ කරන අතර, විකිණීම සඳහා තබා ඇති බවට වර්ගීකරණය කෙරෙන දිනයේ දී හෝ වත්කම ඉවත් කිරීම සඳහා නැවත හඳුනා ගැනෙන දිනයේ දී ක්ෂයවීම අවසන් වේ.

**(ඈ) ප්‍රතිසම්පාදන පිරිවැය**

දේපළ පිරියත හා උපකරණයන්ගේ මුල්වරට හඳුනාගන්නා ලද අනාගත ආර්ථිකමය ප්‍රතිලාභ ප්‍රමිතිය පවත්වාගෙන යාමට හෝ එය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය වන වියදම, වියදමක් ලෙස හඳුනා ගැනේ.

**(ඉ) ඉවත් කිරීම සඳහා නැවත හඳුනාගැනීම**

දේපළ, පිරියත හා උපකරණයන්හි අයිතිමයක් ඉවත් කිරීම සඳහා හඳුනා ගැනෙන්නේ අපහරණය කිරීමේ දී හෝ එය භාවිතයෙන් හෝ අපහරණයෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොලැබෙන විටදී ය. යම් වත්කමක් ඉවත් කිරීම සඳහා හඳුනා ගැනීම තුළින් පැන නගින ලාභයක් හෝ අලාභයක් වත්කමේ ශුද්ධ අපහරණ අගය හා රැගෙන යනු ලබන අගය අතර වෙනස ලෙස ගණනය කිරීමෙන් වත්කම ඉවත් කිරීම සඳහා හඳුනා ගන්නා වසරේ සමස්ත ආදායම් ප්‍රකාශනය තුළට එක් කරනු ලැබේ.

**2.2.2 පවත්වාගෙන යන ප්‍රාග්ධන කාර්යයන්**

වත්කම පළමු වරට උපයෝජනය කරන අවස්ථාවේ දී පවත්වාගෙන යනු ලබන ප්‍රාග්ධන වැඩ අදාළ වත්කම් ගිණුම් වෙතට මාරු කෙරේ.

### 2.2.3 අස්පෘෂ්‍ය වත්කම්

**(අ) හඳුනාගැනීමේ පදනම**

අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගත හැකි වන්නේ, භෞතික පැවැත්මක් නොමැති නමුත් නෛතික හිමිකමක් පවතින මූල්‍ය වත්කම්ය. අස්පෘෂ්‍ය වත්කමක් හඳුනාගත හැක්කේ වත්කමට ආරෝපණය වන අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලායාමේ විභව්‍යතාවක් තිබෙන්නේ නම් පමණි. එසේම වත්කමේ පිරිවැය විශ්වාසී අයුරින් මිනිය හැක්කේ අස්පෘෂ්‍ය වත්කම් පිළිබඳ KLAS 38 අනුව ය.

ආයතනයෙහි අස්පෘෂ්‍ය වත්කම්වලට ඇතුළත් වනුයේ පරිගණක දෘඩාංගයන්හි සමස්ත කොටසක් නොවන ආයතනය විසින් භාවිතය සඳහා අවසරලත් පිරිවැයක් සහිත පරිගණක මෘදුකාංගයන් ය.

**(ආ) ගිණුම් පදනම**

වෙන් වෙන් වශයෙන් අත්පත් කරගන්නා අස්පෘෂ්‍ය වත්කම්හි වටිනාකම් මනිනු ලබන්නේ හඳුනා ගන්නා ලබන ආරම්භක පිරිවැ-යට ය. ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අස්පෘෂ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කළ පිරිවැයට සහ සමුච්චිත හානිකරණ පාඩුවක් තිබෙන්නේ නම් ඒ අනුව ඉදිරියට ගෙන යනු ලැබේ.

**(ඇ) ක්‍රමක්ෂය**

නිශ්චිත භාවිත කාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම් සරල මාර්ග ක්‍රමය භාවිතයෙන් ඵලදායී ආර්ථික ජීව කාලය මත ක්‍රමක්‍ෂය කරනු ලැබේ. ක්‍රමක්‍ෂය ක්‍රමවේදය, ඵලදායී ජීවිත කාලය සහ වටිනාකම් අවම වශයෙන් සෑම වාර්තා කරන දිනයකදීම සමාලෝච-නය කෙරේ.

### 2.2.4 මූල්‍ය නොවන වත්කම් හානිකරණය.

සෑම වර්ගීකරණ දිනයකදීම කිසියම් වත්කමකට හානිකරනයන් පිළිබඳ කිසියම් ලක්ෂණයක් තිබේ දැයි ආයතනය තක්සේරු කරයි. එවන් කිසියම් ලක්ෂණයක් තිබේ නම් හෝ කිසියම් වත්කමකට වාර්ෂික හානිකරන පරීක්ෂාවක් අවශ්‍ය නම් ආයතනයෙහි වත්කම යළි අය කර ගත හැකි ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවක් සකසයි. වත්කමක යළි අයකර ගත හැකි වටිනාකම යනු වත්කමේ උපරිම අගය හෝ වෙළෙඳ ඒකකයෙහි ශුද්ධ වටිනාකම එක් එක් වත්කමෙහි වටිනාකම මත තීරණය කරන අතර එසේ නොවන විටෙක දී සමූහයේ වත්කම් හෝ අනෙකුත් වත්කම් මත ස්වාධීනව විශාල මුදල් ප්‍රවාහයක් ගලා ඒමේ ස්වරූපයක් නොතිබිය යුතු ය. වත්කමක ඉදිරියට ගෙන ආ වටිනාකම යළි අයකර ගත හැකි වටිනාකම ඉක්මවන්නේ නම් වත්කම හානිකරණ වූවා සේ සැලකෙන අතර එය යළි අයකර ගත හැකි වටිනාකමට සටහන් කෙරේ. සඵල වටිනාකම තක්සේරු කිරීමේ දී වත්කමෙහි අවදානම් විශේෂතා සහ මුදලේ කාලීන වටිනාකම නිරූපණය කෙරෙන වර්තමාන වෙළෙඳපොළ තක්සේරුව පිළිබිඹු වන පෙරබදු වට්ටම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් එහි වර්තමාන වටිනාකමට වට්ටම් කෙරේ.

අඛණ්ඩව මෙහෙයුම් හානිකරණ පාඩු ප්‍රත්‍යාගණනය ව්‍යාපාර වස්තුවට ගනු ලබනා අවස්ථාවේ පූර්වයෙන් ප්‍රත්‍යාගණිත දේපළ හැර හානිකරණ වත්කම් ක්‍රියාකාරිත්වයට අනුගත වන වියදම් වර්ගීකරණයන් තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. මෙහිදී හානිකරණය ද ව්‍යාපාරික වත්කම් තුළ හඳුනාගනු ලබන්නේ කවර හෝ පෙර ප්‍රත්‍යගණන අගයක් දක්වා ය.

කීර්තිනාමය හැර අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් පෙර හඳුනාගනු ලැබූ හානිකරන පාඩු තවදුරටත් නොපවතින්නේ ද හෝ අඩු වී ඇත්තේ ද යන්න පිළිබඳ කිසියම් සංඥාවක් වේ දැයි සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරුවක් කරනු ලැබේ. එවැනි තත්ත්වයක් පවතී නම් ආයතනය යළි අය කරගතහැකි ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවක් සකසයි.

පෙරදී හඳුනාගනු ලැබූ හානිකරන පාඩුවක් වෙනස් කරනු ලබන්නේ අවසන් වරට හානිකරණ පාඩුවක් හඳුනාගත් දින පටන් වත්කම්හි යළි අයකර ගතහැකි වටිනාකම තීරණය කිරීම හා භාවිතා කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදුව ඇත්තේ නම් පමණි. තත්ත්වය එසේ වන්නේ නම් වත්කමේ ඉදිරියට ගෙන ආ වටිනාකම එහි යළි අය කරගත හැකි වටිනාකම දක්වා වැඩි කෙරේ. වත්කම සම්බන්ධයෙන් හානිකරන පාඩුවක් හඳුනාගෙන නොමැත්තේ නම් වැඩකරන ලද ඉදිරියට ගෙන යන ලද වටිනාකම තීරණය කරනු ලබන්නේ වත්කම්හි ක්ෂය කළ ශුද්ධ අගයත් හානිකරන පාඩු පූර්ව වර්ෂයත් සම්බන්ධයෙන් හඳුනාගැනීමෙන් පසුව ය. එවන් වෙනස් කිරීමක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

**2.2.5.1. මූල්‍ය උපකරණ**

2018 අප්‍රේල් 01 සිට ක්‍රියාත්මක වේ.

සමූහය සිය මූල්‍ය වත්කම් පහත දැක්වෙන මිනුම් කාණ්ඩ වලට වර්ගීකරණයයි

• සාධාරණ අගයෙන් පසුව මැන බැලිය යුතු ඒවා (OCI හරහා හෝ ලාභ හෝ අලාභ හරහා), සහ

• මැනිය යුතු ක්ෂය කර ඇති පිරිවැය.

වර්ගීකරණය මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා වූ ආයතනයේ ව්‍යාපාර ආකෘතිය සහ මුදල් ප්‍රවාහයේ කොන්දේසි මත රඳා පවතී.

සාධාරණ අගය මනිනු ලබන වත්කම් සඳහා, ලාභ හා අලාභ හෝ OCI හි ලාභ හා අලාභ සටහන් වේ. ව්‍යාපාරය සඳහා නොපැ-වැත්වෙන කොටස් උපකරණ වල ආයෝජනය කිරීම සඳහා, වෙනත් පුළුල් ආදායමක් (FVOCI) තුළින් සාධාරණ ආයෝජනයෙන් සාධාරණ ලෙස ආයෝජනය සඳහා ගිණුම පිළිගැනීම සඳහා මූලික පිළිගැනීමේදී සහය ආපසු හැරවිය නොහැකි කැමැත්තක් පවතිනවාද යන්න මත මෙය රඳා පවතී.

එම සමූහය ණය ආයෝජන නැවත වර්ගීකරණය කරන්නේ එම වත්කම් කළමනාකරණය කිරීමේ ව්‍යාපාර ආකෘතිය වෙනස් වූ විට සහ පසුව පමණි.

**(අ) පිළිගැනීම සහ අවතක්සේරු කිරීම**

මූල්‍ය වත්කම් සත්‍ය ආකාරයෙන් මිලදී ගැනීම් සහ විකිණීම් වෙළඳ දිනයේදී හඳුනා ගන්නා අතර, එය වත්කම් මිලදී ගැනීම හෝ විකිණීම ආයතනය සිදු කරන දිනය වේ. ආයතනය හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස වෙනස් කිරීම සහ වත්කම් කල් ඉකුත් වීම හෝ වෙනස් කර ඇති මූල්‍ය වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් වී ඇති විට හෝ මාරු කර ඇති විට මූල්‍ය වත්කම් ලෙස එය හඳුනා නොගනී.

**(ආ) මිණුම්**

මූලික හඳුනාගැනීමේදී සමූහය මූල්‍ය වත්කමක් එහි සාධාරණ අගයෙන් ලෙස සහ සාධාරණ අගයක් නැති මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් ගත් කල, ලාභයෙන් හෝ අලාභයෙන් (FVPL) මූල්‍ය අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මිනුම් කර ඇත.

මූල්‍ය වත්කම් වල ගණුදෙනු පිරිවැය ලාභයෙන් හෝ අලාභයෙන් ගලපනු ලැබේ. තැන්පත් කරන ලද ව්‍යුත්පන්නයන් සහිත මූල්‍ය වත්කම් මුළුමනින්ම සලකා බලනුයේ ඒවායේ මුදල් ප්‍රවාහයන් තනිකරම මූලික අගය සහ පොලී ගෙවීමද යන්න තීරණය කිරීමේදීය.

IFRF 9 ට අනුව පසු කාලීනව ණය උපකරණ මැනීම, වත්කම් කළමනාකාරණය සඳහා ව්‍යාපාරික ආකෘතිය සහ වත්කම් වල මුදල් ප්‍රවාහයේ ස්වභාවය මත රඳා පවතී. ආයතනය විසින් මෙය ප්‍රධාන මිණුම් ඛාණ්ඩ 3ක් යටතේ වර්ගීකරණය සිදු කරයි.

• ගෙවන ලද පිරිවැය: ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා තබා ඇති වත්කම්, එම මුදල් ප්‍රවාහයන් නියෝජනය කරන්නේ මූලික මුදල සහ පොලී ගෙවීම් පමණක් වන අතර, ගෙවනු ලබන්නේ මිලදී ගත් වටිනාකම වේ. මෙම මූල්‍යමය පොලී ආදායම ඵලදායි පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් වත්කම් මූල්‍ය ආදායමට ඇතුළත් වේ. මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් අවලංගු කිරීම සෘජුවම ලාභය හෝ අලාභය ලෙස හඳුනාගෙන වෙනත් ලාභ/පාඩු සමග ඉදිරිපත් කෙරේ. ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ දුර්වලතා හෝ පාඩු වෙන වෙනම රේඛීය අයිතමයක් ලෙස දක්වා ඇත.

• FVOCI: වත්කම් වල මුදල් ප්‍රවාහයන් නියෝජනය කරන්නේ කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම සඳහා තබා ඇති වත්කම්, මූලික හා පොලී ගෙවීම් සඳහා පමණක් FVOCI මගින් මනිනු ලැබේ. ලාභයේ හෝ අලාභයේ දී පිළිගැනෙන දුර්වලතා ලාභ හෝ පාඩු, පොලී ආදායම සහ විදේශ විනිමය ලාභ හා අලාභය හඳුනා ගැනීම හැර, රැගෙන යන ප්‍රමාණයේ සංචලනය OCI හරහා ගනු ලැබේ. මූල්‍ය වත්කම් අවතක්සේරු කළ විට, OCI හි කලින් හඳුනාගෙන තිබූ සමුච්චිත ලාභ හෝ අලාභය සාධාරණත්වයේ සිට ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කර වෙනත් ලාභ/අලාභයන්හිදී හඳුනා ගැනේ. ඵලදායී පොලී අනුපාත ක්‍රමය උපයෝගී කරගනිමින් මෙම මූල්‍ය වත්කම් වලින් ලැබෙන පොලී ආදායම මූල්‍ය ආදායමට ඇතුළත් වේ. විදේශ විනිමය ලාභ හා අලාභයන් වෙනත් ලාභ/(පාඩු) වලින් ද, අඩුපාඩු පිරිවැය ලාභ හෝ අලාභ ප්‍රකාශයන්හි වෙනම රේඛීය අයිතමයන් ලෙස ද ඉදිරිපත් කෙරේ.

• FVPL: සංස්ථාපිත පිරිවැය හෝ FVOCI සඳහා වන නිර්ණායකයන්ට අනුකූල නොවන වත්කම් මනිනු ලබන්නේ FVPL ක්‍රමයෙනි. ණය ආයෝජනයක ලාභයක් හෝ අලාභයක් පසුව FVPL හිදී මනිනු ලබන අතර එය ලාභ හෝ අලාභය වශයෙන් පිළිගෙන එය ඇති වූ කාල සීමාව තුළ වෙනත් ලාභ/(අලාභ) තුළ ශුද්ධ ලෙස ඉදිරිපත් කෙරේ.

පසුව සමූහය සියළුම සාධාරණ ආයෝජන සාධාරණ අගයකින් මනිනු ඇත. OCI හි කොටස් ආයෝජන වල සාධාරණ වටිනාකම් ලැබීම් හා අලාභයන් ඉදිරිපත් කිරීමට සමූහයේ කළමනාකාරිත්වය තෝරාගෙන ඇති අවස්ථාවක, ආයෝජනය අවලංගු කිරීමෙන් පසු ලාභ හා අලාභ සඳහා සාධාරණ වටිනාකම් ලාභ හා පාඩු නැවත වර්ගීකරණය කිරීමක් සිදු නොවේ. සමූහයේ ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ විට එවැනි ආයෝජන වලින් ලැබෙන ලාභාංශ ලාභයෙන් හෝ අලාභයෙන් වෙනත් ආදායමක් ලෙස පිළිගැනේ.

FVPL හි මූල්‍ය වත්කම් වල සාධාරණ අගයේ වෙනස්වීම් අදාළ වන පරිදි ලාභ හෝ අලාභ ප්‍රකාශයේදී වෙනත් ලාභ/පාඩු ලෙස පිළිගනු ලැබේ. FVOCI හි මනිනු ලබන කොටස් ආයෝජන වල දුර්වලතා පාඩු (දුර්වලතා, පාඩු සහ ආපසු හැරවීම) සාධාරණ අගයේ අනෙකුත් වෙනස්වීම් වලින් වෙන වෙනම සිදු නොකෙරේ.

#### 2.2.5.1.2 පසු මිණුම්

මූල්‍ය වත්කම් පසුව මැනීම පහත සඳහන් පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී

**(අ) ණය සහ ලැබීම්**

ණය සහ ලැබීම් යනු ක්‍රියාකාරී වෙළඳපොල තුල සඳහන් කර නැති ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ය. මූලික මිනුම් කිරීමෙන් පසුව, එවැනි මූල්‍ය වත්කම් පසුව ඵලදායී පොලී අනුපාත ක්‍රමය (EIR) භාවිතාකරමින් ක්‍රමක්ෂය සහ පිරිවැය මනිනු ලැබේ. EIR හි අනිවාර්ය අංගයක් වන අත්පත් කරගැනීමේ ගාස්තු හෝ වියදම් සඳහා යම් වට්ටමක් හෝ වාරිකයක් සිදුකරන්නේ නම් එය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය ගලපන ලද පිරිවැය ගණනය කරනු ලැබේ. මූල්‍ය වියදම් වල විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ දුර්වලතාවයන් නිසා පැනනගින පාඩු/අලාභ හඳුනාගත හැකිය.

වෙළඳපොල පොලී අනුපාතයට වඩා අඩුවෙන් ලබා දෙන ණය සමාන නිෂ්පාදන වල වෙළඳපල පොලී අනුපාත මත පදනම්ව ගණනය කර ඒවායේ සාධාරණ අගයෙන් මනිනු ලැබේ. අනුබද්ධ සමාගම ඔවුන්ගේ ණය සාධාරණ වටිනාකමකින් තක්සේරු කර නොමැත.

ලැබිය යුතු ණය වෙළඳාමෙන් සහ අනෙකුත් ලැබීම් වලින් සමන්විත වේ.

#### 2.2.5.1.3 හඳුනා ගැනීම ඉවත් කිරීම

මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක කොටසක් හෝ ආයතනයේ සමාන මූල්‍ය වත්කම් කොටසක් හෝ, අදාළ වන විට) අවලංගු කරනු ලබන්නේ,

- වත්කම් වලින් මුදල් ගලා ඒමේ අයිතිය කල් ඉකුත් වී ඇත.
- වත්කම් වලින් මුදල් ගලා ඒම සඳහා කණ්ඩායම තම අයිතිය පැවරී ඇත හෝ ඒ සඳහා වගකීමක් භාරගෙන ඇත. ලැබුණු මුදල් ප්‍රවාහයන් 'Pass-throgh' විධිවිධානය යටතේ තුන්වන පාර්ශවයකට ද්‍රව්‍යමය ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ගෙවන්න ඇති හෝ
- සමූහය වත්කම් වල සියළුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති, නැතහොත්
- සමූහය වත්කම් වල සියළුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර හෝ තබා නැති, නමුත් වත්කම් පාලනය මාරු කර ඇති අවස්තාවන්හිදීය.

වත්කම්වලින් මුදල් ගලා ඒම සඳහා සමූහය තම අයිතිය පැවරූ විට හෝ විධිවිධානය හරහා අවසර පත්‍රයකට ඇතුළු වී වත්කම්වල ඇති අවදානම් සහ ප්‍රතිලාභයන් සැලකිය යුතු ලෙස මාරු නොකළහොත් හෝ රඳවා නොගෙන හෝ එහි පාලනය මාරු නොකළ විට වත්කම් පිළිගනු ලැබේ. සමූහයේ එයට අඛණ්ඩව සම්බන්ධ වීමේ ප්‍රමාණය. එම අවස්ථාවෙහිදී, සමූහයම ඊට සම්බන්ධ වගකීමක් ද පිළිගනී. මාරු කරන ලද වත්කම් සහ ඒ ආශ්‍රිත වගකීම් මනිනු ලබන්නේ සමූහය විසින් රඳවාගෙන ඇති අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබිඹු වන පදනමක් මත ය. මාරු කරන ලද ඇපකරයක ස්වරූපය ගන්නා වත්කම්වල අඛණ්ඩ සහභාගීත්වය මනිනු ලබන්නේ මූලිකව රැගෙන යන ප්‍රමාණයට පහළින් සහ සමූහයට ආපසු ගෙවීමට අවශ්‍ය වන උපරිම සලකා බැලීමේදී ය.

#### 2.2.5.1.4 මූල්‍ය වත්කම් වල දුර්වලතා

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අඩපණ වූ බවට සාක්ෂි තිබේ දැයි සමූහය සෑම වාර්තාකරන දිනයකම තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හෝ වත්කම් මූලික වශයෙන් පිළිගැනීමෙන් පසු සිදු වූ සිදුවීම් එකක් හෝ වැඩි ගණනක (සිදු වූ පාඩු හෝ සිදුවීමක්) හේතුවෙන් වාස්තවික සාක්ෂි තිබේ නම් එම පාඩු සිදුවීම මූල්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයට හෝ විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කම් සමූහයට බලපෑමක් ඇති කරයි. ණය ගැතියන් හෝ ණය ගැති කණ්ඩායමක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, පැහැර හැරීම හෝ පොලී හෝ මූලික ගෙවීම් අවම වීම, ඔවුන් බංකොලොත් භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළු වීමේ සම්භාවිතාව සහ නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් පෙන්නුම් කෙරෙන බව ඇඟවීම් ඇතුළත් විය හැකිය. මෙය හිඟ මුදල් වල වෙනස්වීම් හෝ පැහැර හැරීම් සමඟ සහ සම්බන්ධිත ආර්ථික තත්වයන් වැනි ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයේ මැනිය හැකි බව අඩු වීම මත සිදුවේ.

#### 2.2.5.1.5 මූල්‍ය වත්කම් ක්ෂය කළ පිරිවැය මත

මූල්‍ය වත්කම් සඳහා, සමූහය මුලින්ම තක්සේරු කරන්නේ පුද්ගලිකව කැපී පෙනෙන මූල්‍ය වත්කම් සඳහා සාමූහිකව හෝ සැලකිය යුතු නොවන පරිදි මූල්‍ය වත්කම්වල දුබලතා පිළිබඳ වාස්තවික සාක්ෂි තිබේද යන්න මත වේ. තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා සැලකිය යුතු හෝ නැති දුබලතා පිළිබඳ සාක්ෂි නොමැති බව සමූහය විසින් තීරණය කරන්නේ නම්, එයට සමාන ණය අවදානම් ලක්ෂණ ඇති මූල්‍ය වත්කම් සමූහයක වත්කම ඇතුළත් වන අතර ඒවා දුර්වලතා සඳහා සාමූහිකව තක්සේරු කරයි. දුර්වලතා සඳහා තනි තනිව තක්සේරු කරන ලද සහ දුර්වලතා අලාභයක් සිදු වූ බව අඛණ්ඩව පිළිගත් වත්කම්, දුර්වලතා පිළිබඳ සාමූහික තක්සේරුවකට ඇතුළත් නොවේ.

දුර්වලතා අලාභයක් සිදුවී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේ නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කම් ගෙන යන ප්‍රමාණයේ සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම අතර වෙනස (මෙතෙක් සිදු නොවූ අනාගත අපේක්ෂිත ණය පාඩු හැර) ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කම් වල මුල් ඵලදායී පොලී අනුපාතයෙන් වට්ටම් කෙරේ. ණයක් සඳහා විකල්ප පොලී අනුපාතයක් තිබේ නම්, යම් දුර්වලතා අලාභයක් මැනීම සඳහා වන වට්ටම් අනුපාතය වර්තමාන ඵලදායී පොලී අනුපාතය වේ.

දීමනාවක් භාවිතා කිරීම තුළින් වත්කම්වල ගෙන යන ප්‍රමාණය අඩු වන අතර, අලාභයේ ප්‍රමාණය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළින් හඳුනා ගැනෙන අතර පොලී ආදායම අඛණ්ඩව එකතු වෙමින් පවතී. ඉදිරියට ගෙන යන ප්‍රමාණය අඩු කළ අතර අනාගත මුදල් ගලා ඒම වට්ටම් කිරීම සඳහා භාවිතා කරන පොලී අනුපාතය උපචිත කෙරේ.

දුර්වලතා පාඩුව මැනීමේ අරමුණ. පොලී ආදායම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස සටහන් වේ. අනාගත ප්‍රතිසාධනය සඳහා යථාර්ථවාදී අපේක්ෂාවක් නොමැති විට සහ සියලු ඇපකරයන් සාක්ෂාත් වූ විට හෝ ඒ වෙත මාරු කළ විට ඒ ආශ්‍රිත දීමනාව සමඟ ණය කපා හැරේ. සමූහය පසු වර්ෂයකදී, දුර්වලතාවය හඳුනා ගැනීමෙන් පසුව සිදුවන සිදුවීම-ක් හේතුවෙන් ඇස්තමේන්තුගත හානියේ පාඩුවන ප්‍රමාණය අඩු හෝ වැඩි වුවහොත්, දුර්වලතාව දීමනා ගිණුම සකස් කිරීමෙන් පාඩුව වැඩි හෝ අඩු කරනු ලැබේ. අනාගත කපා හැරීමේන් පසුව අය කර ගත හොත්, ප්‍රතිසාදන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට බැර කෙරේ.

වසරකට වැඩි කාලයක් සඳහා ගෙවීමට ඇති වෙළෙඳ ලැබිය යුතු මුදල් දුර්වලතා සඳහා සපයනු ලැබේ.

**2.2.5.2.1 මූලික හඳුනා ගැනීම හා ගණනය කිරීම.**

සියලුම මූල්‍ය බැරකම් වෙළෙඳපොළ වටිනාකම මත හඳුනා ගැනේ. මෙයට සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය ඇතුළත් වේ. ආයතනයේ මූල්‍ය බැරකම්වලට වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දේවල්ද ඇතුළත් වේ.

**2.2.5.2.2 පසුව කරන ගණනය කිරීම.**

මූල්‍ය බැරකම් ගණනය කිරීම ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

**(අ) අනෙකුත් මූල්‍ය බැරකම්**

ආයතනයේ අනෙකුත් මූල්‍ය බැරකමවලට වෙළෙඳ හා අනෙක් ගෙවීම් ඇතුළත් වේ.

**2.2.5.2.3 නැවත හඳුනා ගැනීම**

මූල්‍ය වත්කමක් ඉවත් කිරීම සඳහා යළි හඳුනා ගනු ලබන්නේ බැරකම යටතේ වන බැඳීම නිදහස් හෝ අවලංගු හෝ කල් ඉකුත් වූ විට ය. පවත්නා මූල්‍ය බැරකමක්, වෙනස් කොන්දේසි මත එකම සැපයුම්කරු වෙතින් ලබාගත් මූල්‍ය බැරකමක් මගින්. හිලව් කරනු ලබන කල්හි හෝ පවත්නා බැරකමක් කොන්දේසි අවශ්‍ය පරිදි නවීකරණය කරන ලද කල්හි එවන් හුවමාරුවක් හෝ නවීකරණයක් නියම බැරකමෙහි යළි හඳුනා ගැනීමක් හා නවන බැරකමක හඳුනාගැනීමක් ලෙස සැලකෙන අතර ඉදිරියට ගෙන එනු ලබන අදාළ වටිනාකමෙහි වෙනස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

**2.2.5.3 මූල්‍ය උපකරණයන්හි හිලව් කිරීම.**

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන්නේ මූල්‍ය ශේෂ පත්‍ර දිනට වාර්තා වන ශුද්ධ අගය මත වන අතර අවශ්‍ය වන්නේ නම් හෝ නීත්‍යානුකූල ලෙස අවශ්‍ය වන්නේ නම් ශුද්ධ පදනම මත හඳුනා ගත් වත්කම් හා වගකීම් ඒවායේ උපලබ්දි අගය මත හිලව් කෙරේ.

**2.2.6. භාණ්ඩ ලේඛනය**

භාණ්ඩ ලේඛනය ලිපි ද්‍රව්‍ය හා නිල මුද්‍රා යන්ත්‍රවලින් සමන්විත වන අතර ඒවායේ වටිනාකම ගණනය කරනුයේ පිරිවැය මත ය.

**2.2.7 වෙළෙඳ හා අනෙකුකත් ලැබිය යුතු දෑ**

මුල් අවස්ථාවේ දී වෙළෙඳ ලැබීම් වෙළෙඳපොළ වටිනාකම මත හඳුනා ගැනෙන අතර පසුව එය ගණනය කරනු ලබන්නේ හානි-කරනයන් හා වෙන් කිරීමෙන් පසු ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය මතයි.
හානිකරණයක් සඳහා වෙන් කිරීමෙන් පසු ශුද්ධ අගය තක්සේරු කිරීම මත අනෙකුත් ලැබීම් සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

**2.2.7.1 බොල් හා අඩමාන ණය වෙන් කිරීම**

එක් වසරකට අදාළ ණයගැතියන් හැර අනෙකුත් අය අඩමාන ණය ලෙස සැලකෙන අතර මේ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

**2.2.8 මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් හා මුදල් සමාන අනෙකුත් දෑ ලෙස අත ඉතිරි මුදල් හා ඉල්ලුම් තැන්පතු ලෙස අර්ථ දැක්වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශ සම්බන්ධයෙන් ගත් කල මුදල් හා මුදල් සමාන දෑ, අත ඉතිරි මුදල්, බැංකු තැන්පතු හා ශුද්ධ හිඟ බැංකු අයිරාවන්ගෙන් සමන්විත වේ.

## 2.3 බැරකම් හා ප්‍රතිපාදන

### 2.3.1 බැරකම්

මූල්‍ය ශේෂ පත්‍රයේ ජංගම බැරකම් යටතේ වර්ගීකරණය කරන ලද බැරකම් වන්නේ මූල්‍ය ශේෂ පත්‍ර දින සිට වසරක් තුළ කල් පිරෙන බැරකම් ය. ජංගම නොවන බැරකම් ලෙස වර්ගීකරණය කෙරෙන අයිතම වන්නේ මූල්‍ය තත්ත්ව දිනයේ සිට වසරකට පසු යම් අවස්ථාවක කල් ඉකුත් වීමට නියමිත අයිතමයන් ය.

### 2.3.2 ප්‍රතිපාදන, ආපාතික වත්කම් හා ආපාතික බැරකම්

බැරකම් පියවීම සඳහා ආර්ථික වාසි ඇතුළත් සම්පත් විගලනයක් සඳහා ඉඩ ඇති හා බැරකමේ ප්‍රමාණයෙන් විශ්වාසනීය ඇස්තමේන්තුවක් පිළියෙළ කළ හැකි විට දී අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආයතනයට වර්තමාන බැරකම් පවත්නා අවස්ථාවල දී (නෛතික හා ප්‍රගතිකාරක) ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. බැරකමට විශේෂිත වන්නා වූ අවදානම් හා මුදලේ කාලීන අගය පිළිබඳ වර්තමාන වෙළෙඳපොළ තක්සේරු පිළිබිඹු කරන්නා වූ පෙර බදු අනුපාතිකයක අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීම මගින් ප්‍රතිපාදන තීරණය කෙරේ.

### 2.3.3 වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලියෙහි දී ලබාගන්නා ලද සේවාවන් සඳහා ගෙවීමට ඇති බැඳීම් වෙළෙඳ ගෙවීම් වේ. මේවා වසරක් ඇතුළත හෝ ඊට අඩු කාලයක් තුළ ගෙවීමට නියමිත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර එසේ නොවන්නේ නම් ඒවා ජංගම නොවන බැරකම් ලෙස සැලකේ.

මුල් අවස්ථාවේ දී වෙළෙඳ ගෙවීම් වෙළෙඳපොළ වටිනාකම මත හඳුනා ගැනෙන අතර පසුව එය ඵලදායී පොලී ක්‍රම ය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැය මත ගණනය කෙරේ. වට්ටමේ බලපෑම භෞතික නොවන හෙයින් සඳහන් කරන ලද පොලී අනුපාතිකයක් නොමැති කෙටිකාලීන ගෙවීම් මුල් ඉන්වොයිසියේ වටිනාකම මත ගණනය කෙරේ.

### 2.3.4 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

#### (අ) නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම්

සේවකයකු විශ්‍රාම ගැනීමේ දී ලැබෙන විශ්‍රාම ප්‍රතිලාභ ප්‍රමාණය පාරිතෝෂික ප්‍රතිලාභ සැලසුම් මඟින් නිර්වචනය කෙරේ. බොහෝ විට මෙය වයස, සේවය කල වසර ගණන හා වන්දි වැනි සාධක එකක් හෝ කීපයක් මත පදනම් වේ. 1983 අංක 13 දරන පනත යටතේ මෙම නිර්වචනය කරන ලද ලබාදෙන පාරිතෝෂික ප්‍රතිලාභ මෙම සැලසුමෙහි දැක්වේ. සේවක ප්‍රතිලාභ පිළිබඳ LKAS 19 හි සඳහන් සූත්‍ර ක්‍රමයට අනුකූල වන සේ විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

වෙන් කරන ලද අරමුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කෙරේ.

#### (ආ) නිර්වචනය කරන ද දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි අනුව සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයන් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් දායකත්වයන් සඳහා හිමිකම් ඇත. ආයතනය සේවකයන්ගේ දළ වේතනවලින් පිළිවෙළින් 12% හා 3% ක දායකත්වයක් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට ලබාදෙයි.

### 2.3.5 ජංගම හා විලම්භිත බදු

**(අ) ප්‍රවර්තන බදු**

දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත ගෙවීමට හෝ ඔහුගෙන් අයකර ගනු ලැබීමට අපේක්ෂිත ප්‍රමාණය මත වර්තමාන හා පූර්ව කාල පරිච්ඡේදයන් සඳහා වර්තමාන ආදායම් බදු වත්කම් හා බැරකම් ගණනය කෙරේ.

ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම් මූලයන් මත පදනම්ව හා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව ගණනය කෙරේ.

**(ආ) විලම්භිත බදු**

වත්කම් හා බැරකම්හි බදු පදනම් අතර මූල්‍ය තත්ත්වයනට අදාළ දිනයෙහි තාවකාලික වෙනස්වීම් මත බැරකම් ක්‍රමවේදය හා මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා ඉදිරියට ගෙන එනු ලබන ප්‍රමාණයන් භාවිතා කරමින් විලම්භිත බදු ප්‍රතිපාදනය කෙරේ.

සියළු තාවකාලික වෙනස්වීම් සම්බන්ධයෙන් විලම්භිත බදු වත්කම් හා බැරකම් හඳුනා ගැනිණි. අඩු කළ හැකි සියලු තාවකාලික වත්කම් මත විලම්භිත බදු හඳුනා ගන්නා අතර භාවිතා නොකළ බදු බැර හා භාවිතා නොකළ බදු අලාභ තාවකාලික වෙනස්කම් මත අඩු කළ හැකි ඉදිරියට ගෙන යන ලද බදු බැර හා බදු අලාභ භාවිතා කරමින් විලම්භිත බදුකරණය සඳහා යොදා ගැනේ. ඉදිරියට ගෙන එනු ලබන විලම්භිත බදු වත්කම් සෑම ශේෂ පත්‍ර දිනක ම සමාලෝචනය කෙරේ. විලම්භිත බදු වත්කම්වලින් වර්තමාන බදු අයවන ලාභය අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ. හඳුනා ගනු ලබන බදු ආදායම් නැවත තක්සේරු කරන අතර ශේෂ පත්‍ර දිනට පැවති හඳුනාගනු ලබන ප්‍රමාණයන් අනාගත බදු වන ආදායම් මත විලම්භිත වත්කම් හිලව් කළ හැක.

ශේෂ පත්‍ර දිනට බලාත්මක වී ඇත්තා වූ හෝ ප්‍රමාණවත් ලෙස බලාත්මක වී ඇත්තා වූ බදු අනුපාත හා බදු නීති මත පදනම්ව වත්කම උපලබ්දි වන හෝ වගකීම පියවන වසරට අදාළ කර ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතික මත විලම්භිත බදු වත්කම් හා වගකීම් ගණනය කෙරේ.

ව්‍යාපාරයේ ඍජුවම ආදායම් බදුවලට අදාළ වන අයිතම තනි ඒකකයක් මත සිදු කෙරේ. ජංගම බදු වත්කම් වලට ජංගම බදු වගකීම් හිලව් කිරීමට නෛතික බලාත්මක හිමිකමක් තිබෙන්නේ නම් සහ එම බදු අය කළ හැකි ඒකක හා බදු අධිකාරිය විලම්භිත බදුවලට අදාළ වන්නේ නම් විලම්භිත බදු වත්කම් හා විලම්භිත බදු වගකීම් හිලව් කරනු ලැබේ.

### 2.3.6 අරමුදල්

රජයේ ප්‍රදානයන්හි නිර්ණායකයන් ඉටු නොකරන්නා වූ ප්‍රදානයන් ඒකක යටතේ වන අරමුදල් සේ හඳුනාගෙන තිබේ.

### 2.3.7 ප්‍රදානයන් හා සහනාධාර

සහනාධාර හා ප්‍රදානයන් සාපේක්ෂ පිරිවැය සමඟ ගැලපීමට අවශ්‍ය වන කාලය මත ආදායම් ප්‍රකාශයට බැර කෙරෙන අතර ඒවා ක්‍රමානුකූල පදනමක් මත හානි පූර්ණය කිරීමට අපේක්ෂා කෙරේ.

වෙළෙඳපොළ වටිනාකම මත වන මූල්‍ය නොවන ප්‍රදානයන් ඇතුළුව වත්කම්වලට අදාළ ප්‍රදානයන් ශේෂ පත්‍රයෙහි දී විලම්භනය කෙරෙන අතර අදාළ වත්කමේ ඵලදායී ජීව කාලය අනුව ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

ආදායමට අදාළ ප්‍රදානයන් ඒවා ලබා ගත හැකි කාලය තුළ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ.

## 2.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

### 2.4.1.1 ආදායම් හඳුනා ගැනීම

**(අ) පුහුණු උපදේශන සේවා හා ඵලදායිතාව මගින් ලැබෙන ආදායම**

ආර්ථික ප්‍රතිලාභයන් ආයතනයට ගලා එන මට්ටම අනුව ආදායම හඳුනා ගැනේ. ලැබුණු හෝ ලැබීමට නියමිත ප්‍රතිලාභයෙහි වෙළෙඳපොළ වටිනාකම ආදායම ගණනය කෙරේ.

**(ආ) පොලී ආදායම**

පොලී ආදායම එළදායී පොලී ක්‍රමය භාවිතයෙන් හඳුනා ගැනේ.

**(ඇ) ලාභාංශ ආදායම**

ගෙවීම් හිමිකම් ලැබීමේ ක්‍රමයක් ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනා ගැනේ.

**(ඈ) වෙනත්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

**(ඉ) ලාභ හා අලාභ**

ආයෝජන ඇතුළුව, දේපළ, පිරියත, උපකරණ හා අනෙක් ජංගම නොවන වත්කම් අපහරණය මත ආදායම් ස්වභාවයේ කිසිදු ලාභයක් හෝ අලාභයක් අපහරණ ක්‍රියාවලියෙන් අඩු කර ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර නැත. වත්කම් හා ආශ්‍රිත දේපළවල ඉදිරියට ගෙනා වටිනාකම්, එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි ඉතිරිව පවත්නා පිරියත හා උපකරණ ප්‍රමාණය සමුච්චිත ලාභ හා අලාභ වෙත සෘජුවම මාරු කෙරේ.

### 2.4.2 වියදම් හඳුනාගැනීම

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වියදම් හඳුනා ගනු ලබන්නේ හටගත් පිරිවැය හා ආදායමේ විශේෂිත අයිතමයක ඉපැයුම් යන දෙකෙහි සෘජු සබඳතාව මත ය. ව්‍යාපාරය පවත්වාගෙන යාම හා කාර්යක්ෂම ආකාරයකින් දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීම මත හට ගන්නා සියලු වියදම් වසරේ ලාභයට ගැනෙනා ආදායමට ගළපා ඇත.

## 2.5 පොදු

### 2.5.1 වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසාන වීමෙන් පසු සිදුවීම්.

#### 2.5.1.1. මූල්‍ය ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.

මූල්‍ය ශේෂ පත්‍ර දිනට පසු සිදු වූ සියලුම සිදුවීම් සලකා බලන ලද අතර මූල්‍ය වාර්තාවල අදාළ සටහන්හි අවශ්‍ය වෙනස්කම් හා අනාවරණයන් සිදු කරන ලදී.

#### 2.5.1.2 අවිනිශ්චිතතාවන් හා හඳුනා නොගත් ගිවිසුම්ගත බැඳීම්.

අවිනිශ්චිතතාවන් යනු අතීත සිදුවීම් තුළින් පැන නැගෙන්නා වූ අසම්භාව්‍ය වත්කම් හෝ වගකීම් වේ. එසේම ඒවා තහවුරු කරනු ලබන්නේ ආයතනයේ පාලනයෙන් බැහැර වන්නා වූ අවිනිශ්චිත අනාගත සිදුවීම් හටගැනීම හෝ හට නොගැනීම මත පමණි.

### 2.5.2 අදාළ පාර්ශ්ව ගනුදෙනු

මෙහිදී මිලක් අය කරන්නේ ද යන්න නොතකා ආයතනයට අනෙකුත් පාර්ශවවල මූල්‍ය හා මෙහෙයුම් තීරණ/ප්‍රතිපත්ති පාලනය කිරීමට හෝ ඒ මත වැදගත් බලපෑමක් කිරීමට හැකියාවක් ඇති ගනුදෙනු සම්බන්ධයෙන් අනාවරණයන් කෙරේ.

### 2.5.3 අවධි ගිණුම්කරණ ඇස්තමේන්තු හා විනිශ්චයන්

ආයතනය අනාගතය සම්බන්ධ උපකල්පනයන් සිදු කරයි. ඒ අනුව කෙරෙන ගිණුම්කරණ ඇස්තමේන්තු නිර්වචනාත්මකව බොහෝ විට අදාළ සත්‍ය ප්‍රතිඵල හා සමාන වේ. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් හා වගකීම් හි ඉදිරියට ගෙනෙනා ශේෂයට භෞතික ගැලපුම් කිරීමේ කැපී පෙනෙන අවදානමක් ඇත්තා වූ ඇස්තමේන්තු හා උපකල්පනයන් පහත සාකච්ඡා කෙරේ.

**(අ) දේපළ, උපකරණ හා පිරියතනවලට අදාළ වන සඵල ආයුකාලය සහ සුන්බුන් අගය**

දේපළ, උපකරණ හා පිරියතනවලට අදාළ වන සඵල ආයුකාලය සහ සුන්බුන් අගය පිළිබඳව වන ඇස්තමේන්තු යෝග්‍ය වන්නේ ද සහ ඊට අදාළ ගිණුම්කරන ප්‍රමිතියට අනුකූල දැයි ආයතනය විසින් වාර්ෂිකව පරීක්ෂා කෙරේ.

**(ආ) වෙළඳ ලැබිය යුතු දේවල අලාභය**

හානිකරන තක්සේරුව සඳහා මාසික පදනමින් ආයතනය ණය ගැතියන් සමාලෝචනයට ලක් කරයි. හානිකරණ පාඩුවක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වාර්තා කළ යුතු දැයි තීරණය කිරීම පිණිස ආයතනය ණයගැතියන් ලැයිස්තුවක ඇස්තමේන්තුගත මූල්‍ය ප්‍රවාහයෙහි මැනිය හැකි අඩුවීමක් පිළිබඳව නිරීක්ෂණය කළ හැකි දත්ත පවතින්නේ දැයි දැන ගැනීමට විනිශ්චයන් සිදු කරයි. මේ සඳහා කළමනාකරණය වත්කම්හි අතීත හානි පිළිබඳ අත්දැකීම් මත පදනම් වූ ඇස්තමේන්තු භාවිතා කරයි. වටිනාකම ඇස්තමේන්තු කිරීමට හා මුදල් ප්‍රවාහ කාල ගණනයට භාවිතා කරන උපකල්පන, හානි ඇස්තමේන්තු සහ සත්‍ය හානි අත්දැකීම් අතර වන වෙනස්කම් අඩුකරනු පිණිස නිතිපතා සමාලෝචනය කෙරේ.

## 2.6 ඒකාබද්ධ කිරීම

අනුබද්ධ ආයතන යනු එහි ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති ආයතනයට පාලනය කිරීමට බලය ඇති ආයතන (විශේෂ අරමුණු ඇතුළුව) වන අතර, සාමාන්‍යයෙන් ඡන්ද අයිතියෙන් බහුතරයක් ලබා දෙන කොටස් හිමිකාරීත්වයක් ද ඇත. ආයතනය වෙනත් ආයතනයක් පාලනය කරන්නේද යන්න තක්සේරු කිරීමේදී දැනට භාවිතා කළ හැකි හෝ පරිවර්තනය කළ හැකි ඡන්ද අයිතියේ පැවැත්ම සහ බලපෑම සලකා බලනු ලැබේ. ආයතනයට පාලනය පවරන දිනයේ සිට බලපැවැත්වෙ පරිදි අනුබද්ධ ආයතන ඒකාබද්ධ කෙරේ. පාලනය නැවැත්වූ දින සිට ඒවා විසංධි කරනු ලැබේ. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී, ආයතන ආයතන අතර ගනුදෙනු මත ශේෂයන් සහ අත්‍යවශ්‍ය නොවන ලාභ ඉවත් කෙරේ. ආයතනය විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා අනුබද්ධිත ආයතනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කර ඇත. පාලනය නොවන අවශ්‍යතා යනු ආයතනයේ කොටස් හිමියන්ට ඍජුව හෝ වක්‍රව හිමි නොවන අවශ්‍යතාවලට අනුබද්ධිත ආයතනයක මෙහෙයුම් සහ ශුද්ධ වත්කම්වල ශුද්ධ ප්‍රතිඵලවල කොටසකි. ඒවා විස්තීරණ ආදායමේ ඒකාබද්ධ ප්‍රකාශයේ, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශයේ සහ ශේෂ පත්‍රයේ වෙන වෙනම පෙන්වා ඇත.සමස්ථ විස්තීර්ණ ආදායමට අනුබද්ධිත ආයතනයක ඔවුන්ගේ අවශ්‍යතා මත පදනම්ව පාලනය නොවන අවශ්‍යතා සඳහා ගලපනු ලැබේ. මෙය පාලනය නොවන අවශ්‍යතා හිඟ ශේෂයක් ඇති කිරීමට හේතු වේ.

### 2.7 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මෙම මූල්‍ය ප්‍රකාශනවල නව සහ සංශෝධිත ප්‍රමිතීන් සහ අර්ථකථන, ආයතනය විසින් ප්‍රථම වරට 2019 ජනවාරි 1 වැනි දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලසීමාවන් සඳහා බලපැවැත්වෙන පරිදි SLFRS 16 ක්‍රියාත්මක කර ඇත. ආයතනය විසින් නිකුත් කර ඇති නමුත් එලදායී නොවන වෙනත් කිසිදු ප්‍රමිතියක්, අර්ථකථනයක් හෝ සංශෝධනයක් කලින් සම්මත කරගෙන නොමැත.

ආයතනය විසින් SLFRS 16 නවීකරණය කරන ලද ප්‍රතිගාමී ප්‍රවේශය භාවිතා කරන ලද අතර, ඒ යටතේ කල්බදු වගකීමට සමාන මුදලක් 2019 ජනවාරි 1 වන දිනට භාවිතා කිරීමේ අයිතිය ලෙස ගිණුම්ගත කර ඇත. ඒ අනුව, 2019 සඳහා ඉදිරිපත් කරන ලද සංසන්දනාත්මක තොරතුරු නැවත සඳහන් කර නොමැත. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් පිළිබඳ විස්තර පහතින් හෙළිදරව් කෙරේ. මීට අමතරව, SLFRS 16 හි අනාවරණ අවශ්‍යතා සාමාන්‍යයෙන් සංසන්දනාත්මක තොරතුරු සඳහා අදාළ කර නොමැත.

SLFRS 16 වෙත ඇතුලත් කිරීමේදී, කල්බදු ගනුදෙනු මොනවාද යන්න තක්සේරු කිරීම සඳහා ප්‍රායෝගික අවශ්‍යතාවයක් මත භාවිතාකාරීම ආයතනය තෝරා ගන්නා ලදී. එහිදී SLFRS 16 අදාළ කර ඇත්තේ කලින් කල්බදු ලෙස හඳුනාගෙන ඇති කොන්ත්‍රාත්තු සඳහා පමණි. LKAS 17 යටතේ කල්බදු ලෙස හඳුනා නොගත් කොන්ත්‍රාත් SLFRS 16 යටතේ කල්බදුවක් තිබේද යන්න නැවත තක්සේරු කර නොමැත.

**2019 ජනවාරි 01 දින සිට ප්‍රතිපත්ති අදාළ වේ**

කොන්ත්‍රාත්තුවක් ආරම්භයේදී සමූහය විසින් කොන්ත්‍රාත්තුවක් හෝ කොන්ත්‍රාත්තුවක් කල්බදු ගිවිසුමක් ලෙස තක්සේරු කරයි. හඳුනාගත් වත්කමක් සලකා බැලීම සඳහා භුවමාරු කර ගැනීම සඳහා යම් කාල පරිච්ඡේදයක් භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුව මගින් ලබා දෙන්නේ නම් එම කොන්ත්‍රාත්තුව හෝ එහි අඩංගු වේ. හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුවක් මගින් ප්‍රකාශ කරන්නේද යන්න තක්සේරු කිරීම සඳහා, SLFRS 16 හි කල්බදු අර්ථ දැක්වීම භාවිතා කරයි.

බදුකරු ලෙස, ආයතනය 2019 ජනවාරි 1 වන දිනට ගොඩනැගිලි සහ මෝටර් රථ බදු දී ඇත. ආයතනය SLFRS 16 යටතේ, කල්බදු සඳහා භාවිතා කිරීමේ අයිතිය වත්කම් සහ කල්බදු වගකීම් පිළිගනී, එනම් මෙම කල්බදු ශේෂ පත්‍රය මත දැක්වේ. එම සංරචකය ලීසිං කිරීම කොන්ත්‍රාත්තුවට ඇතුල් වන විට හෝ වෙනස් කිරීමේදී, ආයතනය විසින් එක් එක් කල්බදු සංරචක සඳහා කොන්ත්‍රාත්තුවේ සලකා බැලීම ඔවුන්ගේ සාපේක්ෂ ස්ථාවර මිල මත පදනම්ව සිදු කෙරේ.

මෙම බදු සඳහා, ප්‍රවේශවන ආකාරය මත , 2019 ජනවාරි 1 වන දිනට ආයතනයේ වර්ධක ණය ගැනීම් අනුපාතයට අනුව ඉතිරි කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව, වට්ටම් කර ඇති බදු වගකීම් මනිනු ලැබීය. ඉන් පසු ආරම්භක දිනයේ සිට කල්බදු කාලය අවසන් වන තෙක් වත්කම් භාවිතයේ අයිතිය සරල රේඛීය ක්‍රමය භාවිතයෙන් ක්ෂය කරනු ලැබේ. මීට අමතරව, වත්කම් භාවිතයේ අයිතිය යම් යම් දුර්වලතා පාඩු ඇත්නම්, සහ කල්බදු වගකීම් වල යම් යම් ප්‍රතිමිණුම් සඳහා ගැලපීම් හරහා කාලානුරූපව අඩු කිරීම සිදු කරයි. කල්බදු වගකීම මුලින් මනිනු ලබන්නේ ආරම්භක දිනයේ දී නොගෙවන ලද කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව, කල්බදු තුළ ව්‍යංගිත පොලී අනුපාතිකය භාවිතා කර වට්ටම් කර හෝ, එම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, ආයතනයේ වර්ධක ණය ගැනීමේ අනුපාතයෙනි. සාමාන්‍යයෙන්, ආයතනය එහි වර්ධක ණය ගැනීමේ අනුපාතය වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරයි.

කල්බදු වගකීම් මැනීම සඳහා ඇතුළත් කර ඇති බදු ගෙවීම් පහත සඳහන් දෑ වලින් සමන්විත වේ.

- ද්‍රව්‍යමය ස්ථාවර ගෙවීම් ඇතුළු, ස්ථාවර ගෙවීම්
- දර්ශකයක් හෝ අනුපාතයක් මත රඳා පවතින විචල්‍ය කල්බදු ගෙවීම්, ආරම්භක දිනයේ දී දර්ශකය හෝ අනුපාතය භාවිතයෙන් මුලින් මනිනු ලැබේ

3 දේපළ, පිරියත, උපකරණ

| NIBM | ඉඩම් | ගොඩනැගිලි | ගොඩනැගිලි නවීකරණය | ගොඩනැගිලි උපාංග | ලී බඩු සහ උපකරණ | මෝටර්රථ | පුස්තකාල පොත් | පරිගණක උපකරණ | කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| *පිරිවැය* | | | | | | | | | | |
| **2019** දෙසැම්බර් **31** දිනට | 86,068,000 | 768,608,233 | 216,185,050 | 1,620,533 | 165,410,734 | 67,316,300 | 11,687,879 | 155,578,781 | 7,972,866 | 1,480,448,376 |
| RUA වලට මාරුකිරීම | - | - | - | - | - | (24,226,300) | - | - | - | (24,226,300) |
| **2020** ජනවාරි **01** දිනට | **86,068,000** | **768,608,233** | **216,185,050** | **1,620,533** | **165,410,734** | **43,090,000** | **11,687,879** | **155,578,781** | **7,972,866** | **1,456,222,076** |
| *ක්ෂයවීම* | | | | | | | | | | |
| **2019** දෙසැම්බර් **31** දිනට | - | 188,797,852 | 126,109,708 | 824,547 | 119,631,606 | 35,966,872 | 9,311,134 | 104,929,458 | - | 585,571,177 |
| RUA වෙත මාරු කරන ලද | - | - | - | - | - | (6,039,982) | - | - | - | (6,039,982) |
| **2020** ජනවාරි **01** දිනට | **-** | **188,797,852** | **126,109,708** | **824,547** | **119,631,606** | **29,926,890** | **9,311,134** | **104,929,458** | **-** | **579,531,195** |
| *පිරිවැය* | | | | | | | | | | |
| **2020** ජනවාරි **01** දිනට | 86,068,000 | 768,608,233 | 216,185,050 | 1,620,533 | 165,410,734 | 43,090,000 | 11,687,879 | 155,578,781 | 7,972,866 | 1,456,222,076 |
| එකතුකිරීම් | - | 2,040,920 | - | 2,029,004 | 11,478,391 | - | 622,775 | 14,362,284 | 11,510,256 | 42,043,630 |
| මාරු කරන ලද | - | - | 8,304,622 | 2,040,920 | - | - | - | - | (10,345,542) | - |
| ඉවත් කිරීම | - | - | - | - | (266,700) | - | - | (751,458) | - | (1,018,158) |
| **2020** දෙසැම්බර් **31** දිනට | **86,068,000** | **770,649,153** | **224,489,672** | **5,690,457** | **176,622,425** | **43,090,000** | **12,310,654** | **169,189,607** | **9,137,580** | **1,497,247,548** |
| *ක්ෂය වීම* | | | | | | | | | | |
| **2020** ජනවාරි **01** දිනට | - | 188,797,852 | 126,109,708 | 824,547 | 119,631,606 | 29,926,890 | 9,311,134 | 104,929,458 | - | 579,531,195 |
| වර්ෂය තුල වෙනස්වීම් | - | 14,916,963 | 19,258,389 | 835,341 | 14,862,672 | 10,772,500 | 734,312 | 26,152,929 | | 87,533,106 |
| නැවත අගය කිරීම | - | - | - | - | - | - | - | - | - | - |
| ඉවත් කිරීම | - | | | | (266,700) | | | (751,458) | | (1,018,158) |
| **2020** දෙසැම්බර් **31** දිනට | **-** | **203,714,815** | **145,368,097** | **1,659,888** | **134,227,578** | **40,699,390** | **10,045,446** | **130,330,929** | **-** | **666,046,143** |
| ශුද්ධ පොත් වටිනාකම | | | | | | | | | | |
| 2020 ජනවාරි 01 දිනට | **86,068,000** | **579,810,382** | **90,075,342** | **795,985** | **45,779,127** | **13,163,110** | **2,376,745** | **50,649,324** | **7,972,866** | **876,690,882** |
| 2020 දෙසැම්බර් 31 දිනට | **86,068,000** | **566,934,339** | **79,121,575** | **4,030,568** | **42,394,846** | **2,390,610** | **2,265,208** | **38,858,679** | **9,137,580** | **831,201,406** |
| *පිරිවැය* | | | | | | | | | | |
| **2021** ජනවාරි **01** දිනට | 86,068,000 | 770,649,153 | 224,489,672 | 5,690,457 | 176,622,425 | 43,090,000 | 12,310,654 | 169,189,607 | 9,137,580 | 1,497,247,548 |
| එකතුකිරීම් | - | - | - | 6,068,368 | 23,627,241 | - | 328,305 | 40,398,931 | 125,849,359 | 196,272,204 |
| නැවත අගය කිරීම | - | - | - | - | (101,685,043) | - | - | (110,701,907) | - | (212,386,950) |
| ඉවත් කිරීම | - | - | - | - | (411,026) | - | - | (902,075) | - | (1,313,101) |
| **2021** දෙසැම්බර් **31** දිනට | **86,068,000** | **770,649,153** | **224,489,672** | **11,758,825** | **98,153,597** | **43,090,000** | **12,638,959** | **97,984,556** | **134,986,939** | **1,479,819,701** |
| *ක්ෂය වීම* | | | | | | | | | | |
| **2021** ජනවාරි **01** දිනට | - | 203,714,815 | 145,368,097 | 1,659,888 | 134,227,580 | 40,699,390 | 10,045,446 | 130,330,929 | - | 666,046,144 |
| වර්ෂය තුල වෙනස්වීම් | - | 15,669,040 | 20,822,846 | 1856234 | 16,745,429 | 2,390,610 | 776,796 | 19,558,424 | - | 77,819,379 |
| මාරු කරන ලද | - | - | 148,908 | (148,908) | (134,227,579) | - | - | (130,330,928) | - | (264,558,507) |
| ඉවත් කිරීම | - | - | - | - | (4,279) | - | - | (11,739) | - | (16,018) |
| **2021** දෙසැම්බර් **31** දිනට | **-** | **219,383,855** | **166,339,851** | **3,367,214** | **16,741,151** | **43,090,000** | **10,822,242** | **19,546,686** | **-** | **479,290,999** |
| ශුද්ධ පොත් වටිනාකම | | | | | | | | | | |
| 2021 ජනවාරි 01 දිනට | **86,068,000** | **566,934,339** | **79,121,575** | **4,030,568** | **42,394,845** | **2,390,610** | **2,265,208** | **38,858,679** | **9,137,580** | **831,201,404** |
| 2021 දෙසැම්බර් 31 දිනට | **86,068,000** | **551,265,299** | **58,149,821** | **8,391,610** | **81,412,446** | **-** | **1,816,717** | **78,437,871** | **134,986,939** | **1,000,528,702** |

වරහන් වල සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)

**2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

**3 දේපළ, පිරියත, උපකරණ .....**

| NSBM | ඉඩම් (බදු දී ඇති) | ගොඩනැගිලි | ලී බඩු සහ උපකරණ සහ වෙනත් කාර්යාල උපකරණ | කාර්මික ස්ථාන සහ යන්ත්‍රෝපකරණ | විද්‍යාගාර උපකරණ | මෝටර්රථ | පුස්තකාල පොත් | පරිගණක උපකරණ | කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2019 ජනවාරි 01 දිනට** | | | | | | | | | | |
| *පිරිවැය* | 112,000,000 | 9,637,561,134 | 614,740,113 | 539,748,341 | 21,566,636 | 166,542,477 | 26,018,319 | 103,217,618 | - | 11,221,394,638 |
| RUA වෙත මාරු කරන ලද | (112,000,000) | - | - | - | - | (89,425,000) | - | - | - | (201,425,000) |
| එකතුකිරීම් | - | 42,898,591 | 37,118,339 | 299,914 | - | 36,228,700 | 1,346,208 | 8,632,399 | 37,421,365 | 163,945,516 |
| ඉවත් කිරීම් | - | - | (2,831,025) | - | - | - | - | (2,179,706) | - | (5,010,731) |
| **2019 දෙසැම්බර් 31 දිනට** | **-** | **9,680,459,725** | **649,027,427** | **540,048,255** | **21,566,636** | **113,346,177** | **27,364,527** | **109,670,311** | **37,421,365** | **11,178,904,423** |
| ***ක්ෂය වීම*** | | | | | | | | | | |
| **2019 ජනවාරි 01 දිනට** | 26,431,101 | 400,463,399 | 243,119,063 | 183,274,827 | 1,975,527 | 97,054,479 | 15,993,551 | 55,028,746 | - | 1,023,340,693 |
| RUA වෙත මාරු කරන ලද | (26,431,101) | - | - | - | - | (44,366,336) | - | - | - | (70,797,437) |
| වර්ෂය තුල වෙනස්වීම් | - | 192,995,461 | 109,926,114 | 88,195,005 | 4,313,327 | 17,684,919 | 3,628,298 | 19,396,651 | - | 436,139,775 |
| ඉවත් කිරීම් | - | - | (2,831,025) | - | - | - | - | (2,179,706) | - | (5,010,731) |
| **2019 දෙසැම්බර් 31 දිනට** | **-** | **593,458,860** | **350,214,152** | **271,469,832** | **6,288,854** | **70,373,062** | **19,621,849** | **72,245,691** | **-** | **1,383,672,300** |
| **ශුද්ධ පොත් වටිනාකම** | | | | | | | | | | |
| 2019 ජනවාරි 01 දිනට | **85,568,899** | **9,237,097,735** | **371,621,050** | **356,473,514** | **19,591,109** | **69,487,998** | **10,024,768** | **48,188,872** | **-** | **10,198,053,945** |
| 2019 දෙසැම්බර් 31 දිනට | **-** | **9,087,000,865** | **298,813,275** | **268,578,423** | **15,277,782** | **42,973,115** | **7,742,678** | **37,424,620** | **37,421,365** | **9,795,232,123** |
| **2020 ජනවාරි 01 දිනට** | - | 9,680,459,725 | 649,027,427 | 540,048,255 | 21,566,636 | 113,346,177 | 27,364,527 | 109,670,311 | 37,421,365 | 11,178,904,423 |
| මාරු කරන ලද | - | - | 342,378,368 | (342,378,368) | - | - | - | - | - | - |
| එකතුකිරීම් | | 3,789,844 | 37,072,415 | - | 6,730,492 | - | 949,833 | 33,454,846 | 76,178,433 | 158,175,863 |
| **2020 දෙසැම්බර් 31 දිනට** | **-** | **9,684,249,569** | **1,028,478,210** | **197,669,887** | **28,297,128** | **113,346,177** | **28,314,360** | **143,125,157** | **113,599,798** | **11,337,080,286** |
| ***ක්ෂය වීම*** | | | | | | | | | | |
| **2020 ජනවාරි 01 දිනට** | - | 593,458,860 | 350,214,152 | 271,469,832 | 6,288,854 | 70,373,062 | 19,621,849 | 72,245,691 | - | 1,383,672,300 |
| මාරු කරන ලද | - | - | 210,544,182 | (210,544,182) | - | - | - | - | - | - |
| වර්ෂය තුල වෙනස්වීම් | - | 194,218,233 | 186,506,669 | 19,821,145 | 4,717,376 | 17,248,894 | 3,250,842 | 22,255,388 | - | 448,018,547 |
| **2020 දෙසැම්බර් 31 දිනට** | **-** | **787,677,093** | **747,265,003** | **80,746,795** | **11,006,230** | **87,621,956** | **22,872,691** | **94,501,079** | **-** | **1,831,690,847** |
| **ශුද්ධ පොත් වටිනාකම** | | | | | | | | | | |
| 2020 ජනවාරි 01 දිනට | **-** | **9,087,000,865** | **298,813,275** | **268,578,423** | **15,277,782** | **42,973,115** | **7,742,678** | **37,424,620** | **37,421,365** | **9,795,232,123** |
| 2020 දෙසැම්බර් 31 දිනට | **-** | **8,896,572,476** | **281,213,207** | **116,923,092** | **17,290,898** | **25,724,221** | **5,441,669** | **48,624,078** | **113,599,798** | **9,505,389,439** |
| ***පිරිවැය*** | | | | | | | | | | |
| **2021 ජනවාරි 01 දිනට** | - | 9,684,249,569 | 1,028,478,210 | 197,669,887 | 28,297,128 | 113,346,177 | 28,314,360 | 143,125,157 | 113,599,798 | 11,337,080,286 |
| මාරු කරන ලද | - | - | - | - | - | 70,000,000 | - | - | - | 70,000,000 |
| එකතුකිරීම් | - | 22,934,765 | 33,620,421 | - | 49,064,165 | - | 838,229 | 11,456,474 | 279,613,612 | 397,527,666 |
| ඉවත් කිරීම් | - | - | (244,350) | - | - | - | | (2,525,734) | - | (2,770,084) |
| **2021 දෙසැම්බර් 31 දිනට** | **-** | **9,707,184,334** | **1,061,854,281** | **197,669,887** | **77,361,293** | **183,346,177** | **29,152,589** | **152,055,897** | **393,213,410** | **11,801,837,868** |
| ***ක්ෂය වීම*** | | | | | | | | | | |
| **2021 ජනවාරි 01 දිනට** | - | 787,677,093 | 747,265,003 | 80,746,795 | 11,006,230 | 87,621,956 | 22,872,691 | 94,501,079 | - | 1,831,690,847 |
| මාරු කරන ලද | - | - | - | - | - | 70,000,000 | - | - | - | 70,000,000 |
| වර්ෂය තුල වෙනස්වීම් | - | 194,008,576 | 185,721,749 | 19,766,989 | 13,027,544 | 11,562,124 | 2,752,721 | 21,612,910 | - | 448,452,613 |
| ඉවත් කිරීම් | | - | (244,350) | - | - | - | - | (2,525,734) | - | (2,770,084) |
| **2021 දෙසැම්බර් 31 දිනට** | **-** | **981,685,669** | **932,742,402** | **100,513,784** | **24,033,774** | **169,184,080** | **25,625,412** | **113,588,255** | **-** | **2,347,373,376** |
| **ශුද්ධ පොත් වටිනාකම** | | | | | | | | | | |
| 2021 ජනවාරි 01 දිනට | **-** | **8,896,572,476** | **281,213,207** | **116,923,092** | **17,290,898** | **25,724,221** | **5,441,669** | **48,624,078** | **113,599,798** | **9,505,389,439** |
| 2021 දෙසැම්බර් 31 දිනට | **-** | **8,725,498,665** | **129,111,879** | **97,156,103** | **53,327,519** | **14,162,097** | **3,527,177** | **38,467,642** | **393,213,410** | **9,454,464,492** |

වරහන් වල සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)*

**2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

### 3 දේපළ, පිරියත, උපකරණ .....

| සමූහය (නැවත ප්‍රකාශිත) | ඉඩම් | ගොඩනැගිලි | ගොඩනැගිලි නවීකරණය | ගොඩනැගිලි උපාංග | ලී බඩු සහ උපකරණ සහ වෙනත් කාර්යාල උපකරණ | කාර්මික ස්ථාන සහ යන්ත්‍රෝපකරණ | විද්‍යාගාර උපකරණ | මෝටර්රථ | පුස්තකාල පොත් | පරිගණක උපකරණ | කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| *පිරිවැය* | | | | | | | | | | | | |
| **2020 ජනවාරි 01 දිනට** | 86,068,000 | 10,449,067,958 | 216,185,050 | 1,620,533 | 814,438,161 | 540,048,255 | 21,566,636 | 180,662,477 | 39,052,406 | 265,249,092 | 45,394,231 | 12,659,352,799 |
| මාරු කරන ලද | - | - | 8,304,622 | 2,040,920 | 342,378,368 | (342,378,368) | | | | | (10,345,542) | - |
| එකතුකිරීම් | | 5,830,764 | - | 2,029,004 | 48,550,806 | - | 6,730,492 | - | 1,572,608 | 47,817,130 | 87,688,689 | 200,219,493 |
| ඉවත් කිරීම් | | | | | (266,700) | | | | | (751,458) | | (1,018,158) |
| **2020 දෙසැම්බර් 31 දිනට** | **86,068,000** | **10,454,898,722** | **224,489,672** | **5,690,457** | **1,205,100,635** | **197,669,887** | **28,297,128** | **180,662,477** | **40,625,014** | **312,314,764** | **122,737,378** | **12,858,554,134** |
| *ක්ෂය වීම* | | | | | | | | | | | | |
| **2020 ජනවාරි 01 දිනට** | - | 782,256,712 | 126,109,708 | 824,547 | 469,845,758 | 271,469,832 | 6,288,854 | 106,339,934 | 28,932,983 | 177,175,149 | - | 1,969,243,477 |
| මාරු කරන ලද | - | - | - | - | 210,544,182 | (210,544,182) | - | - | - | - | - | - |
| වර්ෂය තුල වෙනස්වීම් | - | 209,135,196 | 19,258,389 | 835,341 | 201,369,341 | 19,821,145 | 4,717,376 | 34,077,969 | 3,985,154 | 48,408,317 | | 541,608,228 |
| ඉවත් කිරීම් | - | - | - | - | (266,700) | - | - | - | - | (751,458) | | (1,018,158) |
| **2020 දෙසැම්බර් 31 දිනට** | - | **991,391,908** | **145,368,097** | 1,659,888 | 881,492,581 | 80,746,795 | 11,006,230 | 140,417,903 | 32,918,137 | 224,832,008 | - | 2,509,833,547 |
| **ශුද්ධ පොත් වටිනාකම** | | | | | | | | | | | | |
| **2020 ජනවාරි 01 දිනට** | **86,068,000** | **9,666,811,246** | **90,075,342** | **795,986** | **344,592,403** | **268,578,423** | **15,277,782** | **74,322,543** | **10,119,423** | **88,073,943** | **-** | **10,690,109,322** |
| **2020 දෙසැම්බර් 31 දිනට** | **86,068,000** | **9,463,506,814** | **79,121,575** | **4,030,569** | **323,608,054** | **116,923,092** | **17,290,898** | **40,244,574** | **7,706,877** | **87,482,756** | **122,737,378** | **10,348,720,587** |
| *පිරිවැය* | | | | | | | | | | | | |
| **2021 ජනවාරි 01 දිනට** | 86,068,000 | 10,454,898,722 | 224,489,672 | 5,690,457 | 1,205,100,635 | 197,669,887 | 28,297,128 | 180,662,477 | 40,625,014 | 312,314,764 | 122,737,378 | 12,858,554,134 |
| එකතුකිරීම්/මාරු කරන ලද | - | 22,934,765 | 33,620,421 | 6,068,368 | 23,627,241 | - | 49,064,165 | 70,000,000 | 1,166,534 | 51,855,405 | 405,462,971 | 663,799,870 |
| නැවත අගය කිරීම | - | - | - | - | (101,685,043) | - | - | - | - | (110,701,907) | - | (212,386,950) |
| ඉවත් කිරීම් | - | - | - | - | (655,376) | - | - | - | - | (3,427,809) | - | (4,083,185) |
| **2021 දෙසැම්බර් 31 දිනට** | **86,068,000** | **10,477,833,487** | **258,110,093** | **11,758,825** | **1,126,387,457** | **197,669,887** | **77,361,293** | **250,662,477** | **41,791,548** | **250,040,453** | **528,200,349** | **13,305,883,869** |
| *ක්ෂය වීම* | | | | | | | | | | | | |
| **2021 ජනවාරි 01 දිනට** | - | 991,391,908 | 145,368,097 | 1,659,888 | 881,492,581 | 80,746,795 | 11,006,230 | 140,417,903 | 32,918,137 | 224,832,008 | - | 2,509,833,547 |
| වර්ෂය තුල වෙනස්වීම් | - | 209,677,616 | 20,822,846 | 1,856,234 | 214,596,923 | 19,766,989 | 13,027,544 | 13,952,734 | 3,529,517 | 41,171,334 | - | 538,401,737 |
| Transfers | - | - | 148,908 | (148,908) | - | - | - | 70,000,000 | - | - | - | 70,000,000 |
| නැවත අගය කිරීම | - | - | - | - | (134,227,579) | - | - | - | - | (130,330,928) | - | (264,558,507) |
| ඉවත් කිරීම් | - | - | | - | (248,629) | - | - | - | - | (2,537,473) | - | (2,786,102) |
| **2021 දෙසැම්බර් 31 දිනට** | **-** | **1,201,069,524** | **166,339,851** | **3,367,214** | **961,613,296** | **100,513,784** | **24,033,774** | **224,370,637** | **36,447,654** | **133,134,941** | **-** | **2,850,890,675** |
| **ශුද්ධ පොත් වටිනාකම** | | | | | | | | | | | | |
| 2021 ජනවාරි 01 දිනට | **86,068,000** | **9,463,506,814** | **79,121,575** | **4,030,569** | **323,608,054** | **116,923,092** | **17,290,898** | **40,244,574** | **7,706,877** | **87,482,756** | **122,737,378** | **10,348,720,587** |
| 2021 දෙසැම්බර් 31 දිනට | **86,068,000** | **9,276,763,963** | **91,770,242** | **8,391,611** | **164,774,161** | **97,156,103** | **53,327,519** | **26,291,840** | **5,343,894** | **116,905,512** | **528,200,349** | **10,454,993,194** |

වරහන් වල සංඛ්‍යා අඩු කිරීම් පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඉදිරියට

*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)*

| | | NIBM | | NSBM | | සමූහය | |
|---|---|---|---|---|---|---|---|
| | දෙසැම්බර් 31 අවසන් වූ වසර සඳහා | **2021** | **2020** | **2021** | **2020** | **2021** | **2020** |
| **4** | **අස්පෘශ්‍ය වත්කම්** | | | | | | |
| | **පිරිවැය** | | | | | | |
| | **ජනවාරි 01 දිනට** | 5,401,023 | 4,443,523 | 66,568,012 | 56,052,563 | 71,969,035 | 60,496,086 |
| | එකතුකිරීම් | 1,225,440 | 957,500 | - | 10,515,449 | 1,225,440 | 11,472,949 |
| | **දෙසැම්බර් 31 දිනට** | **6,626,463** | **5,401,023** | **66,568,012** | **66,568,012** | **73,194,475** | **71,969,035** |
| | ක්‍රමක්ෂය | | | | | | |
| | **ජනවාරි 01 දිනට** | 3,143,030 | 2,637,087 | 41,135,166 | 27,012,150 | 44,278,196 | 29,649,237 |
| | වර්ෂය සඳහා ක්‍රමක්ෂය | 1,187,214 | 505,943 | 13,446,171 | 14,123,016 | 14,633,385 | 14,628,959 |
| | **දෙසැම්බර් 31 දිනට** | **4,330,244** | **3,143,030** | **54,581,337** | **41,135,166** | **58,911,581** | **44,278,196** |
| | ශුද්ධ පොත් වටිනාකම | | | | | | |
| | ජනවාරි 01 දිනට | **2,257,993** | **1,806,436** | **25,432,846** | **29,040,413** | **27,690,839** | **30,846,849** |
| | දෙසැම්බර් 31 දිනට | **2,296,219** | **2,257,993** | **11,986,675** | **25,432,846** | **14,282,894** | **27,690,839** |
| **5** | **අනුබද්ධ ආයතනවල ආයෝජනය** | | | | | | |
| | ආයෝජනය - NSBM | **800,000,010** | **800,000,010** | **-** | **-** | **800,000,010** | **800,000,010** |

ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යාතනයහි රුපියල් මිලියන 800 ක මුදලක් ආයෝජනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර මේ වන විටත් රුපියල් මිලියන 800 ක මුදලක් NSBM වෙත පවරා ඇත. මිලියන 800 ක කොටස් සහතිකයක් NIBM වෙත නිකුත් කරන ලදී. ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යාතනය NIBM ආයතනයේ සම්පූර්ණයෙන්ම අනුබද්ධිත ආයතනයකි.

| | | NIBM 2021 | NIBM 2020 | NSBM 2021 | NSBM 2020 | සමූහය 2021 | සමූහය 2020 |
|---|---|---|---|---|---|---|---|
| **6** | **වත්කම් භාවිතා කිරීමේ අයිතිය - ඉඩම් මෝටර් රථ** | | | | | | |
| | ***පිරිවැය*** | | | | | | |
| | **ජනවාරි 01 දිනට** | **131,062,715** | **59,016,480** | **333,841,565** | **369,008,151** | **464,904,280** | **428,024,631** |
| | කළින් ගෙවන ලද කල්බදු වාරික | 66,000,000 | 41,100,001 | - | - | 66,000,000 | 41,100,001 |
| | ගැලපුම් | - | 459,333 | - | - | | 459,333 |
| | මෝටර් රථ මාරු කිරීම - පිරිවැය | | | (70,000,000) | | (70,000,000) | - |
| | මෝටර් රථ වලින් මාරු කිරීම- ක්ෂය | - | - | 70,000,000 | - | 70,000,000 | - |
| | වසර තුළ එකතු කිරීම | 163,693,471 | 100,540,095 | - | - | 163,693,471 | 100,540,095 |
| | ක්‍රමක්ෂය හිමිකම | (85,906,288) | (70,053,194) | (18,936,251) | (35,166,586) | (104,842,539) | (105,219,780) |
| | **දෙසැම්බර් 31 දිනට** | **274,849,898** | **131,062,715** | **314,905,314** | **333,841,565** | **589,755,212** | **464,904,280** |

හෝමාගම පිටිපන ප්‍රදේශයේ අක්කර 25 ක් සහ අක්කර 15 ක භූමි ප්‍රමාණයකින් යුත් ඉඩම NSBM වෙත නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් 2011 දෙසැම්බර් 02 සහ 2019 සැප්තැම්බර් 06 යන දින 30 වසරක බදු පදනම මත ලබා දෙන ලදී.

UDA ට අනුව, ඉහත ඉඩම වෙන් කිරීම වසර 30 ක බදු පදනම මත සහ බදුකරුට හෝ ඔහුගේ නාමිකයාට ලබා දෙන කාලය ප්‍රදානය කිරීම මගින් බදුකරු තීරණය කිරීම අනුව බදු ගිවිසුමේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසි මත තව අවුරුදු 30 ක කාලයක් සඳහා කල්බදු අලුත් කිරීමසිදු කෙරේ. UDA විසින් කල්බදු කොන්දේසි මත වසර 30 ක කල්බදු කාල සීමාව පිළිගෙන ඇත.
2019 ජනවාරි 1 සිට SLFRS 16 සම්මත කිරීමත් සමඟ, 2011 දෙසැම්බර් 2 සහ 2019 සැප්තැම්බර් 06 වැනි දින අත්පත් කරගත් ඉඩම් සඳහා කල්තියා ගෙවන ලද බදු කුලිය සහ 2016 ඔක්තෝබර් 31, 2017 අගෝස්තු 21, 2017 සැප්තැම්බර් 15 සහ 2019 ඔක්තෝම්බර් 02 යන දිනවලදී අත්පත් කර ගන්නා ලද මෝටර් වාහන භාවිතයේ අයිතිය වත්කම් වෙත මාරු කර ඇත.

| | | NIBM 2021 | NIBM 2020 | NSBM 2021 | NSBM 2020 | සමූහය 2021 | සමූහය 2020 |
|---|---|---|---|---|---|---|---|
| **7** | **බඩු තොග** | | | | | | |
| | ලිපි ද්‍රව්‍ය, පරිභෝජන ද්‍රව්‍ය | 9,248,858 | 12,270,100 | 27,936,091 | 15,726,105 | 37,184,949 | 27,996,205 |
| | මුද්දර තොග | 43,435 | 17,175 | - | - | 43,435 | 17,175 |
| | | **9,292,293** | **12,287,275** | **27,936,091** | **15,726,105** | **37,228,384** | **28,013,380** |
| **8** | **කෙටිකාලීන ආයෝජන** | | | | | | |
| | ස්ථාවර තැන්පතු | 539,055,057 | 551,873,265 | 513,008,309 | 712,937,868 | 1,052,063,366 | 1,264,811,133 |
| | ඇමතුම් තැන්පතුව - ලංකා බැංකුව | 30,104,795 | 30,006,575 | - | - | 30,104,795 | 30,006,575 |
| | | **569,159,852** | **581,879,840** | **513,008,309** | **712,937,868** | **1,082,168,161** | **1,294,817,708** |

කල්පිරීමට තබා ඇති ආයතනවල මූල්‍ය වත්කම්, ස්ථාවර තැන්පතු වල ආයෝජනය, වසර 1කට අඩු කාලයක් කල් පිරෙන ඇමතුම් තැන්පතු වලින් සමන්විත වන අතර ඒවා වසර 1ක් ඇතුළත පරිණත වනු ඇත.

*(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශ කර ඇත)*

| | NIBM | | NSBM | | සමූහය | |
|---|---|---|---|---|---|---|
| **දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා** | **2021** | **2020** | **2021** | **2020** | **2021** | **2020** |
| **9 වෙළෙඳාම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ** | | | | | | |
| ණය ගැතියන් **(සටහන 9.1)** | 302,518,133 | 249,834,143 | 193,114,241 | 262,032,613 | 495,632,374 | 511,866,756 |
| පූර්ව ගෙවීම් | 19,677,690 | 23,493,921 | 10,078,823 | 31,905,687 | 29,756,513 | 55,399,608 |
| කොන්ත්‍රාත්කරුවන් | - | - | 612,926,558 | 40,051,514 | 612,926,558 | 40,051,514 |
| රැඳවුම් බද්ද | - | - | 405,804 | 405,804 | 405,804 | 405,804 |
| නිවාස ණය ගෙවීම සහ අනෙකුතු ණය | 1,701,688 | 3,346,245 | 40,122,929 | 4,033,711 | 41,824,617 | 7,379,956 |
| කල් දැමූ විදේශ ප්‍රේෂණ | - | - | 67,533,346 | 137,466,729 | 67,533,346 | 137,466,729 |
| ආපසු ගෙවිය හැකි | - | - | - | 277,490 | - | 277,490 |
| ආර්ථික සේවා ගාස්තුව | - | - | 7,077,676 | 16,107,302 | 7,077,676 | 16,107,302 |
| ණයපත් ශේෂය | 54,500 | 1,155,912 | | - | 54,500 | 1,155,912 |
| ලැබිය යුතු වෙනත් | - | | 21,953,003 | 10,830,731 | 21,953,003 | 10,830,731 |
| පෙරගෙවුම් කාර්ය මණ්ඩල පිරිවැය | - | | 7,660,762 | 6,944,918 | 7,660,762 | 6,944,918 |
| | **323,952,011** | **277,830,221** | **960,873,143** | **510,056,500** | **1,284,825,154** | **787,886,721** |
| **9.1 ණය ගැතියන්** | | | | | | |
| ක්‍රියාකාරී ණයගැතියන් **සටහන 9.1.1)** | 250,856,444 | 194,259,611 | 193,114,241 | 216,958,905 | 443,970,685 | 411,218,516 |
| විවිධ ණය ගැතියන් | 191,028 | 191,028 | - | - | 191,028 | 191,028 |
| කාර්ය මණ්ඩල ණය සහ අ **සටහන 9.1.2)** | 49,328,436 | 53,227,787 | - | 34,616,133 | 49,328,436 | 87,843,920 |
| තැන්පතු | 2,142,225 | 2,155,717 | | 10,457,576 | 2,142,225 | 12,613,293 |
| | **302,518,133** | **249,834,143** | **193,114,241** | **262,032,613** | **495,632,374** | **511,866,756** |
| **9.1.1 ක්‍රියාකාරී ණයගැතියන්** | | | | | | |
| ව්‍යාපාරික පාසල | 59,959,529 | 34,734,531 | - | - | 59,959,529 | 34,734,531 |
| පරිගණක පාසල | 81,687,331 | 69,355,113 | - | - | 81,687,331 | 69,355,113 |
| භාෂා පාසල | 10,018,252 | 7,736,694 | - | | 10,018,252 | 7,736,694 |
| නිර්මාණ පාසල | 34,541,585 | 21,665,002 | - | | 34,541,585 | 21,665,002 |
| ඵලදායිතා සහ තත්ව කළමනාකරණ | 19,317,776 | 18,527,772 | - | | 19,317,776 | 18,527,772 |
| කුරුණෑගල | 13,521,950 | 3,952,754 | - | - | 13,521,950 | 3,952,754 |
